# පෙරදිග සංගීතය

## 9 වන ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය



පෙරදිග සංගීතය 9 වන ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරදිග සංගීතය

## 9 වන ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2010 වසරේ සිට ක්‍රියාත්මක වේ)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පෙරදිග සංගීතය
**9 වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය**
**(2009 වසරේ සිට ක්‍රියාත්මක වේ)**

**© ජාතික අධ්‍යාපන ආයතනය**

**ප්‍රථම මුද්‍රණය - 2009**

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

කනිෂ්ඨ ද්විතියික ශ්‍රේණිවල සහ ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණිවල විෂය ඉගැන්වීම සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනය කරන අතර ඔබ අතට පත්වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය විෂයය ඉගැන්වීම සම්බන්ධයෙන් ඔබ විසින් අනුගමනය කළයුතු ඉගැන්නුම් ප්‍රවේශ පිළිබඳ සතුටුදායක මගපෙන්වීමක් කරනු ඇත.

ඔබ අතට පත්වන මෙම ගුරු උපදෙස් සංග්‍රහය ශිෂ්‍ය කේන්ද්‍රීය ලෙස පන්ති කාමරයේ කටයුතු සංවිධානය කළ යුතු ආකාරය පිළිබඳ මග පෙන්වීමකි. ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශයකින් පන්ති කාමරයේ ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීම ශ්‍රී ලංකාවේ පන්ති කාමරයට එපමණ ගුරු භවතුන්හට අලුත් අත්දැකීමක් නොවේ. එසේ වුවත් මෙම නව ප්‍රවේශය මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයට අලුත් මුහුණුවරක් ගෙන දී තිබේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පාඩම් සැලසුම් කොට ශිෂ්‍ය සහභාගිත්වය ඇතිව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන යොමු කිරීම කරන අතර ඒ සඳහා අවශ්‍ය පරිසරය මැනවින් ගොඩනගයි.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ අන්තර්ගත මගපෙන්වීම පදනම් වන්නේ ගුරුවරයා දැනුම් සම්ප්‍රේෂකයකු (Knowledge Transmitter) නොව දැනුම් උත්පාදකයකු (Knowledge Transformer) විය යුතුය යන දර්ශනය මතය. එහෙයින් මෙහි අඩංගු ක්‍රියාකාරකම් මගින් ශිෂ්‍යයින් දැනුම සොයා යන, අලුත් දැනුම උත්පාදනය කරන ශාස්ත්‍රලාභියකු බවට පත් කෙරේ. අලුත් දැනුම ගවේෂණය තුළින් අනාවරණය කර ගැනීමට ශිෂ්‍යයින් යොමු කිරීම හා පෙළඹවීම ගුරු භවතුන්ගෙන් අපේක්ෂා කරන කාර්යය වෙයි.

සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවලට හිර වී නොසිට නව ඉගැන්වීම් ප්‍රවේශ ගැන සිතන්නට මතන්නට ගුරුවරුන් යොමු කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල අන්තර්ගත දර්ශනය හා ක්‍රියාකාරකම් බෙහෙවින් උදව්වනු ඇතැයි සිතමි. අපගේ ගුරුවරුන් අලුත් ප්‍රවේශ හා ඉගැන්වීම් ක්‍රම ගැන සිතන්නට යොමු විය යුතුය. නව සහස්‍රය අලුත් දැනුම උත්පාදනය වන යුගයෙකි. එමනිසා සාම්ප්‍රදායික ක්‍රම වලින් බැහැරට අලුතින් තම ක්‍රියාකාරකම් සැලසුම් කරන්නට යොමු විය යුතු ය.

මෙවැනි ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක ඇතුළත් කරන තොරතුරු වලින් අපේක්ෂා කරනුයේ ගුරුවරුන් හට තම ඉගැන්වීම් කාර්යයේදී යොදා ගත හැකි මූලික උපදෙස් සම්පාදනය කරන අතරතුර ඔවුන් වඩාත් ඉහළ නිර්මාණාත්මක ප්‍රවේශ කරා යොමු කරවීමය. එම අරමුණ ඇතිව ගුරුභවතුන් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කරනු ඇතැයි ද පන්ති කාමර කටයුතුවලදී භාවිත කරනු ඇතැයි ද බලාපොරොත්තු වෙමි. මෙවැනි පරිශ්‍රමයක් මගින් පන්ති කාමරයේ ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතුවල කාර්යක්ෂමතාව හා ගුණාත්මක බව තවදුරටත් ඉහළ නැංවීම ප්‍රධාන අපේක්ෂාව වෙයි.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනය කිරීම සඳහා සහභාගි වී දායකත්වය දැක් වූ ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයය විශේෂඥයින්ටත් බාහිර සම්පත්දායකයින්ටත් මගේ ස්තූතිය පිරි නමමි.

## සංඥාපනය

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන වියයුතු ය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද, ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා ගෙන් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසුහු පිරිසක් බිහි වූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කරගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බැවින් ඉන් ඔබ්බට ගිය, ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු වූ නිපුණතා පිරි සිසුපිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශය භාවිත කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන කොටසේ දී නව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්ති කාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම, පරිසරය නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ දන්නා දේ ඔවුන්ට කියාදීම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස්කර ගැනීම ආදී ගවේෂණාත්මක ව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකියහැකි වියයුතු ය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරදි ව සංවිධානාත්මක ව හා අංග සම්පූර්ණව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් වියයුතු ය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරන තත්ත්වයක් වියයුතු ය. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය, සිසුන්ට බෙහෙවින් ආකර්ශනීය වනු ඇත.

මේ සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ ක්‍රියාකාරකම් හා තවත් බොහෝ ක්‍රියාකාරකම් සකස් කරගැනීමට මඟ පෙන්වීමක් බව සිතන්න. මේවා ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස නව ක්‍රියාකාරකම් සකස් කරගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

නව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විට ම සිසුන් ක්‍රියාකාරී ය. එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තව ද, ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිට ම එම දුෂ්කරතා ඉවත්කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදවු කිරීමට යොමු කරවන්න. මෙසේ පාඩමත් සමඟ කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් ඵලදායී ඉගෙනුමකට හේතු වේ.

මෙමගින් නව ලොවට උචිත නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම එයට ම ගැළපෙන ගුරු භූමිකාවක් හා පන්තිකාමරයේ නව ඉගෙනුම් සංස්කෘතියක් බිහිවීම අපේක්ෂා කරමි.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය.

සැමට අධ්‍යාපනය ලබා දීමේ පරමාර්ථය පෙරදැරි ව රජය, දිවයිනේ සියලු ම පාසල් දරුවන්ට පාසල් පෙළපොත් ලබා දීමට කටයුතු කරයි. ඊට සමගාමී ව ගුරු භවතුන් වෙත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයෙන් අපේක්ෂා කරනුයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනයයි.

පන්ති කාමරය තුළ සහ ඉන් ඔබ්බට විහිදී ගිය දැනුම ගවේෂණ ක්‍රියාවලියෙහි ලා ශිෂ්‍යයාට මඟ පාදන්නේ ගුරුවරයා ය. එමෙන් ම විෂය නිර්දේශයට අනුකූල නිපුණතා මට්ටම් කරා සිසුන් කැඳවාගෙන යන නියමුවා වන්නේ ද ගුරුවරයා වන ඔබයි. එකී කර්තව්‍යය උදෙසා ඔබට අත්වැලක් සම්පාදනය, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක කාර්යභාරය වෙයි. එය මනා ව ග්‍රහණය කරගෙන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙන් ලබා ගන්නා පරිචය ඇසුරෙන්, නිපුණතා පාදක අධ්‍යාපනයේ නියැළී සිටින ශිෂ්‍ය ප්‍රජාව වෙත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩා ඵලදායී ලෙස සම්ප්‍රේෂණය කිරීමේ වගකීම ඔබට පැවරෙයි. එම වගකීමට සංවේදී වන ඔබ අගනා සම්පතක් වනු නොඅනුමාන ය.

දැනුම, ආකල්ප, කුසලතා සහ නිපුණතා මෙන් ම ප්‍රබල සමාජ හැකියා සහ අන්තර්පුද්ගල හැකියාවන්ගෙන් පරිපූර්ණ මිනිසුන් පිරිසක් සමාජයට දායාද කිරීමේ භාරදූර මෙහෙවරක නියැළී සිටින ඔබගේ දායකත්වයෙන් වර්තමාන ලෝකයේ අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි දරු පරපුරක් නිර්මාණය වෙතැයි යන්න මාගේ අපේක්ෂාවයි. එකී අපේක්ෂාව මල්ඵල ගැන්වීමට ඔබ සතු ශක්‍යතාව මෙමඟින් වඩාත් උද්දීපනය වෙතැයි මම තරයේ විශ්වාස කරමි.

| | | | |
|---|---|---|---|
| **උපදේශනය** : | මහාචාර්ය ලාල් පෙරේරා | - | අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| | විමල් සියඹලාගොඩ මහතා | - | සහකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **අධීක්ෂණය** : | සුදත් සමරසිංහ මහතා | - | අධ්‍යක්ෂ (සෞන්දර්ය)<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **විෂය සම්බන්ධීකරණය**: | ජානකී පතිරණගේ මහත්මිය | - | ව්‍යාපෘති කණ්ඩායම් නායක<br>(සංගීත)<br>ව්‍යාපෘති නිලධාරී<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**විෂයමාලා කමිටුව** :

**අභ්‍යන්තර**

| | | |
|---|---|---|
| සුදත් සමරසිංහ මහතා | - | අධ්‍යක්ෂ (සෞන්දර්ය)<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| ජානකී පතිරණගේ මහත්මිය | - | ව්‍යාපෘති නිලධාරී<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**බාහිර**

| | | |
|---|---|---|
| මහාචාර්ය අමරා රණතුංග මහත්මිය | - | සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය. |
| ගුණපාල විතානගේ මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>රත්නපුර. |
| ශාන්තා රමණී ඩයස් මහත්මිය | - | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>ගම්පහ. |
| කේ. කේ. එස්. ජයවික්‍රම මහත්මිය | - | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>පිළියන්දල. |
| ආර්. ඩී. පෙරේරා මහතා | - | ගුරු සේවය-පුෂ්පදාන බාලිකා විද්‍යාලය<br>මහනුවර. |
| ඊ. ඒ. ප්‍රේමසිරි මහතා | - | ගුරු සේවය-තක්ෂිලා මධ්‍ය මහා<br>විද්‍යාලය, හොරණ. |
| ජී. රංජිත් ප්‍රියන්ත සිල්වා මහතා | - | ගුරු සේවය-ජනාධිපති විද්‍යාලය<br>මිනුවන්ගොඩ. |

| | | |
|---|---|---|
| **පිටකවර නිර්මාණය**<br>**හා සිතුවම්** | - | රවීන්ද්‍ර තේනුවර මයා<br>සහකාර ව්‍යාපෘති නිලධාරී -<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | - | ඥානසිරි ගමගේ මහතා- ව්‍යාපෘති නිලධාරි<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **පරිගණක සැකසුම** | - | ආර්. ආර්. කේ. පතිරණ මිය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **වෙබ් අඩවිය** | - | www.nie.lk |
| **විවිධ සහාය** | - | ලක්ෂ්මි පෙරේරා, මාලනී වික්‍රමනායක<br>අයි. පී. නවරත්න, ඩී. ජේ. පණ්ඩිතරත්න |

# පටුන

පිටුව

**1.0 විෂය නිර්දේශය**

හැඳින්වීම 1

විෂය නිර්දේශය පාසල් වාර අනුව බෙදා දැක්වීම 2

විෂය නිර්දේශය 3

ක්‍රියාකාරකම් සන්තතිය 6-146

**තක්සේරුව හා ඇගයීම** 147

හැඳින්වීම 148-149

ඇගයීම් උපකරණ 150-157

# හැඳින්වීම

2010 වර්ෂයේ සිට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රියාත්මක වන නිපුණතා පාදක විෂය මාලාවට අනුකූලව 9 වන ශ්‍රේණියේ දී මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක වේ.

මෙතෙක් ක්‍රියාත්මක වූ අරමුණු පාදක විෂය නිර්දේශ වෙනුවට නිපුණතා පාදක නව විෂය නිර්දේශයක් හඳුන්වා දීමෙන් ගුරුවරයාගේ සම්ප්‍රේෂණ භූමිකාව පරිණාමන භූමිකාවකට පරිවර්තනය වේ.

මෙහි දී ගුරුවරයාගේ මග පෙන්වීම යටතේ ශිෂ්‍යයා විෂය කරුණු ගවේෂණයට යොමු කොට ක්‍රියාකාරකම් මගින් ලබන ඉගෙනුම ජීවිත පුරුද්දක් බවට පත්වනු ඇත. එය නිපුණතාවක් ලෙස හැඳින්වේ.

රසාස්වාදය, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ප්‍රායෝගික සිද්ධාන්ත හා සංස්කෘතික පසුබිම වශයෙන් විෂය ක්ෂේත්‍ර 5 ක් මීට පෙර ක්‍රියාත්මක වූ විෂය නිර්දේශයෙහි වෙන් වෙන්ව දක්වා තිබුණ ද ඒවා නිපුණතා පාදක ක්‍රියාකාරකම් ලෙස ප්‍රායෝගික ස්වරූපයෙන් ඉගෙනුමට යොමු කිරීම නව විෂය නිර්දේශය මගින් සිදුවේ.

දැනුම කුසලතා වලින් යුතු පුද්ගලයන් පමණක් නොව, මානව හිතවාදී, නිර්මාණාත්මක චින්තනයෙන් හෙබි, සංවේදී රසිකත්වයක් ඇති පුරවැසියකු බිහි කිරීම ද පාසල් විෂය මාලාවෙන් ඉටුවිය යුතු ය. ඒ සඳහා දායක වන සෞන්දර්ය විෂයයට වැදගත් ස්ථානයක් හිමි වේ.

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ සංගීත විෂයය ඉගෙනුමෙන් ශිෂ්‍යයාට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසුකාලීනව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවනු ඇත. මෙහි දී පෙරදිග සංගීතය විෂයයක් ලෙස හැදෑරීමෙන් ශිෂ්‍යයා තුළ වර්ධනය විය යුතු ප්‍රධාන නිපුණතා 8 ක් හඳුන්වා දී ඇත. එම නිපුණතාවන්ට අනුව එක් එක් ශ්‍රේණියේ දී ළඟාවිය යුතු යැයි අපේක්ෂිත නිපුණතා මට්ටම් පෙළ ගස්වා ඇත.

නිර්දේශිත විෂය කරුණු ගායනය මූලික කොට ගොඩනඟා ඇති වුවද කිසියම් ශිෂ්‍යයකු වාදනය මූලික කොටගෙන මෙම විෂයයන් හදාරන්නට අපේක්ෂා කරන්නේ නම් නිර්දේශිත ස්වර වාද්‍ය භාණ්ඩයක් මගින් සියළුම කොටස් ප්‍රායෝගික ව අධ්‍යයනය කළ හැකි ය.

විෂය නිර්දේශය පාසල් වාර අනුව බෙදා දැක්වීම

| නිපුණතාවය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද | වාරය |
|---|---|---|---|
| 1.0 | 1.1 | 18 | |
| | 1.2 | 03 | 1 වාරය |
| | 1.3 | 10 | |
| 2.0 | 2.1 | 10 | |
| 3.0 | 3.1 | 03 | |
| | 3.2 | 06 | |
| | 3.3 | 04 | 2 වාරය |
| 4.0 | 4.1 | 09 | |
| | 4.2 | 05 | |
| 5.0 | 5.1 | 06 | |
| | 5.2 | 08 | |
| 6.0 | 6.1 | 06 | 3 වාරය |
| 7.0 | 7.1 | 06 | |
| 8.0 | 8.1 | 03 | |

**ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා ගුරු භවතුන්ට උපදෙස්**

- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියාකාරකම් කාලච්ඡේද කිහිපයකට සකසා ඇති අතර ඔබට අභිමත පරිදි කාලච්ඡේදයට අදාළ කොටස සීමා කර ගත හැකි ය.
- ක්‍රියාකාරකම ක්‍රියාත්මක කළයුතු ආකාරය පියවර වශයෙන් සඳහන් කර ඇති පරිදි සංවිධානය කර ගන්න.
- පන්ති කාමරයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානයේ දී එහි සිසුන් සංඛ්‍යාවට අනුපාතිකව කුඩා කණ්ඩායම් වශයෙන් සැලසුම් කර ගන්න.
- ක්‍රියාකාරකම්වල යෝජනා කර ඇති ක්‍රමවේදයට අමතර ව ගුණාත්මක සංවර්ධනය සඳහා ගැලපෙන, සුදුසු වෙනත් ක්‍රමවේදයක් භාවිතා කිරීමේ නිදහස ගුරුවරයා සතු වේ.
- ගුරුවරයා විසින් ඉගෙනුම්- ඉගැන්වීම් සම්පත්, ගුණාත්මක යෙදවුම් හා වෙනත් උපකරණ ආදිය ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර සූදානම් කර ගත යුතු ය.
- ගවේෂණ කාර්ය උපදෙස් පත්‍රිකා වෙන් වෙන් වශයෙන් සිසුන්ට හෝ කණ්ඩායම්වලට ලබා දිය නොහැකි අවස්ථාවලදී පත්‍රිකාව ප්‍රදර්ශනයට සැලැස්වීම වැනි සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරන්න.
- ක්‍රියාකාරකමක් අවසානයේ දී ඇති තක්සේරු හා ඇගයීම් නිර්ණායක භාවිතයෙන් හෝ එම නිර්ණායක ඇසුරෙන් විෂය බද්ධ නිර්ණායක ගොඩනගා සුදුසු පරිදි ලකුණක් ප්‍රදානය කිරීමට සහ ඉහළ කළමනාකරණයේ අවශ්‍යතාවලදි ලකුණු පරිවර්තනය කර ඉදිරිපත් කිරීමකට කටයුතු කරන්න.

## පෙරදිග සංගීතය - 9 ශ්‍රේණිය

## 1.5 නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය හා කාලච්ඡේද

| නිපුණතා | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී. | • භීම්පලාසි සහ යමන් රාග විස්තර<br>• එම රාගවල ස්වර අභ්‍යාස<br>• එම රාගවල සර්ගම්<br>• එම රාගවල මධ්‍යලය ගීත<br>• භීම්පලාසි සහ යමන් රාගවලට අයත් රාගංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය | 18 |
| | 1.2 මිශ්‍ර මත්කැටි ඇති තාලපද අධ්‍යයනය කරයි. | • මාත්‍රා දෙක සහ තුන මිශ්‍ර වූ හින්දුස්ථානි, සහ දේශීය තාලපද<br>• මාත්‍රා තුනේ සහ හතරේ මිශ්‍ර වූ හින්දුස්ථානි , සහ දේශීය තාලපද<br>• 5/8 & 7/8 Rhythm | 03 |
| | 1.3 රාගභාවය සහ එකිනෙක වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි. | • වාදි, සංවාදි, අනුවාදි, විවාදි, වර්ජිත ස්වර<br>• ආරෝහණ,අවරෝහණ<br>• මුඛ්‍යාංග<br>• ඉහත රාග වලට අයත් ලක්ෂණ ගී ගායනය කරයි, විමසයි. | 10 |
| 2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කරගනිමින් වාදනය කරයි. | • මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් බිලාවල්, කාෆි, ආරෝහණ අවරෝහණ (ස්වර පුවරුවෙන් වාදනය සමඟ)<br>• එම ස්වර ශ්‍රැති කරගනිමින් ගීත වාදනය සහ ප්‍රස්තාරකරණය | 10 |
| | 2.2 විවිධ සංගීත භාණ්ඩ වෙන් කොට හඳුනා ගනියි. | • සංගීත භාණ්ඩ වර්ගීකරණය කරයි. | |

| නිපුණතා | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 0.3 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ළඟාකර ගැනීමට හුරුවෙයි. | 3.1 ජන සංගීත ආශ්‍රයෙන් නිර්මාණය කළ ගීත විමසයි.<br>3.2 භාරතීය ගායන ශෛලීන් අගය කරයි.<br>3.3 දේශාභිමානී ගීත අගය කරයි. | • ජන ගී තනු ආශ්‍රිත සරල ගී (ඉන් එකක් ගායනය)<br>• භජන්, ගසල්, කව්වාලි ශෛලීන් ආකෘතිය විශේෂතා සහ ඒවායේ ස්වභාවය<br>• භජන්, ගසල්, කව්වාලි ගීත ගායනය<br>• දේශාභිමානි ගීත ගායනය | 03<br>06<br>03 |
| 0.4 දේශීය ජනසංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි. | 4.1 කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.<br>4.2 දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩවල විශේෂතා සාකච්ඡා කරමින් අගය කරයි. | • ගොයම් ගී, නෙලුම් ගී කමත් ගී<br>• ගැමි ගීයේ විශේෂ ලක්ෂණ<br>• දවුල, ගැටබෙරය, තම්මැට්ටම, පහතරට බෙරය<br>• රිද්ම රටා වාදනය | 08<br>05 |
| 05. ව්‍යවහාරික සංගීතය සහ රංගකලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 5.1 නව නාට්‍ය සම්ප්‍රදාය සහ සංගීතයේ ස්වභාවය විමසමින් ගායනය කරයි.<br>5.2 ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිත වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි. | • නව නාට්‍ය ශෛලියේ ස්වභාවය සහ සංගීතය<br>• හුණුවටය/ කුවේණී/ කරදිය/බෙරහඬ/රතුහැට්ටකාරි නාට්‍යවලින් ඕනෑම ගීත දෙකක් ගායනය<br>• දෙපානෝ/ පේමතෝ ජායතී සෝකෝ / කුණ්ඩලකේශී ගීත නාට්‍යවලින් ගීත.<br>• ගිටාරය සහ එහි වර්ග, ස්වර පිහිටන අයුරු (C.F.G Major, Minor Scales & Chords)<br>• එකෝඩියන් සහ එහි ස්වර පිහිටන අයුරු<br>• විදුලි ඕගනය සහ විද්‍යුත් අවනද්ධ භාණ්ඩ<br>• ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය | 12<br>02 |

| නිපුණතා | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | |
|---|---|---|---|
| 06 සංගීත නිර්මාණ කාර්යයේ අතහදා බැලීම් කරයි. | 6.1 කටහඬෙහි විවිධ හඬතල භාවිත කරමින් තනු නිර්මාණය කරයි. | • කටහඬෙහි විවිධ තල<br>• විවිධ හඬතල සම්බන්ධ කරගනිමින් නිර්මාණ<br>• හාර්මනි (Harmony) සිද්ධාන්තය | 06 |
| 07.සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි. | 7.1 බටහිර සංගීත සංකල්ප හඳුනාගනිමින් භාවිත කරයි. | • Sharps, Flats,<br>• Natural Marks<br>• Clef,Rest marks<br>• Tie<br>• Time Signature<br>• Key Signatures<br>• F.G.C.B flat Scales( Major & Minor) | 06 |
| 08. සංගීතයේ තාක්ෂණික මෙවළම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 8.1 සංගීත ප්‍රසංගයක අත්‍යාවශ්‍ය තාක්ෂණික මෙවළම් හසුරුවන ආකාරය පිළිබඳ සොයා බලයි. | • මයික්‍රෆෝනය<br>• ඇම්ප්ලිෆයරය<br>• බෆල්, මික්සර් | 03 |

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

**නිපුණතා මට්ටම 1.1** : **ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කරගනී.**

**ක්‍රියාකාරකම 1.1.1** : **'භීම්පලාසි රාගයෙන් ස්වර අභ්‍යාස ගයමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය උපකරණ
- කාර්ය පත්‍රිකා අංක 02 හි ඡායා පිටපත්
- කාර්ය පත්‍රිකා අංක 03 හි ඡායා පිටපත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** -

**පියවර 1.1.1.1** -
- ඇමුණුම අංක 01 හි දැක්වෙන තෝරාගත් ගීතය ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතයෙහි නාදමාලාව පිළිබඳව විමසන්න.
- පහත සඳහන් කරුණු මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • ග, නි ස්වර කෝමලව යෙදෙන ගීතයක් බව<br>• භිම්පලාසි රාගය ආශ්‍රිතව නිර්මාණය වී ඇති සරල ගීතයක් බව<br>• එම ගීතයෙහි භීම්පලාසි රාගයේ ස්වර සංගති යෙදී ඇති බව |

(මිනිත්තු 20 )

**පියවර 1.1.1.2** -
- ඇමුණුම අංක 02 ඇතුළත් ගීත ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න.
- රාගාංග මතුකරවමින්, ආරෝහණ අවරෝහණ ස්වර රටාව විදහා දක්වමින් ගීතය ගායනය කරන්න.
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- කණ්ඩායම්වලට සහායවන්න.

(මිනිත්තු 50)

**පියවර 1.1.1.3** -
- ඇමුණුම අංක 03 හි ඇතුළත් කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට බෙදන්න.
- සිසුන් ක්‍රියාකාරකම්හි යොදවන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරන්න.

| |
|---|
| • භීම්පලාසි රාගයේ, ස්වර සංගති රැසක් ඇතුළත්වන බව.<br>• රාගයක් වර්ධනය කර ගැනීමට රාගාංග පිළිබඳ අවබෝධය වැදගත් වන බව.<br>• ස්වර අභ්‍යාස ගොඩ නැගීමේ කුසලතාව ලැබෙන බව. රාගඥාණය, ස්වරඥාණය වර්ධනය කර ගැනීමට ස්වර අභ්‍යාස පුහුණුව ඉතා වැදගත් වන බව |

(මිනිත්තු 50)

**තත්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- හීම්පලාසි රාගයේ ස්වර සංගති පැහැදිලි කරයි.
- රාග වර්ධනය කිරීම සඳහා එහි ඇති වැදගත්කම පිළිගනියි.
- හීම්පලාසි රාගයෙන් ස්වර අභ්‍යාස ගායනය/වාදනය කරයි.
- රාගශ්‍රිත වෙනත් නිර්මාණ සොයයි.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව**

- හීම්පලාසි රාගශ්‍රිත සරල ගීත කිහිපයක්
    - යමුනා ගං තෙර තමලු ලතා සෙවනේ
    - සිගිරියේ සිතුවම් රමණී
    - සැඳෑ අඳුර ලොව ගලන වේලාවට
    - මගේ නීල නෙතු සඟලින්
- මීට අමතරව , හීම්පලාසි රාගාංග ඍජුවම යොදාගෙන නිර්මාණය කර ඇති සරල ගීත ප්‍රවේශය සඳහා තෝරා ගත හැකි ය.

ඇමුණුම 02

**කාර්ය පත්‍රිකාව**


- සඳහාසෙන් රැස් දහරේ - නමැති ගීතය ගුරුවරයාගේ සහාය ඇතිව රසවත්ව ගායනා කරන්න.
- එම ගීතයේ ස්වර ප්‍රස්තාරය අවධානයෙන් යුතුව නිරීක්ෂණය කරන්න.
- එහි යෙදෙන විකෘති ස්වර නම් කරන්න.
- ආරෝහණයේ සහ අවරෝහණයේ ස්වර මාත්‍රා යෙදෙන අයුරු නිරීක්ෂණය කරන්න.
- ගීත ප්‍රස්තාරයෙහි යෙදෙන රාග අංග ඇතුළත් කෙටි ස්වර සංගති කිහිපයක් ලියන්න.
- එම ස්වර සංගති වාදන සහාය ඇතිව කිහිප වරක් ගායනය කරන්න.
- නාද ස්ථාන තහවුරු වන සේ පුහුණුවීම් කරන්න.


**ගුරුවරයාට**

- නි ස
- නි ස ග ම ප
- ග ම ග රි ස
- නි ස
- ප ප ම ප ම
- ග ම ප නි
- ග ම ප නි ස්
- පනි ස ග රි නි ස
- ස් නි ධ ප -
- ස ග ම ප -
- ගම ගරි නි ස
- ග ම ප -


ඇමුණුම 04

## භීම්පලාසි රාගාංග ඇතුළත් ගීතයක්





- ඉහත සඳහන් ගීත ප්‍රස්තාරය ගායනා කරන්න.
- එහි ස්වර කිසියම් රටාවකට අනුව ගොඩ නගමින් තාලයකට අනුව නිර්මාණය කර ඇති බව පෙනෙනවා ඇති.
- ඒ අනුව එහි සඳහන් වන ස්වර අභ්‍යාසයක් ගොඩ නගන්න.
- එම ස්වර අභ්‍යාසය ශ්‍රැතිය භාවිත කරමින්  ගායනයට පුහුණු වන්න.
- පහත සඳහන් ස්වර අභ්‍යාස, හිස් තැනට සුදුසු ස්වර යොදමින් සම්පූර්ණ කරන්න.



- භීම්පලාසි රාගයේ ආරෝහණ සහ අවරෝහණ ස්වර ලියා දක්වන්න.
- ස්වර අභ්‍යාසයන් ගායනය /වාදනය හොඳින් පුහුණුවී පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

**නිපුණතා මට්ටම 1.1** : **ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කරගනී.**

**ක්‍රියාකාරකම 1.1.2** : **'යමන් රාගයෙන් රාගංග සොයමින් ස්වර අභ්‍යාස ගයමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01හි දැක්වෙන ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය
- කාර්ය පත්‍රිකා අංක 02 හි දැක්වෙන ගීතය
- කාර්ය පත්‍රිකා අංක 03 හි දැක්වෙන කාර්ය පත්‍රිකාවේ පිටපත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 1.1.2.1 -**
- ඇමුණුම අංක 01 හි දැක්වෙන තෝරාගත් සරල ගීයක් ශ්‍රවණයට සලස්වන්න.
- සිසුන් සමග එම ගීතය ගායනා කරන්න
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන සිසුන්ට අවස්ථාව දෙන්න
- පහත සඳහන් කරුණු මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • යමන් රාගය ආශ්‍රිතව නිර්මාණය වූ ගීතයක් බව<br>• තීව්‍ර මධ්‍යමය යෙදෙන බව<br>• කරුණ රස ඉස්මතුවන ගීතයක් බව<br>• භක්තිය දනවන ගීත සඳහා ද යමන් රාගය ඇසුරු කරගත හැකි බව |

(මිනිත්තු 20 යි)

**පියවර 1.1.2.2 -**
- ඇමුණුම අංක 02 ඇතුළත් ගීතය ප්‍රදර්ශනය කරන්න.
- රාග සංගති පිළිබඳව අවධාරණය කරමින් ගීතය කිහිප වරක් සිසුන් සමග ගායනය කරන්න.
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න
- කාර්ය පත්‍රිකාව බෙදා දෙන්න
- කණ්ඩායම්වලට සහායවන්න
- ක්‍රියාකාරකම්හි යොදවන්න
- ස්වයං අධ්‍යයනයට මඟ පෙන්වන්න

(මිනිත්තු 40 යි)

**පියවර 1.1.2.3 -**
- කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න
- සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.
- අන් අයගේ අදහස් විමසන්න.
- නිවැරදි ශ්‍රැතියට අනුව ස්වර අභ්‍යාස ඉදිරිපත් කිරීමට මඟ පෙන්වන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- යමන් රාගාංග ඇතුළත් ගීතයක් බව
- යමන් රාගය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට රාග සංගති පිළිබඳ දැනුවත් වීම අවශ්‍ය බව
- රාග වර්ධනය කිරීම සඳහා රාග සංගති පිළිබඳ දැනීම ඉවහල් වන බව
- ස්වර අභ්‍යාස නිර්මාණය කරගැනීමේ කුසලතාව ලැබෙන බව

(මිනිත්තු 60)

**තත්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- යමන් රාගයේ ස්වර සංගති පැහැදිලි කරයි.
- රාග වර්ධනය කිරීම සඳහා ස්වරසංගති හඳුනා ගැනීමෙහි වැදගත්කම පිළිගනියි.
- යමන් රාගයෙන් ස්වර අභ්‍යාස ගායනා කරයි.
- යමන් රාගාශ්‍රිත සරල ගීත ගායනයේ යෙදෙයි.
- රාගශ්‍රිත ගීත නිර්මාණ කිරීමෙහි


ඇමුණුම 01

- යමන් රාගා ශ්‍රිත සරල ගීත කිහිපයක්
  - ස්වර්ණ ප්‍රදීපාය මාන (ස්වර්ණලතා කවීශ්වර)
  - සැන්දෑ අහසේ (දයාරත්න රණතුංග)
  - සාදු දන්ත දා වඳිම් සාර ශාන්ති (සුජාතා අත්තනායක)

ඇමුණුම 02

**කාර්ය පත්‍රිකාව**

**යමන් රාගය ජප්තාලය**



ඇමුණුම 03

**කාර්ය පත්‍රිකාව**

- රමණීය සිරි සාර ... නමැති ගීත ස්වර ප්‍රස්තාරයෙහි දැක්වෙන යමන් රාගයට අදාළ ස්වර සංගති සොයන්න.
- එම ස්වර සංගති ගායනයට පුහුණුවන්න.
- රි ස - , නී රි ග රි ස - , යන ස්වර අභ්‍යාසය උච්ච දක්වා ආරෝහණ සහ අවරෝහණ වශයෙන් වර්ධනය කර දක්වමින් ලියන්න.
- නාද මාලාව තහවුරු වන තෙක් පුහුණුවීම් කරන්න.
- පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ණී

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

**නිපුණතා මට්ටම 1.1** : **ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කරගනී.**

**ක්‍රියාකාරකම 1.1.3** : **'භීම්පලාසි රාගයේ සර්ගම් ගයමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01හි දැක්වෙන දෘශ්‍ය ආධාරකය
- කාර්ය පත්‍රිකා අංක 02 කාර්ය පත්‍රිකාවේ ඡායා පිටපත්
- සර්පිනාව, තබ්ලාව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 1.1.3.1 -**
- මීට පෙර ඉගෙනගත් භීම්පලාසි රාගයෙන් ස්වර අභ්‍යාසයක් සිසුන් සමග ගායනය කරන්න.
- ස්වෙච්ඡාවෙන් ඉදිරිපත්වන සිසුන්ට අවස්ථාවක් දෙන්න.
- පහත සඳහන් කරුණු මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • ස්වර අභ්‍යාස ගායනා කිරීමේ දී නිවැරදි ශ්‍රැතිය මත පිහිටා ගැයීම වැදගත් වන බව<br>• ආරෝහණයේ දී නොයෙදෙන ස්වර සහ විකෘති ස්වර පිළිබඳව සැලකිලිමත් විය යුතු බව<br>• ශාස්ත්‍රීය සංගීතය ප්‍රගුණ කිරීමේ දී මූලික වශයෙන් සර්ගම්, පුරුදු පුහුණු විය යුතු කොටසක් බව |

(මිනිත්තු 20 යි)

**පියවර 1.1.3.2 -**
- ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය ආධාරකය ප්‍රදර්ශනය කරන්න.
- සර්ගම්, පාදයෙන් පාදය, නාදමාලාව තහවුරු වනතෙක් ගායනය හුරු කරවන්න.
- සර්ගම් රසවත් ලෙස ඉදිරිපත් කිරීමට, සුදුසු ක්‍රමවේදයක් යොදාගන්න
- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න
- කාර්ය පත්‍රිකා බෙදා දෙන්න
- ක්‍රියාකාරකම්හි යොදවන්න

(මිනිත්තු 50 යි)

**පියවර 1.1.3.3 -**
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න
- අන් අයගේ අදහස් විමසන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- රාග ස්වරූපය මැනවින් විදහා දැක්වෙන සර්ගම් පුහුණුව ඉතා වැදගත් බව
- රාග සංගති පිළිබඳ අවබෝධය ලැබිය හැකි බව.
- ස්වර ඛණ්ඩ නම් කිරීමට පහසුවක් වන  බව
- මධ්‍යලය ගීත ගැයීමට, සර්ගම් පුහුණුව පහසුවක් වන බව

(මිනිත්තු 50)


**තත්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- රාගයට අයත් කෙටි ස්වර ඛණ්ඩ නම්  කරයි.
- රාගාවබෝධය සඳහා සර්ගම් පුහුණුව වැදගත් බව පිළිගනියි.
- සර්ගම් ගායනය/වාදනය කරයි
- කෙටි ස්වර ඛණ්ඩ නිර්මාණය කරයි
- වෙනත් නිර්මාණ සඳහා ඇත් දැකීම් පුළුල් කර ගනියි.

ඇමුණුම 01

**- භීම්පලාසි රාගය -**

**සර්ගම් - කහරවා තාලය**



ඇමුණුම 02

## කාර්ය පත්‍රිකාව

### කෙටි ස්වර ඛණ්ඩ නිර්මාණය කිරීම.

- පළමුවැනි අභ්‍යාසය සඳහා, ම ග රි ස යන කෙටි ස්වර ඛණ්ඩය යොදා ගනිමින්, ස්වර ඛණ්ඩ උච්ච ග් දක්වා හිස්තැන්වලට අදාළ ස්වර යොදමින් ලියන්න.

1. ම ග රි ස , ම ප ම ග රි ස ———— ම ග රි ස , ———— , ම ප, ම ග රි ස
ම ප නි ස් , ———— , ම ග රි ස.

- දෙවැනි ස්වර අභ්‍යාසය සඳහා නි ස, යන ස්වර ඛණ්ඩය මුලට යොදමින් කෙටි ස්වර ඛණ්ඩ වර්ධනය කරන්න.

2. නි ස, නි ස ග රි ස

- ගුරුතුමාගේ සහාය ඇතිව, කණ්ඩායම් එක් වී එම ස්වර ඛණ්ඩ ගායනයට/ වාදනයට පුහුණුවන්න. මතකයෙන් ගැයීමට ද පුහුණු වන්න.

ගුරුවරයාට -

ගරිස, මගරිස, පමගරිස, ධපමගරිස, නිධපමගරිස,
ස් නිධපමගරිස, ර් ස් නිධපමගරිස, ග් ර් ස් නිධපමගරිස,

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : **ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කරගනී.**

**ක්‍රියාකාරකම 1.1.4** : **'යමන් රාගයෙන් සර්ගම් සහ කෙටි ස්වර ඛණ්ඩ ගයමු/ වයමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01හි දැක්වෙන දෘශ්‍ය ආධාරකය
- කාර්ය පත්‍රිකා අංක 02 කාර්ය පත්‍රිකාවේ ඡායා පිටපත්
- සර්පිනාව, තබ්ලාව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 1.1.4.1 -**
- 'රමණීය සිරි සාර මගෙ මැණී ලංකා' ගීතය සිසුන් සමග ගායනය කරන්න.
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන සිසුන්ට අවස්ථාවක් දෙන්න.
- යමන් රාගයේ ස්වරූපය පිළිබඳව නැවත ආවර්ජනය කරන්න.
- පහත සඳහන් කරුණු මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.
  - යමන් රාග සංගති ඇතුළත් වන බව
  - යමන් රාග ස්වරූපය පිළිබඳ ව අවබෝධයක් ලැබෙන බව
  - කෙටි ස්වර ඛණ්ඩ ගොඩ නැඟීමේ හැකියාව ලැබෙන බව
  - රාගධාරී සංගීතයේ ගායන/වාදන ප්‍රවේශය සඳහා ස්වර අභ්‍යාස වැදගත් වන බව

(මිනිත්තු 20 යි)

**පියවර 1.1.3.2 -**
- ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය ආධාරකය ප්‍රදර්ශනය කරන්න.
- සර්ගම්, පාදයෙන් පාදය, නාදමාලාව තහවුරු වනතෙක් ගායනය හුරු කරවන්න.
- සර්ගම් රසවත් ලෙස ඉදිරිපත් කිරීමට, සුදුසු ක්‍රමවේදයක් යොදාගන්න
- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න
- කාර්ය පත්‍රිකා බෙදා දෙන්න
- ක්‍රියාකාරකම් හි යොදවන්න

(මිනිත්තු 50 යි)

**පියවර 1.1.4.3 -**
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න
- අන් අයගේ අදහස් විමසන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- සර්ගම් පුහුණුව තුළින්, රාග ඥාණය, තාල ඥාණය ස්වර ඥාණය වර්ධනය වන බව
- රාගවාචී කෙටි ස්වර ඛණ්ඩ ඒ තුළ ගැබ්වී ඇති බව
- කෙටි ස්වර සංගති පුහුණුවීමෙන් ගායනයට වාදනයට පහසුවක් වන බව

(මිනිත්තු 50)

**තත්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**


- යමන් රාගයේ ලක්ෂණ පැහැදිලි කරයි.
- සර්ගම් පුහුණුවෙහි වැදගත්කම පිළිගනියි.
- සර්ගම් නිවැරදිව ගායනය /වාදනය කරයි.
- කෙටි ස්වර ඛණ්ඩ නිර්මාණය කරයි
- වෙනත් නිර්මාණ සඳහා අත්දැකීම් පුළුල් කර ගනියි.

ඇමුණුම 01

- යමන් රාගය- සර්ගම් I -

| | | | | |
|---|---|---|---|---|
| ස්ථායි | නි ධ ප ම' | ග රි ස ස | ග - ග රි | ග ම' ප ධ |
| | ප ම' ග රි | ග ම' ප ම' | ග රි ස - | ධ̣ නි̣ රි ග |
| | ම' ප, ග ම' | ප ධ නි සං | ම' ප ධ නි | රිං සං නි ධ |
| | 0 | 3 | x | 2 |
| අන්තරා | ප ම' ග ප | - ප නි ධ | සං - - - | සං රිං සං - |
| | නි රිං ගං රිං | සං -, ධ නි | සං - - රිං | සං නි ධ ප |
| | ම' ප ධ නි | සං -, නි ධ | ප ම' ග රි | ග ම' ප ධ |
| | 0 | 3 | x | 2 |

### සර්ගම් II



ඇමුණුම 02

### කාර්ය පත්‍රිකාව

- සර්ගම් ප්‍රස්තාරය තුළ ගැබ්වී ඇති රාග සංගති (රාගවාචී ස්වර ඛණ්ඩ) නම් කරන්න

- නි̣ රි ස, නි̣ රි ග රි, නි̣ රි ස,

  නි̣ රි ස යන ස්වර ඛණ්ඩය අදාළ කර ගනිමින් ස්වර අභ්‍යාසයක් ගොඩ නගන්න.

උදා - i

නි̣ රි ස, නි̣ රි ග රි ස
නි̣ රි ස, - - - - - - - - ස
නි̣ රි ස, - - - - - - - - - ස
නි̣ රි ස, - - - - - - - - - - ස
නි̣ රි ස, - - - - - - - - - - - ස
නි̣ රි ස, - - - - - - - - - - - - - ස

ii

නි̣ රි ස, - ග රි ස
නි̣ රි ස, - ම' ග රි ස
නි̣ රි ස, - - - - - - - - ස
නි̣ රි ස, - - - - - - - - - - ස
නි̣ රි ස, - - - - - - - - - - - ස

නි̣ රි ස, - - - - - - - - - - - - - ස

ගුරුවරයාට -

කෙටි ස්වර බණ්ඩ නිර්මාණය

නි̣ ධ̣ නි̣ රි සංගතිය යොදා ගනිමින්

(1) නි̣ ධ̣ නි̣ රි ස | නි̣ ධ̣ නි̣ රි ගරිස | නි̣ ධ̣ නි̣ රි ගම' ගරි ස |
නි̣ ධ̣ නි̣ රි ගම' පම' ගරිස | නි̣ ධ̣ නි̣ රි ගම' පධ පම' ගරිස |
නි̣ ධ̣ නි̣ රි ගම' පධ නිධ පම' ගරිස | නි̣රිගම'පධනිස̇ නිධ පම' ගරිස |

ග රි ස . කෙටි ස්වර බන්ධය යොදා ගනිමින්

(2) ගරිස, ම' ගරිස, පම' ගරිස, ධපම' ගරිස, නිධපම' ගරිස
ස̇නි ධපම' ගරිස, රි̇ස̇ නිධපම' ගරිස, ග̇රි̇ස̇ නිධපම' ගරිස

ගමක් ස්වර යොදා ගනිමින්

(3) නි̣රි ගරිස, නි̣රි ගම'ම' ගරිස, නි̣රි ගම'පප'ගරිස, නි̣රි ගම'පධධපම' ගරිස
නි̣රි ගම'පධ නිනි ධපම ගරිස, නි̣රි ගම'පධනි ස̇ස̇ නිධපම' ගරිස

(4) රි ගරිස, නි̣රි ගම'ප රි ගරිස, නි̣රි ගම'පධප රි ගරිස
නි̣රි ගම'පධ නිධප රි ගරිස, නි̣රි ගම'පධනිස̇ නිධප රි ගරිස

(5) ම' ධ ප , ම' ධ නි ධප, ම'ධනිස̇ නිධප, ම'ධනිස̇ රි̇ස̇ නිධප
ම' ධ නි ස̇ රි̇ ග̇ රි̇ ස̇ නිධප, ම'ධනිස̇ රි̇ග̇ම̇' ග̇රි̇ස̇ නිධප

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : **ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කරගනී.**

**ක්‍රියාකාරකම 1.1.5** : **' හීම්පලාසි රාගයෙන් මධ්‍යලය ගීත ගයමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 1.1.5.1 දෘශ්‍ය ආධාරකය
- කාර්ය පත්‍රිකා පිටපත්
- සර්පිනාව, තබ්ලාව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 1.1.5.1 -**
- 'හීම්පලාසි රාග ස්වරූපය හඳුන්වාදීමට,' " සීගිරියේ සිතුවම් රමණී.. " යමුනා ගංතෙර තමලු ලතා සෙවනේ " යන සරල ගීතවලින් 1 ක් සිසුන් සමඟ ගායනා කරන්න.
- ස්වෙච්ඡාවෙන් ඉදිරිපත්වන සිසුන්ට අවස්ථාවක් දෙන්න.
- පහත සඳහන් කරුණු මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - හීම්පලාසි රාගයේ ඡායාව ඇතුළත් වන සරල ගීතයක් බව
> - හීම්පලසි රාගංග සෘජුවම ඇතුළත් වන මධ්‍යලය ගීත ශෛලිය ඉගෙනීමට එම ගීත රසවින්දනය වැදගත් වන බව
> - සරල ගීත නිර්මාණය කිරීම සඳහා රාග ස්වරූපය පිළිබඳ අවබෝධය අත්‍යවශ්‍ය වන බව

(මිනිත්තු 20 යි)

**පියවර 1.1.5.2 -**
- ඇමුණුම අංක 1.1.5.1 දැක්වෙන ගීත අතරින් තෝරාගත් ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- තෝරාගත් මධ්‍යලය ගීතය රසවත්ව ගයා වයා සිසුන්ට ශ්‍රවණයට සලස්වන්න.
- ගීතයේ පාදයෙන් පාදය ගායනයට යොමු කරවමින් නාදමාලාව තහවුරු කරවන්න.
- ස්ථායි අන්තරා කොටස් වෙන් වෙන් වශයෙන් නාදමාලාව තහවුරු කරවන්න.
- සමස්ත ගීතය කණ්ඩායම් වශයෙන් ඒකල වශයෙන් නාදමාලාව පුහුණු කරවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 1.1.5.3 -**
- කණ්ඩායම් වශයෙන් හීම්පලාසි මධ්‍යලය ගීතය ඉදිරිපත් කරවන්න.
- සදොස් තැන් ඇත්නම් නිදොස් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- මධ්‍යලය ගීත පුහුණුව තුළින් රාග ස්වරූපය පිළිබඳ මනා වැටහීමක් ලැබෙන බව
- රාගඥාණය, ස්වරඥාණය, වර්ධනය වන බව
- රාගයන්හි අනන්‍යතාවය හඳුනාගත හැකි බව
- තාලාවබෝධය ලැබෙන බව

හීම්පලාසි රාගයේ මධ්‍යලය ගීත සඳහා පහත සඳහන් ගීත ඇසුරින් අභිමත ගීතයක් තෝරාගත හැකි ය.

1. ජා ජාරේ අපනේ මන්දිරවා
2. හෝ හෝ ගා ගලනා සුන්දර වූ
3. ගෝරේ මුඛසෝ මොරේ මන භාවෙ
4. නව සඳ පෙනේ නැගී එනවා


(මිනිත්තු 50)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- හීම්පලාසි රාගයේ ස්වරූපය පැහැදිලි කරයි.
- රාග ස්වරූපය වටහාගැනීමට මධ්‍යලය ගීත වැදගත් වන බව පිළිගනියි.
- හීම්පලාසි රාගයේ මධ්‍යලය ගීතය ගායනය /වාදනය කරයි.
- සරල ගීත නිර්මාණය සඳහා හීම්පලාසි රාග ස්වරූපය යොදා ගනියි.
- වෙනත් රාගාශ්‍රිත සරළ ගීතවල ඇතුළත් වන රාගාංග සොයයි.


ඇමුණුම 1.1.5.1

**රාගය - හීම්පලාසි - මධ්‍යලය - ත්‍රිතාල්**




## භීම්පලාසි රාගය - මධ්‍යලය ගීතය - 1

තාලය - ත්‍රිතාල්



## භීම්පලාසි රාගය - මධ්‍යලය ගීතය - 2



**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : **ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කරගනී.**

**ක්‍රියාකාරකම 1.1.6** : **'යමන් රාගයේ මධ්‍යලය ගීතයක් ගයමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01 හි දැක්වෙන ගීත ස්වර ප්‍රස්තාරය ලියන ලද දෘශ්‍ය ආධාරකය
- කාර්ය පත්‍රිකා පිටපත්
- සර්පිනාව, තබ්ලාව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** -

**පියවර 1.1.6.1** -
- යමන් රාගයේ ස්වරූපය දැක්වෙන පහත සඳහන් සරල ගී වලින් " එකක් සිසුන් සමග ගායනා කරන්න.
  - සාදු දන්ත දා.... සැන්දෑඅහසේ, ස්වර්ණ ප්‍රදීපාය මාන
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන්ට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - යමන් රාගයේ ඡායාව ඇතුළත්, සරල ගීතයක් බව.
  - එම සරල ගීත රස වින්දනය තුළින් රාගයට අදාළ මධ්‍යලය ගීත ගායනයට/වාදනයට ඉමහත් රුකුලක් වන බව
  - කරුණ රස ඉස්මතු කෙරෙන ගීත නිර්මාණය සඳහා යමන් රාගය වැඩි වශයෙන් යොදාගෙන ඇති බව

(මිනිත්තු 20 යි)

**පියවර 1.1.6.2** -
- ඇමුණුම අංක 01 හි දැක්වෙන ගීත අතරින් එක් ගීතයක් පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම මධ්‍යලය ගීතය රසවත්ව ගයා වයා සිසුන්ට ශ්‍රවණයට සලස්වන්න.
- ගීතයේ පාදයෙන් පාදය ගායනයට යොමු කරවමින් නාදමාලාව පුහුණු කරවන්න.
- ස්ථායි අන්තරා කොටස් වෙන් වෙන් වශයෙන් නාදමාලාව තහවුරු කරවන්න.
- සමස්ත ගීතය කණ්ඩායම් වශයෙන් ඒකල වශයෙන් නාදමාලාව පුහුණු කරවන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 1.1.5.3 -**

- කණ්ඩායම් වශයෙන් මධ්‍යලය ගීතය ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- නාද මාලාවේ වැරදි තැන් ඇතොත් නිවැරදි කරන්න.
- අහඹු ලෙස ඉදිරිපත් කරන ගී පද, ස්වර ඛණ්ඩ, පද මාලාවට අදාළ ස්වර ඛණ්ඩ, ඉදිරිපත් කරමින් කණ්ඩායම විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - මධ්‍යලය ගීත පුහුණුව තුළින් රාග භාවය පිළිබඳ මනා වැටහීමක් ලැබෙන බව
> - රාග ඥාණය, ස්වර ඥාණය වර්ධනයට එම ගීත පුහුණුව වැදගත් වන බව


(මිනිත්තු 40)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- යමන් රාගයේ ස්වරූපය පැහැදිලි කරයි.
- රාග ස්වරූපය පිළිබඳ අවබෝධය ලැබීමට මධ්‍යලය ගීත ඉවහල් වන බව පිළිගනියි.
- යමන් රාගයේ මධ්‍යලය ගීතය නිවැරදිව ගායනය /වාදනය කරයි.
- යමන් රාගය ආශ්‍රිතව සරල ගීත නිර්මාණය කරයි.
- යමන් රාගාශ්‍රිත වෙනත් සරල ගීත සොයයි.

ඇමුණුම 01

යමන් - රාගය - මධ්‍යලය ගීත



**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** : **මිශ්‍ර මත් කැටි ඇති තාලපද අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 1.2.1** : **'මිශ්‍ර මත් කැටි සහිත තාලපද හඳුනා ගනිමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- තබ්ලාවක්, උඩරට බෙරයක්
- ඇමුණුම අංක 1.2.1.1 ට අයත් ස්වර ප්‍රස්තාර සහිත පත්‍රිකාව
- ඇමුණුම අංක 1.2.1.2 ට අයත් තාල පද ඇතුළත් පත්‍රිකාව
- ඇමුණුම අංක 1.2.1.3 ට අයත් දේශීය බෙරපද සහිත පත්‍රිකාව
- ඇමුණුම අංක 1.2.1.4 ට අයත් ස්වර බටහිර තාලපද පත්‍රිකාව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 1.2.1.1 -**

- 8 වසරේ දී උගත් තාල පදයක් හෝ කිහිපයක් අතින් තාල තැබීමට සිසුන් යොමු කරන්න.
- ඒ පිළිබඳ සිසුන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • විවිධ මාත්‍රා ගණනින් යුත් හින්දුස්ථානි තාලපද ඇති බව. |
| • එක් එක් තාල පදය සඳහා නිශ්චිත මාත්‍රා සංඛ්‍යාවක් ඇති බව. |
| • ඒවා තබ්ලාවෙන් වාදනය කරන බව |
| • තාල අතින් නිරූපණය කිරීමේ ක්‍රමයන් ද ඇති බව. |

(මිනිත්තු 20 යි)

**පියවර 1.2.1.2 -**

- ඇමුණුම අංක 1.2.1.2 ට අයත් ස්වර ප්‍රස්තාර ඇතුළත් පත්‍රිකාව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම ස්වර ප්‍රස්තාරය තාලානුකූලව ගයන්න.
- ඒ සඳහා අත් තැලීමට සිසුන් යොමු කරන්න.
- මාත්‍රා 2/3 හා 3/4 වශයෙන් නැවත නැවත ගයමින් අත් තැලීමට යොමු කරන්න.

(මිනිත්තු 30 යි)

**පියවර 1.2.1.3 -**

- ඇමුණුම 1.2.1.2 ට අයත් හින්දුස්ථානි තාලපද ඇතුළත් පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.
- 8 වසරේ දී උගත් තාලපදවල තාල සංඥා යෙදෙන ආකාරය සාකච්ඡා කරන්න.
- එම තාල පද උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- තාල සංඥා අනුව අත්තල නිරූපණයට සිසුන් යොමු කරන්න.

- මාත්‍රා 2/3 අනුව මත් කැටිවන්නේ ජප්තාලය බවත් මාත්‍රා 3/4 අනුව මත් කැටිවන්නේ දීප්චන්දි තාලය බවත් සිසුන්ට පහදා දෙන්න.

(මිනිත්තු 40 )

**පියවර 1.2.1.4 -**

- ඇමුණුම 1.2.1.3 ට දේශීය තාලපද ඇතුළත් පත්‍රිකාව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- 8 වසරේ දී උගත් තිත් සංඥා අනුව මෙම බෙර පද ද උච්චාරණය කර තාල තැබීමට සිසුන් යොමු කරන්න.
- තාලම්පටක් උපයෝගී කොටගෙන තිත් සහ තෙයි යන අක්ෂර දෙක උපදින ආකාරය පහදා දෙන්න.
- එම අක්ෂර දෙකෙහි වෙනස පහදන්න.
- තාලම්පට වයමින් තාල තැබීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- තිත් සහ තෙයි යන අක්ෂර අනුව අත්තල යොදන ආකාරය පිළිබඳව පැහැදිලි කරන්න.
- උඩරට බෙරය වාදනය කිරීමට හැකිනම් වාදනය කර පෙන්වන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.
  - මත් කැටි මිශ්‍ර වු විට විවිධ තාල උපදින බව.
  - හින්දුස්ථානී මෙන්ම දේශීය තාල පද්ධතිය තුළද මිශ්‍ර මත් කැටි ඇතුළත් තාල ඇති බව.
  - ඒවායින් විවිධ රස උපදින බව හා විවිධ භාවයන් නිරූපණය කල හැකි බව.
  - සුලු මහ දෙතිතට අනුව මාත්‍රා කැටිවන තාලපදයක් හින්දුස්ථානි තාල අතර නොමැති බව.
  - හින්දුස්ථානි තාල හා දේශීය තාල අතර සම විෂමකම් ඇති බව.
  - බටහිර තාල හා හින්දුස්ථානි තාල අතර සමානකම් ඇති බව.

(මිනිත්තු 30)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- හින්දුස්ථානි තාල පද නම් කරයි.
- දේශීය තාල පද නම් කරයි.
- මිශ්‍ර මත් කැටි සහිත තාල පද අත්තල යොදා පෙන්වයි.
- මිශ්‍ර මත් කැටි සහිත තාල පද භාවිතා කළ ගීත ශ්‍රවණය කිරීමට යොමු වෙයි.
- විවිධ සංගීත සම්ප්‍රදායන්ට අයත් තාල පද වාදනය කිරීමට කැමැත්තක් දක්වයි.

ඇමුණුම 1.2.1.1

**ක්‍රියාකාරකම - 01**

| | | | |
|---|---|---|---|
| 1 2 | 3 4 5 | 6 7 | 8 9 10 |
| ස රි | රි - - | ග ම | ම - ප |
| ග - | ම - ප | ග - | - - - |
| ග - | ම - - | ප - | ම - ග |
| ප - - | ම - ප | ග - | - - - |

**ක්‍රියාකාරකම - 02**

| | | | |
|---|---|---|---|
| 1 2 3 | 4 5 6 7 | 8 9 10 | 11 12 13 14 |
| ස - රි | ග ම ප ම | ග - රි | ග - - - |
| රි - ග | රි - ග ප | ග - රි | ස - - - |
| ග - ම | ප ධ ප ම | ග - ප | ම - - - |
| නි̣ - ස | රි - රි ප | ග - රි | ස - - - |

ඇමුණුම 1.2.1.2

**තාල නාමය** **දීප්චන්දි තාලය**

**තාල සංඥා**

| | | | | |
|---|---|---|---|---|
| | X | 2 | 0 | 3 |
| **මාත්‍රා** | 1 2 3 | 4 5 6 7 | 8 9 10 | 11 12 13 14 |
| **ඨේකාව** | ධ ධිං S | ධ ධ ධිං S | ත තිං S | ධ ධ ධිං S |

තාල නාමය ජප්තාලය

| | | | | |
|---|---|---|---|---|
| තාල සංඥා | x | 2 | 0 | 3 |
| මාත්‍රා | 1 2 | 3 4 5 | 6 7 | 8 9 10 |
| ඨේකාව | ධි න | ධි ධි න | ති න | ධි ධි න |

ඇමුණුම 1.2.1.3

## සුළු මැදුම් දෙතිත

| ∧ | | / | | | ∧ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| දො | ං | ජි | ං | ත | ග | ත | දො | ං | ත |

සුළු මහ දෙතිත


| ∧ | | / | | | | ∧ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| දො | ං | දො | ං | ජි | ං | ජි | ං | ග | ජි | ග | ත |

මැදුම් මහ දෙතිත


| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| දො | ං | දො | ජි | ං | ග | ත | ජි | ග | ත | දො | ං | ත | කු |

ඇමුණුම 1.2.1.3

5 /8 Rhythm




7/8 Rhythm



**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** : **රාග භාවය සහ එකිනෙක වෙනස් කම ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි.**

**ක්‍රියාකාරකම 1.3.1** : **' රාග තුළ යෙදෙන ස්වරයන්හි විශේෂතා හඳුනා ගනියි'**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01ට අයත් ගද්‍ය කොටස ලියන ලද පත්‍රිකා
- ඇමුණුම අංක 02ට අයත් කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 1.1.3.1 -**
- ඇමුණුම අංක 01ට අයත් කථාව පන්තියට ඉදිරිපත් කරන්න.
- රජතුමා, ප්‍රධාන ඇමති, රටවැසියන්, රටට ඉඳහිට පැමිණෙන රටට අයත් නොවන , වෙනත් රටක සිට පැමිණෙන සංචාරකයින් හා රටේ සතුරන් ආදි චරිත පිළිබඳ ව විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • රාගධාරී සංගීතයෙහි වැදගත් වන සිද්ධාන්ත පිළිබඳ අවබෝධය ලැබීම වැදගත් වන බව<br>• රාග ලක්ෂණ හඳුනා ගැනීමට පහසුවන වන බව<br>• රාගයක විවිධ ස්වර වර්ග යෙදෙන බව<br>• රාගයක අනන්‍යතාවය විදහා දැක්වීමට එම සිද්ධාන්ත වැදගත් වන බව |

(මිනිත්තු 20 යි)

**පියවර 1.1.3.2 -**
- ඇමුණුම අංක 1.1.3.1 හි සඳහන් කාර්ය පත්‍රිකාව කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- සිසු ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න..

(මිනිත්තු 50 යි)

**පියවර 1.1.3.3 -**
- කණ්ඩායම් වශයෙන් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වල අදහස් විමසන්න.
- ක්‍රියාකාරකම අදාළ ප්‍රශ්න නගමින් සාකච්ඡාවක් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- හින්දුස්ථානි රාගධාරී සංගීතයේ භාවිතා වන පාරිභාෂික වචන කිහිපයක් බව
- සෑම රාගයකම මෙම සිද්ධාන්ත කොටස් ඇතුළත් වන බව රාගයක් විස්තර කිරීමේ දී මෙම කොටස් පිළිබඳව මනා අවබෝධයක් තිබිය යුතු බව.
- රාගයන්හි ගාන සමය සොයා ගැනීමට රාග සන්සන්දනය කර දැක්වීමට ද, මේ පිළිබඳ අවබෝධය වැදගත් වන බව

(මිනිත්තු 10)

**තත්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- වාදි, සංවාදි, අනුවාදි, විවාදි, වර්ජිත ස්වර නිර්වචනය කරයි.
- එම පාරිභාෂික වචන වල වැදගත්කම පිළිගනියි
- එක් එක් පාරිභාෂික පදවලට අදාළ නිදර්ශක ඉදිරිපත් කරයි.
- එක් එක් පදවල වෙනස්කම් පැහැදිලි කරයි
- ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ලබයි

ඇමුණුම 01

- පහත දැක්වෙන ගද්‍ය කොටස කියවන්න. ඒ අනුව එහි සඳහන් චරිත පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.


" පුණ්‍යසෝම රජතුමා" කියන්නේ එම රටේ වැසියන්ගෙ දුක සැප සොයාබලමින්, දැහැමෙන් කැපවී රටට සේවය කරන ප්‍රධානම පුරවැසියාය. ඒ වගේ ම ඒ රටේ වැසියන්ගේ අඩුපාඩු සොයා බලමින් රජතුමාට සහාය වෙමින්, රජතුමා වගේ ම කැපවෙලා සේවය කරන තවත් කෙනෙක් ' අගමැති" නමින් එතුමා ළඟින්ම සිටියා. ඒ හැරුණහම, මුළු රටේ ම සිටින පුරවැසියන් ද රජුට සහ අගමැතිට, සහාය දෙමින් රට සංවර්ධනය කිරීමෙහි ලා මහත් පරිශ්‍රමයක් දැරීමෙහි යෙදී සිටියා. මේ අතර තුර, මෙම රටේ සෞන්දර්ය සිරි නැරඹීමට විදේශීය සංචාරකයින් ද, ඉඳ හිට පැමිණෙන්නට පටන් ගත්තා. ඒ අයගේ පැමිණීම රටේ සංවර්ධනයට මෙන්ම, රටේ ආර්ථිකය ගොඩ නැංවීමට ද මහත් රුකුලක් වුනා. ඒ වගේ ම රටට කවදාවත් ආදරය නො දක්වන, රටට කිසිසේත්ම ඇතුල් කර නොගන්නා පිරිසකුත් සිටියා රටේ සතුරන් වශයෙන් ...

- මෙහි පහත දැක්වෙන චරිත පිළිබඳ ව අදහස් දක්වන්න.
  1 රජතුමා
  2 අගමැති
  3 රට වැසියන්
  4 සංචාරකයින්
  5 සතුරන්
- ඉහත ආකාරයෙන් රාගයක යෙදෙන ස්වර පිළිබඳව ද වර්ග කළ හැකි වේ.

ඇමුණුම 02

කාර්ය පත්‍රිකාව

| A | B | C |
|---|---|---|
| භීම්පලාසි රාගය | භූපාලි | කාෆි |



1 A, B. C කොටස්වල දැක්වෙන ස්වර කොටස් අවධානයෙන් යුතුව නිරීක්ෂණය කරන්න.

2. A කොටසෙහි දැක්වෙන කෙටි ස්වර ඛණ්ඩ වලින් වැඩි කොටසක් අවසන් කෙරෙන ස්වරය සොයන්න. එමෙන්ම එම ස්වර වැඩිම වාර ගණනක් යෙදෙන අයුරුත් ඔබට පෙනෙනවා ඇති. එම ස්වරය 'වාදි' ස්වරය නමින් හැඳින්වෙන බව අවබෝධ කර ගත හැක.

3. ඊළඟට එම වාදී ස්වරය හැරුණු විට එම ස්වර කොටසෙහි වැඩිම වාරයක් යෙදෙන, ඊළඟට ප්‍රධාන වන ස්වරය සොයා එම ස්වරය 'සංවාදී' ස්වරය යනුවෙන් නම් කරන්න.

4. වාදී සහ සංවාදී ස්වර දෙක සොයාගත් පසු එම ස්වර කොටසෙහි ඊළඟට යෙදෙන ඉතිරි ස්වර සොයන්න. එම ස්වර " අනුවාදී" යනුවෙන් හැඳින්වෙන බව වටහා ගන්න.

5. B කොටසෙහි ඇති භූපාලි රාගයේ ස්වර ඛණ්ඩ නිරීක්ෂණය කරමින් එහි නොයෙදෙන ස්වර දෙක සොයාගන්න. එසේ නොයෙදෙන ස්වර " වර්ජිත' ස්වර යනුවෙන් හැඳින්වෙන බව.

6. C කොටසෙහි ඇති කාෆි රාගයේ ස්වර ඛණ්ඩ නිරීක්ෂණය කරමින් එහි යෙදෙන ආගන්තුක ස්වර දෙක සොයන්න. එම ස්වර 'විවාදි' ස්වර වශයෙන් හැඳින්වෙන බව

7. ඉහත සඳහන් කරුණු අවබෝධ කර ගනිමින් වාදි සංවාදී අනුවාදී විවාදී, හා වර්ජිත ස්වර පිළිබඳ හැඳින්වීමට සටහනක් පිළියෙළ කරන්න.

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** : **රාග භාවය සහ එකිනෙක වෙනස් කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි.**

**ක්‍රියාකාරකම 1.3.2** : **' රාග වෙනස සොයා බලමු'**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 1.3.2.1ට අයත් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත්
- සර්පිනාව/ශ්‍රැතිය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 1.3.2.1 -**

- ආරෝහණ සහ අවරෝහණ ක්‍රමයට ස්වර ස්ථාපනය වී ඇති ගීතයක් සිසුන් සමග ගායනය /වාදනය කරන්න.
  උදා - මුණිසිරිපාදේ ....
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන්ට එවැනි තවත් ගීතයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

  - කිසියම් පිළිවෙළකට (හඬ) ඉහළට යන සහ පහළට බසින ලෙස ස්වර යෙදී ඇති ගීතයක් බව
  - එසේ වෙනස්වන ලෙස ස්වර යෙදීම ආරෝහණ අවරෝහණ වශයෙන් හඳුන්වන බව
  - රාග භාවය අනුව ස්වර යෙදෙන ආකාරය වෙනස්වන බව
  - රාග භාවය අනුව සෑම රාගයකටම විශේෂිත වූ ස්වර කැටියක් මුඛ්‍යාංගය නමින් හඳුන්වන බව

(මිනිත්තු 10 යි)

**පියවර 13.2.2**

- ඇමුණුම අංක 1.3.2.1 ට අයත් භීම්පලාසි සහ යමන් යන රාගවලට අයත් ගවේෂණ පත්‍රිකාවේ පිටපත් කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායම්වලට අවශ්‍ය තැන්හි දී සහාය වන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 1.3.2.3 -**

- කණ්ඩායම් වශයෙන් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ගොඩ නගා ඇති ආරෝහණ අවරෝහණ ස්වභාවයන් නිවැරදිදැයි සාකච්ඡා කරන්න.

- නිවැරදි ශ්‍රැතිය මත පවත්වා ගනිමින්, හීම්පලාසි ආරෝහණ, අවරෝහණ ස්වර ගායනය ඇසුරු කරන්න.
- වාදනයෙන් සහාය වන්න.
- යමන් රාගයේ ආරෝහණ, අවරෝහණ ස්වර ගායනය පුහුණු කරන්න.
- රාග දෙක අතර ආරෝහණ සහ අවරෝහණයන්හි වෙනස සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - රාග භාවය ප්‍රකාශ කිරීම සඳහා, ආරෝහණ අවරෝහණ මුඛ්‍යාංග ගායනය/වාදනය කිරීම ඉතා වැදගත් වන බව
> - රාග ජාතිය තීරණය කිරීමටත් , ආලාප තාන් වැනි රාග වර්ධනය කිරීමට අවශ්‍ය ශිල්ප ක්‍රම ඉදිරිපත් කිරීමට මේ පිළිබඳ අවබෝධය ඉතා වැදගත්වන බව.

(මිනිත්තු 10 )


**තත්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- ආරෝහණ අවරෝහණ ස්වර ගොඩනගයි.
- එම සිද්ධාන්තයන්හි අවශ්‍යතාවය පිළිගනියි.
- ආරෝහණ අවරෝහණ, මුඛ්‍යාංග, නිවැරදිව ගායනය /වාදනය කරයි.
- රාග අනුව ආරෝහණ අවරෝහණ මුඛ්‍යාංග වල වෙනස සොයයි.
- ආරෝහණ අවරෝහණ ස්වරූපය අනුව එම රාගවලට අයත් ගීත වල ස්වර යෙදන බව පිළිගනියි.

ඇමුණුම 1.3.2.1

**ගවේෂණ පත්‍රිකාව**

- ක්‍රියාකාරකම I **හීම්පලාසි රාගය**



1. ඉහත සඳහන් ස්වර ඛණ්ඩ නිරීක්ෂණය කරමින්, භීම්පලාසි රාගයේ ආරෝහණ, අවරෝහණ ස්වර ඛණ්ඩ තෝරා පහත දැක්වෙන වගුවෙහි ලියන්න.

| ආරෝහණ ස්වර | අවරෝහණ ස්වර |
|---|---|
| | |

2 වගුව ඇසුරෙන් භීම්පලාසි රාගයෙහි ආරෝහණ හා අවරෝහණ ස්වර ලියා දක්වන්න.

ආරෝහණ -

අවරෝහණ -


3. භිම්පලාසි රාගයෙහි මුඛ්‍යාංගය පිළිබඳව දැනුවත් වන්න.

මුඛ්‍යාංගය - නි̣ ස ම , ම ග, ප ම , ග , මග රිස,

ඇමුණුම 1.3.2.1

**ගවේෂණ පත්‍රිකාව**

**ක්‍රියාකාරකම II - යමන් රාගය**



1. ඉහත සඳහන් ස්වර ඛණ්ඩ නිරීක්ෂණය කරමින්, යමක් රාගයට අයත් ආරෝහණ, අවරෝහණ ස්වර ඛණ්ඩ තෝරා පහත දැක්වෙන වගුවෙහි ලියන්න.

| ආරෝහණ ස්වර ඛණ්ඩ | අවරෝහණ ස්වර ඛණ්ඩ |
|---|---|
| | |

2. යමන් රාගයට අයත් ආරෝහණය සහ අවරෝහණය ලියා දක්වන්න.

3. යමන් රාගයෙහි මුඛ්‍යාංගය පිළිබඳව දැනුවත් වන්න.

මුඛ්‍යාංගය - නි̣ රි ග රි, ස , ප ම ග , රි, ස

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** : **රාග භාවය සහ එකිනෙක වෙනස් කම ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි.**

**ක්‍රියාකාරකම 1.3.3** : **' භීම්පලාසි රාගයේ ලක්‍ෂණ විමසමින් ගීයක රස විඳිමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01 හි දැක්වෙන ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය
- සර්පිනාව
- තබ්ලාව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 1.3.3.1 -**
- භීම්පලාසි රාගයේ ස්වර අභ්‍යාසයක් සිසුන් සමඟ ගායනා කරන්න.
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන්ට ගායනයට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - ස්වර අභ්‍යාස ගායනය තුළින් රාගයේ භාවය හඳුනා ගැනීමට පහසුවන බව
  - රාග සංගති පිළිබඳව අවබෝධය ඇතිවන බව
  - රාගයන්හි වෙනස හඳුනා ගැනීමට උදව්වන බව

(මිනිත්තු 20 යි)

**පියවර 13.3.2**
- ඇමුණුම අංක 01 හි දැක්වෙන ගීතය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා, ලක්‍ෂණ ගීතය ගයා වයා දක්වන්න.
- ගුරුවරයාගේ වාදනයට සවන් දෙමින් සිසුන්ට, ගීතය ගායනයට සලස්වන්න.
- ස්ථායි සහ අන්තරා, කොටස් නාද මාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.
- කණ්ඩායම් වශයෙන්, යුගල වශයෙන්, ඒකල වශයෙන්, ගායනයට අවස්ථාව සලස්වන්න.
- සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 02 ට අයත් කාර්ය පත්‍රිකා බෙදා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 80 යි)

පියවර 1.3.3.3 -

- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරන්න.
- ලක්‍ෂණ ගීතය ගායනය සඳහා වාදනයෙන් සහාය වන්න.
- ඉදිරිපත් කරන ලද කරුණුවල සදොස් තැන් නිදොස් කරන්න.
- අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - රාගයේ ලක්‍ෂණ හඳුනා ගැනීම සඳහා ලක්‍ෂණ ගීත ගායනය රුකුලක් වන බව
> - රාග ලක්‍ෂණ මතක තබා ගැනීමට පහසුවන බව
> රාග සන්සන්දනය කිරීමේ දී ලක්‍ෂණ ගීත පුහුණුව වැදගත් වන බව.


(මිනිත්තු 20)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- රාග ලක්ෂණ වගුගත කරයි.
- ලක්‍ෂණ ගීත ගායනයෙහි වැදගත්කම පිළිගනියි.
- ලක්‍ෂණ ගීත ගායනය කරයි.
- රාග අතර වෙනස්කම් සොයයි.
- වෙනත් රාග හා සසඳමින් ලක්‍ෂණ සෙවීමට උනන්දු වෙයි.


ඇමුණුම 01

**භීම්පලාසි රාගය**



## ක්‍රියාකාරකම 01

1. පහත සඳහන් වගුවල ඇති ස්වර සංගති අවධානයෙන් යුතුව තීරණය කරන්න.
2. එම වගුව තුළ ඔබ මීට පෙර ඉගෙනගත් (8 ශ්‍රේණියෙහි ) කාෆි රාගයෙහි ස්වර සංගති කිහිපයක් ද මිශ්‍ර කර ඇත
3 එම වගුව තුළ ඇති භීම්පලාසි රාගයට අයත් ස්වර සංගති පමණක් තෝරා ලැයිස්තුවක් ලියන්න.



ක්‍රියාකාරකම 02

4. භීම්පලාසි රාගයෙහි ලක්ෂණ ගීතය ඇසුරින් රාග විස්තර පහත සඳහන් කරුණුවලට අදාළව ඉදිරියෙන් ලියන්න.

   i ථාටය :-
   ii ආරෝහණ
   iii අවරෝහණ :-
   iv ජාතිය :-
   v වාදී :-
   vi සංවාදී :-
   vii අනුවාදී :-
   viii ගායන සමය :-

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** : **රාග භාවය සහ එකිනෙක වෙනස් කම ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි.**

**ක්‍රියාකාරකම 1.3.4** : **' යමන් රාග ලක්ෂණ සොයමු ගීයක රස විඳිමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම අංක 01 හි දැක්වෙන ගීතය ඇතුළත් දෘශ්‍ය ආධාරකය
- ඇමුණුම් අංක 02 හි දැක්වෙන යමන් රාග ලක්ෂණ ඇතුළත් ගීත ප්‍රස්තාර
- ඇමුණුම් අංක 03 ට අයත් කාර්ය පත්‍රිකා පිටපත්
- හාර්මෝනියම් , තබ්ලාව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 1.3.4.1 -**

- ඇමුණුම් අංක 01 හි දැක්වෙන ගීතය ප්‍රදර්ශනය කරන්න.
- ගීතයේ රසවත්ව, භාවාත්මකව ගායනා කර දක්වමින්, සිසුන්ට ශ්‍රවණයට යොමු කරන්න.
- සිසුන් සමග ගීතය ගායනා කරන්න.
- මීට පෙර හඳුනාගත් මෙම රාගයට අදාළ ලක්ෂණ යටතේ පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

> - රාග සංගති ඇතුළත් වන සේ යමන් රාගය ආශ්‍රයෙන් නිර්මාණය කර ඇති සරල ශාස්ත්‍රීය ගීතයක් බව
> - යමන් රාගයේ රසය, භාවය එම ගීතයෙන් ප්‍රකට වන බව
> - රාගාංග මැනවින් අධ්‍යයනය කිරීමෙන් රාගාශ්‍රිතව ගීත නිර්මාණය කළ හැකි බව.

(මිනිත්තු 20 යි)

**පියවර 1.3.4.2**

- ඇමුණුම අංක 02 හි දැක්වෙන ගීතය ප්‍රදර්ශනය කරන්න.
- ලක්ෂණ ගීතය ගයා වයා දක්වන්න.
- ගුරුවරයාගේ වාදනයට සවන් දෙමින් සිසුන්ට, ගීතයේ පාදයෙන් පාදය ගායනයට අවස්ථාව සලස්වන්න.
- ස්ථායි සහ අන්තරා, කොටස් නාද මාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.
- යමන් රාගයේ ලක්ෂණ පිළිබඳව අවධාරනය කරමින් ගීතය පුහුණු කරවන්න.
- යුගල වශයෙන් ඒකල වශයෙන් ගායනයට අවස්ථාව දෙන්න.

- සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 ට අයත් කාර්ය පත්‍රිකා බෙදා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 80 යි)

පියවර 1.3.4.3 -

- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කරන ලද කරුණුවල සදොස් තැන් නිදොස් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • රාග හඳුනා ගැනීම සඳහා රාග ලක්‍ෂණ පිළිබඳ අවබෝධය වැදගත් බව<br>• රාග ලක්‍ෂණ වගුගත කිරීමටත්, රාග සන්සන්දනය කිරීමට පහසුවක් වන බව |

(මිනිත්තු 20)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- රාග ලක්ෂණ අදාළ රාග නම් කරයි.
- රාග ලක්‍ෂණ පිළිබඳ අවබෝධය වැදගත් වන බව පිළිගනියි.
- රාග සන්සන්දනය කරයි.
- වෙනත් රාග අතර ලක්‍ෂණ සෙවීමට උනන්දු වෙයි.

ඇමුණුම 01

**ක්‍රියාකාරකම 01**

- පහත සඳහන් ලක්‍ෂණ ඇතුළත් වන රාගයෙහි නම ඉදිරියෙන් ලියන්න.

1 ඖඩව සම්පූර්ණ ජාති රාගයකි

2 සම්පූර්ණ ජාති රාගයකි

3 ග සහ නි සංවාදි වේ

4 'ම' සහ 'ස' වාදි සංවාදී වේ

5 කොමළ ග නි යෙදෙන රාගයකි

6 තීව්‍ර මධ්‍යමය යෙදේ

7 නි̣ ස ග ම ප, ග ම ග රි ස, ස්වර සංගතිය යෙදෙන රාගයක

8 ස රි ම ප ධ යන ස්වර අනුවාදී වේ

9 රි ග ප ධ නි ස්වර අනුවාදි වේ

10 රාත්‍රි ප්‍රථම ප්‍රහරයෙහි ගැයේ

11 දිනයේ දෙවැනි ප්‍රහරයෙහි ගැයේ

12 කල්‍යාණ ථාටයෙන් ඉපදේ.

13 කාෆි ථාටයෙන් ඉපදේ

14 නි̣ රි ස, ග රි ස, ප ම් ග රි ස ස්වර සංගතිය යෙදේ

15 ම ප නි සං ස්වර සංගතිය යෙදේ

2. ඉහත සඳහන් යමන් හා භීම්පලාසි රාග දෙක සන්සන්දනය කර ලියා දක්වන්න.

ඇමුණුම අංක 01

### යමන් රාගය ආශ්‍රිත සරල ශාස්ත්‍රීය ගීතයක්




" සරල ශාස්ත්‍රීය ගීත රසාස්වාදය'

- ජයන්ත අරවින්ද

**ඇමුණුම අංක 01**

**යමන් රාගයේ ලක්ෂණ ගීතය**



**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : **විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් වාදනය කරයි**

**ක්‍රියාකාරකම 2.1.1** : **' ස්වර පුවරුවෙන් බිලාවල් හා කාෆි ආරෝහණ අවරෝහණ මධ්‍යමය හා පංචමය ශ්‍රැති කරගෙන වාදනය කරයි.**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ස්වර පුවරු භාණ්ඩ (සර්පිනාව ඕගනය හා මෙලෝඩිකා)
- ඇමුණුම් අංක 01 හි කාර්ය පත්‍රිකා පිටපත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 2.1.1.1 -**
- කුඩා ගීතයක් විවිධ ශ්‍රැති කිහිපයක ස්වර පුවරුවෙහි වයා පෙන්වන්න.
- ඒ පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • එකම ස්වර ඛණ්ඩය විවිධ ශ්‍රැතිවලින් වාදනය කළ හැකි බව<br>• එහි දී වෙනස් වනුයේ ඇසෙන නාදයේ හඬ තලය පමණක් බව සහ තනුව වෙනස් නොවන බව |

(මිනිත්තු 20 යි)

**පියවර 2.1.1.2**
- සියලු දෙනාටම ස්වර පුවරු භාණ්ඩ භාවිතා කළ හැකිවන පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම අංක 01 හි ඇතුළත් කාර්ය පත්‍රිකාව සෑම කණ්ඩායමකටම බෙදන්න.
- එහි උපදෙස් අනුව කටයුතු කිරීමට සලස්වන්න.
- කාර්යයේ යෙදීමේ දී වැරදි ඇතොත් නිවැරදි කර ගැනීමට මග පෙන්වන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 2.1.1.3 -**
- තනි තනිව බිලාවල් සහ කාෆි ආරෝහණ ෂඩ්ජ මධ්‍යම, පංචම භවයෙන් වාදනය කරවා වැරදි ඇතොත් නිවැරදි කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • කුමන ස්වරයක් පාදක (ශ්‍රැති) ස්වරය ලෙස භාවිත කළ ද මූලික නාද රටාවේ වෙනසක් නොවන බව<br>• ෂඩ්ජ භාවයට සාපේක්ෂව හඬ තලය ඉහල ගොස් ඇති බව<br>• මේ අයුරින් ස්වර 12 ඕනෑම ස්වරයක් ශ්‍රැති ස්වරය ලෙස ගෙන වාදනය කළ හැකි බව |

(මිනිත්තු 10 )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- විවිධ ශ්‍රැති අනුව වාදනය කළ හැකි බව හඳුනා ගනියි.
- විවිධ ශ්‍රැති අනුව වාදනය කරයි.
- ශ්‍රැතිය වෙනස් වුවද නාද රටාව වෙනස් නොවන බව දැන ගනියි.
- ගීත විවිධ ශ්‍රැතිවලින් වාදනය කිරීමට පෙළඹෙයි.
- විවිධ ශ්‍රැතිවලින් වාදනය කළ හැකි ගීත එක් රැස් කරයි.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව 1 කොටස**

- ස්වර 12 පිහිටීම නැවත සිහියට නගා ගන්න.
  ස රි රි ග ග ම ම ප ධ නි නි
- රූප සටහන අංක 01 අධ්‍යයනය කරමින් දී ඇති උපදෙස් අනුව හිස්තැන් පුරවන්න.

රූප සටහන් 01

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආඪජ භවයෙන් ස්වර 12 පිහිටීම | ස | රි | රි | ග | ග | ම | ම' | ප | ධ | ධ | නි | නි | ස් |
| සඩ්ජ භාවයෙන් ස්වර සප්තකයේ ඉතිරි ස්වර පුරවන්න | ස | | | | | | | ප | | | | | |
| මධ්‍යම භාවයෙන් ස්වර සප්තකය (ඉතිරි ස්වර පුරවන්න) | ම | | [illegible] | | ධ | | | | | | | | |
| පංචම භාවයෙන් ස්වර සප්තකය (ඉතිරි ස්වර පුරවන්න) | ප | | | | | | | රි | | | | | |

- සඩ්ජ භාවයෙන් ලියා දැක්වෙන්නේ බිලාවල් රාගයේ සවර බව හඳුනා ගන්න.
- සඩ්ජ භාවයට සාපේක්ෂව මාධ්‍යමයෙන් හා පංචමයෙන් ලියා ඇත්තේ ද,බිලාවල් රාගයේ ස්වරම බව එකට වාදනය කරමින් හඳුනාගන්න. මධ්‍යම භාවයේදි කෝමළ නිෂාදයත් පංචම භවයේ තීව්‍ර මධ්‍යමයත් යෙදිම පිළිබඳව තර්කානුකූලව අදහස් දක්වන්න. ගුරු උපදෙස් ලබා ගන්න.
- බිලාවල් ආරෝහණ අවරෝහණ මධ්‍යමය හා පංචමය ශ්‍රැති ස්වරය ලෙස ගෙන දක්ෂ ලෙස වාදනය කිරීමට පුරුදු වන්න.

## II කොටස

- රූප සටහන 02 අධ්‍යයනය කරන්න.
- රූපසටහනේ ස්වර 12 පිහිටීමේ ස්වර 12 ට අයත් අංක සමග සන්සන්දනය කරන්න.
- එම රූප සටහනේ මධ්‍යම භාවයේ හා පංචම භාවයේ ස්වර 12 පිහිටුවාලීම උපකාර කොට ගෙන මෙහි හිස් තැන් පුරවන්න.

| සඩ්ජ අංක 1 අයත් අංක | 1 | 3 | 4 | 6 | 8 | 10 | 11 | 1 |
|---|---|---|---|---|---|---|---|---|
| සඩ්ජ භවයෙන් කාෆි රාගයේ ස්වර | ස | රි | ග | ම | ප | ධ | නි | |
| මධ්‍යම භාවයෙන් කාෆි රාගයේ ස්වර (හිස් තැන් පුරවන්න) | ම | | | ධ | | රි | | ම |
| පංචම භාවයෙන් කාෆි රාගයේ ස්වර (හිස් තැන් පුරවන්න) | ප | | | ස̇ | | | ම̇ | ප̇ |

- සඩ්ජ භාවයෙන් ලියා ඇති කාෆි රාගයේ ස්වර සමග මධ්‍යම හා පංචම භාවයෙන් ලියා ඇති කාෆි ස්වර සන්සන්දනාත්මකව වාදනය කරමින් අධ්‍යයනය කරන්න.

ස̇

- මධ්‍යමය හා පංචමය ශ්‍රැති කොටගෙන ඇති රාගයේ ස්වර වාදනය සඳහා හොඳින් පුරුදු වන්න.

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : **විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් වාදනය කරයි**

**ක්‍රියාකාරකම 2.1.2** : **ම හා ප ශ්‍රැති කරගෙන ගීත ප්‍රස්තාර කරමු**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ස්වර පුවරු භාණ්ඩ (සර්පිනාව හා මෙලෝඩිකා)
- ඇමුණුම් අංක 01 හි කාර්ය පත්‍රිකා පිටපත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** -

**පියවර 2.1.2.1** -
- බිලාවල් හා කාෆි රාගයට අයත් සිසුන් දන්නා මධ්‍යලය ගීතය කොටසක් ම හා ප ශ්‍රැති කරගෙන වාදනය කර පෙන්වන්න.
- වයන අතර අදාළ ශ්‍රැතියට අයත් ස්වර ගායනා කරන්න.
- ෂඩ්ජ භාවයෙන් තිබූ ස්වර උච්චාරණය නොවුවද මුල් නාද මාලාවට නිවැරදිව මතුවන ආකාරය පිළිබඳව සිසු අවධානය යොමුකරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • හින්දුස්ථානි සංගීතයට ඇතුළත් සියලු ගායන වාදන ෂඩ්ජය පදනම් කොට ගෙනම ඉදිරිපත් වන බව<br>• වෙනත් ස්වරයක් උසුරුවීමෙන් රාගයේ ලක්ෂණ මතුකළ නො හැකි බව<br>• වාදනය කළ ද රාගයට හානියක් නොවන බව |

(මිනිත්තු 10 යි)

**පියවර 2.1.1.2**
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම අංක 01 හි ඇතුළත් කාර්ය පත්‍රිකාව සෑම කණ්ඩායමකටම බෙදන්න.
- එහි උපදෙස් අනුව කටයුතු කිරීමට සලස්වන්න.
- ඔබගේ සහාය නිරතුරුවම සිසුන්ට ලබා දෙන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 2.1.1.3** -
- නිමකල ප්‍රස්තාර (ශ්‍රැති දෙකටම අයත්ව ) කීපයක් අහඹු ලෙස තෝරාගෙන වාදනය කර පෙන්වන්න.
- එහි වැරදි ඇතොත් නිවැරදි කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • ශ්‍රැති මාරු කරලීමේ ක්‍රියාවලිය බටහිර සංගීතයේ දී Transpose යනුවෙන් හඳුන්වන බව<br>• පෙර දී ලියාගත් ස්වර දෙස බලමින් නොව මතකයෙන් ම කළ යුතු ක්‍රියාවලියක් බව. |

(මිනිත්තු 60 )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- ශාස්ත්‍රීය සංගීතයේ දී ශ්‍රැති මාරු කළ ද මුල් ස්වරයම උච්ඡාරණය කරන බව දැන ගනියි.
- ශ්‍රැති මාරු කිරීමෙන් මුල් රසය අඩුවැඩි වන බව වටහා ගනියි.
- ශ්‍රැතිය මාරු කරමින් ගීත ලියයි.
- ශ්‍රැතිය මාරු කරමින් ගීත වාදනය කරයි.
- විවිධ ශ්‍රැතීන්ට අයත් ස්වර හඳුනා ගනියි.

ඇමුණුම 01

**ගවේෂණ පත්‍රිකාව**

| | | | | |
|---|---|---|---|---|
| සඩ්ජ භවයෙන් | ග - ම | ප - ග | ම - ග | රි - - |
| මධ්‍යම භාවයෙන් | ධ - නි | ස් - ධ | නි - ධ | ප - - |
| පංචම භාවයෙන් | නි - ස් | රි̇ - නි | ස් - නි | ධ - - |

| | | | | |
|---|---|---|---|---|
| සඩ්ජ භවයෙන් | ස ස රි රි | ග රි ස - | රි රි ම ම | ප - - - |
| මධ්‍යම භාවයෙන් | ම ම ප ප | ධ ප ම - | ප ප නි නි | ස් - - - |
| පංචම භාවයෙන් | ප ප ධ ධ | නි ධ ප - | ධ ධ ස් ස් | රි̇ - - - |

- ම හා ප ශ්‍රැති කොට ලියා ඇති ස්වර ඛණ්ඩයන්හි ස්වර යෙදී ඇති අයුරු පෙර පාඩමින් ලබාගත් දැනුම හා දත්තයන් භාවිතා කර සන්සන්දනාත්මකව අධ්‍යයනය කරන්න.
- මෙම ස්වර ඛණ්ඩ ස්වර පුවරුවෙහි වාදනය කර සිදුව ඇති වෙනස වටහා ගන්න. ගුරුතුමා /තුමිය සමග සාකච්ඡා කොට තව දුරටත් තහවුරු කර ගන්න.

03

| | | | |
|---|---|---|---|
| ග - ම | ප - ධ | නි - - | - - - |
| ස ස රි රි | ග ග ම ම | ග ග රි රි | ස - - - |

- ඉහත ස්වර ඛණ්ඩ දෙක ම හා ප ශ්‍රැති කරගෙන ලියන්න
- ගුරුතුමාට/තුමියට පෙන්වා වැරදි ඇතොත් නිවැරදි කර ගන්න.

04 පහත සඳහන් ගීතය ම හා ප ශ්‍රැති කරගෙන ලියන්න.

**ගුරු උපදෙස්** -

මේ සඳහා 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 96 පිට ඇතුළත් 'මල් පිබිදී ගෙන එන්නේ..' ගීතය සිසුන්ට සපයා දෙන්න.

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : **විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් වාදනය කරයි**

**ක්‍රියාකාරකම 2.1.3** : **' ම හා ප ශ්‍රැති කරගෙන ස්වර පුවරුවෙන් ගීත වයමු'**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ස්වර පුවරු භාණ්ඩ
- පෙර ක්‍රියාකාරකමෙහි සිසුන් විසින් මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියූ ගීතයේ ප්‍රස්තාර

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 2.1.3.1 -**
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කීප දෙනෙකු ලවා බිලාවල් හා කාෆි ආරෝහණ. අවරොහණ ම හා ප ශ්‍රැති කරගෙන වැයීමට සලස්වන්න.
- එම සිසුන් අගයන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • විවිධ ශ්‍රැතිවලින් වාදනය කිරීමේ හැකියාව වාදකයකු සතු උසස් ගුණාංගයක් බව<br>• මෙම හැකියාව ලබා ගැනීම සඳහා හොඳින් අභ්‍යාස කළ යුතු බව<br>• මෙම ප්‍රවීණත්වය ලැබීමට විවිධ ස්වර ශ්‍රැතිකර ගනිමින් (Scale) ස්වර අෂ්ටකය හා ඒ තුළ අභ්‍යාස වාදනය කරන බව |

(මිනිත්තු 10 යි)

**පියවර 2.1.3.2**
- ක්‍රියාකාරකම් 2.1.2 හි ම හා ප යන ශ්‍රැති මතට පරිවර්තනය කරන ලද ගීතයේ ප්‍රස්තාර සපයා ගැනීමට උපදෙස් දෙන්න.
- ම ශ්‍රැති ස්වරය කොට ගත් ප්‍රස්තාරය පුහුණු කරවන්න.
- ප ශ්‍රැති ස්වරය කොටගත් ප්‍රස්තාරය පුහුණු කරවන්න.
  ෂඩ්ජයෙන් ලියා ඇති ප්‍රස්තාරයද වාදනයට සලස්වා වෙනස හොඳින් වටහා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 2.1.3.3 -**
- තනි තනිව ගෙන සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • ගායකයාට ගායනා කළ හැකි ස්වර පරාසයට ගැළපෙන ලෙස ශ්‍රැති මාරු කළ යුතු බව<br>• ශ්‍රැති වෙනස් වීමෙන් ප්‍රකාශිත භාවය ද වෙනස් විය හැකි බව.<br>• ගීතයේ අදහසට ගැළපෙන ලෙස ද ශ්‍රැතිය තීරණය කළ යුතු බව |

- සිරි සංඝබෝධිය මාළිගාවෙ දී වැනි නූර්ති ගීතයක් සඩ්ජ භාවයෙන් හා මධ්‍යම භාවයෙන් වාදනය කිරීමේ දී එහි භාවය වෙනස් වන අයුරු උදාහරණ ලෙස පෙන්වාදිය හැකි බව.

(මිනිත්තු 60 )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- ම හ ප ශ්‍රැති ලෙස භාවිත කර ස්වර පුවරුවෙන් ගීත වයයි.
- ශ්‍රැතියෙන් ගීතයේ අදහස තීව්‍ර කළ හැකි බව අවබෝධ කර ගනියි.
- එක් එක් ගීතයෙන් ප්‍රකාශිත අදහස් භාවය ශ්‍රැතිය වෙනස් කිරීමෙන් අඩු වැඩි වන බව පිළිගනියි.
- ඕනෑම ස්වරයක් ශ්‍රැති ස්වරය කර ගනිමින් වාදනය කිරීමේ හැකියාව ලබයි.
- විවිධ ස්වර ශ්‍රැති කරගත් වාදන හා ගායනය පිළිබඳ තොරතුරු රැස් කරයි.

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : **ශ්‍රැති ස්ථාන ශ්‍රැති කර ගනිමින් වාදනය කරයි.**

**ක්‍රියාකාරකම 2.1.4** : **' ම හා ප ශ්‍රැති කරගත් ගීත තෝරාගත් භාණ්ඩයේ වයමු'**

**කාලය** : කාලච්ඡේද 06 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ ස්වර ශ්‍රැති කරගත් ගීත ඇතුලත් සීඩී තැටියක්
- සිසුන් සතු සංගීත භාණ්ඩ
- ගුරුවරයා විසින් සපයාගත් ස්වර අභ්‍යාස හා ගීත ප්‍රස්තාර

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 2.1.4.1 -**
- විවිධ ස්වර ශ්‍රැති කරගත් ගීත කැසට් හෝ සී. ඩී. මගින් ශ්‍රවණයට සලස්වන්න. නැතහොත් වාදනය කර පෙන්වන්න.
- එසේ වාදනය කිරීමට සිසුන් තුල ඇති කැමැත්ත විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • විවිධ ශ්‍රැති අනුව ගීත වාදනයට ප්‍රථම එම ශ්‍රැති අනුව ස්වර අභ්‍යාස වාදනය කරන්න.<br>• පදනම් කරගත් ශ්‍රැතියට අදාළ ශුද්ධ හා කෝමළ ස්වර යෙදෙන අයුරු හොඳින් සිහියේ තබාගත යුතු බව. |

(මිනිත්තු 10 යි)

**පියවර 2.1.3.2**
- මධ්‍යම භාවයෙන් ඔබ විසින් ගොඩ නැගු ස්වර අභ්‍යාස පළමු කාලජේදයක තුළ ලබා දී පුහුණු කරවන්න.
- දෙවන හා තුන්වන කාලජේදතුළ ඔබ විසින් තෝරාගෙන මධ්‍යම භාවයට පෙරලුගීත දෙකක් පුහුණු කරවන්න.
- 5 හා 6 වන කාලඡේදයන් හිදී පංචම භාවයට පෙරලු ගීත පුහුණු කරවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 2.1.3.3 -**
- ළමුන් තනි තනිව ගෙන කොටසක් හෝ වාදනය කරවා සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • ශ්‍රැති මාරු කරමින් වාදනයෙහි නිපුණතාවය සතත අභ්‍යාසයෙන්ම ලැබෙන බව.<br>• ම හා ප ශ්‍රැති ස්වර සප්තකයට වාදනය කිරීමෙන් ලැබෙන ප්‍රකෘති හා විකෘති ස්වර හොඳින් මතකයේ තබාගත යුතු බව |

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- ම ශ්‍රැති ස්වරය ලෙසගෙන ගීත වාදනය කරයි.
- ප ශ්‍රැති ස්වරය ලෙස ගෙන ගීත වාදනය කරයි.
- වාදනයට පහසු අපහසු ශ්‍රැති හඳුනා ගනියි.
- ශ්‍රැති මාරුකර වාදනය කරන ලද ගීත එක් රැස් කරයි.
- ස්වර ලිපි බලා වාදනය කිරීමේ හැකියාව ලබයි.

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** : **විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් වාදනය කරයි**

**ක්‍රියාකාරකම 2.2.1** : **සංගීත භාණ්ඩ වර්ගීකරණය කරයි.**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- සමූහ වාදනයක් ඇතුළත් හඬ පටයක් හෝ තැටියක් ගුරු උපදෙස්
- තෝරාගත් වාදනය තුළ පෙරදිග හා දේශීය භාණ්ඩ කීපයක් ඇතුළත් විය යුතු ය. මෙම භාණ්ඩ ඇතුළත් ගීතයක් වුවද සෑහේ.
- කැසට් යන්ත්‍රයක් හෝ සීඩී යන්ත්‍රයක්
- ඇමුණුම අංක 01
- ඇමුණුම අංක 02

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 2.2.2.1 -**

- සමූහ වාදනය හෝ ගීතය ශ්‍රවණයට සලස්වන්න.
- එහි භාවිතා කර ඇති සංගීත භාණ්ඩ හඳුනාගෙන ලැයිස්තුවක් පිළියෙළ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • ශ්‍රවණය කළ භාණ්ඩ පෙරදිග අපරදිග හා දේශීය වශයෙන් වර්ග කළ හැකි බව<br>• අප මෙහි දී අවධානය යොමුකරනුයේ පෙරදිග හින්දුස්ථානී හා දේශීය භාණ්ඩ පිළිබඳව පමණක් බව |

(මිනිත්තු 10 යි)

**පියවර 2.2.1.2**

- ඇමුණුම 01 පිටපත් කර සිසුන් අතට පත් කරන්න. (තනි තනිව හෝ කණ්ඩායම් කර )
- එහි ඇති උපදෙස් අනුව කටයුතු කිරීමට සිසුන් යොමුකරන්න.
- ඇමුණුම 02 හි පිටපත් සිසුන් අතට පත් කරන්න. (දෙවන කාලජේදයේ පළමු විනාඩි 30 තුළ)
- එහි ඇති උපදෙස් අනුව කටයුතු කිරීමට සිසුන් යොමු කරන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 2.2.1.3**

- සිසුන් විසින් සම්පූර්ණ කළ වගු පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වා වැරදි ඇතොත් නිදොස් කරන්න.
- දේශීය හා පෙරදිග හින්දුස්ථානි පද්ධතීන්ට අදාළ වගුව අනුව භාණ්ඩ වර්ගීකරණය පිළිබඳව සටහන් ගොඩ නැගීමට උපදෙස් දෙන්න.

- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - වාදනය කරනු ලබන ක්‍රම ශිල්පය අනුව භාණ්ඩ වර්ගීකරණය කර ඇති බව
> - දේශීය භාණ්ඩ අතර තත් වාද්‍ය නොමැති බව
> - දේශීය භාණ්ඩ අතර බෙර වර්ග වැඩි බව
> - දේශීය භාණ්ඩ අතර නිවැරදිව ස්වර උත්පාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩ නොමැති බව.

(මිනිත්තු 10)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- දේශීය භාණ්ඩ හඳුනා ගනියි.
- පෙරදිග භාණ්ඩ හඳුනා ගනියි.
- උභය වර්ගයන් පිළිබඳව තුලනාත්මක විග්‍රහයක් කරයි.
- දේශීය අනන්‍යතාවය හා පෞරුෂය රැඳී ඇත්තේ තාල වාද්‍ය මතබව වටහා ගනියි.
- භාණ්ඩ වාදනයට කැමැත්තක් ඇති කර ගනියි.

ඇමුණුම 01

**පෙරදිග හින්දුස්ථානි සංගීත භාණ්ඩ**

| | |
|---|---|
| සිතාරය තාම්පුරාව<br>සන්තුර්, එස්රාජය | තබ්ලාව පක්වාජ්<br>ඩෝලය |
| ජල තරංග<br>ගෙජ්ජි | බටනලාව , සර්පිනාව<br>ෂෙහෙනායි |

**ඇමුණුම 01**

**කාර්ය පත්‍රිකාව**

ඉහත දක්වා ඇත්තේ කිසියම් පදනමක් අනුව වර්ග කරන ලද සංගීත භාණ්ඩ ලැයිසතුවකි. එය හොඳින් නිරීක්ෂණය කර පහතින් දක්වා ඇති උපදෙස් අනුව මෙම වගුව පුරවන්න.

| හඬ නිපදවන ආකාරය | භාණ්ඩය | භාණ්ඩ වර්ගය | කාර්ය |
|---|---|---|---|
| සුළගේ ආධාරයෙන් | | | |
| තත් ආධාරයෙන් | | | |
| සම් ආධාරයෙන් | | | |
| ලෝහයෙන් හෝ  ඝන ද්‍රව්‍යයක් සැදූ ගැටීමේ ආධාරයෙන් | | | |

පියවර 01- ඉහත 1 වගුවේ ඇති සංගීත භාණ්ඩ 11 වගුවෙහි අදාල ස්ථානය තෝරා ලියන්න. ඝන වාද්‍ය, සුශර වාද්‍ය, තත්වාද්‍ය

පියවර 02 - පහත දක්වා ඇත්තේ සංගීත භාණ්ඩ වර්ග හඳුන්වන නාමයන්ය. ගැළපෙන කොටුව තෝරා එම නම් ලියන්න.

පියවර 03 - පහත දක්වා ඇත්තේ ඒ ඒ භාණ්ඩයන්ගෙන් ඉටුවන කාර්යයන් ය. අදාළ ස්ථානය තෝරා ලියන්න. එක් කොටුවක් සඳහා කාර්යන් දෙකම ලිවීමටද සිදුවිය හැක.

1. ස්වර වාදනය


2 තාල වාදනය

පියවර 04 - ඔබ විසින් ශ්‍රවණය කළ වාදනයෙන් හෝ ගීතයෙන් ලබාගත් භාණ්ඩ ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ මෙහි අදාළ ස්ථානයන්හි නොමැති නම් ලියන්න.

පියවර 05 ගුරුවරයා විසින් සපයන සංගීත භාණ්ඩවල රූප සටහන් හොඳින් නිරීක්ෂණය කර ඉහත වර්ග හතරට බෙදා දක්වන්න.

පියවර 06 පහත දැක්වෙන ව්‍යාවහාරික සංගීත භාණ්ඩවල නම් ඉදිරියෙන් අදාළ භාණ්ඩ වර්ගය ලියන්න.

1. ගිටාරය, 2. ඉංග්‍රීසි මැන්ඩලීනය3. සැක්සෆෝනය 4. කොංගෝ ඩ්‍රම්



ඇමුණුම 01

කාර්ය පත්‍රිකාව

ඉහත දක්වා ඇත්තේ කිසියම් පදනමක් අනුව වර්ග කරන ලද සංගීත භාණ්ඩ ලැයිස්තුවකි. එය හොඳින් නිරීක්ෂණය කර පහතින් දක්වා ඇති උපදෙස් අනුව වගුව පුරවන්න.

| හඬ නිපදවන ආකාරය | භාණ්ඩය | භාණ්ඩ වර්ගය | කාර්ය |
|---|---|---|---|
| අතින් පමණක් | | | |
| කෝටුවෙන් (කඩිප්පුවෙන්) පමණක් | | | |
| අතින් හා කෝටුවෙන් | | | |
| සුළඟේ ආධාරයෙන් | | | |
| තැලීමෙන් | | | |

පියවර 01- ඉහත 1 වගුවේ දක්වා ඇති සංගීත භාණ්ඩ 11 වගුවෙන් අදාළ ස්ථානය තෝරා ලියන්න.

පියවර 02 - පහත දක්වා ඇත්තේ දේශීය භාණ්ඩ නම්කර ඇති නාමයන්ය. ඒවා අදාළ කොටුවේ ලියන්න.

1. අතින් - ආතත 2. කෝටුවෙන් - විතත 3. විතතාත 4 ඝණ 5 සුෂිර

පියවර 04 - ඔබ විසින් ශ්‍රවණය කළ වාදනයෙන් හෝ ගීතයෙන් ලබාගත් භාණ්ඩ ලැයිස්තුවේ භාණ්ඩ මෙහි අදාළ ස්ථානයන්හි නොමැතිනම් ලියන්න.

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.1** : **ජන සංගීත ආශ්‍රයෙන් නිර්මාණය කළ ගීත විමසයි.**

**ක්‍රියාකාරකම 3.1.1** : **ජන ගී තනු ආශ්‍රිත සරල ගී ගයමු.**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- වික්ටර් රත්නායකගේ ' ආදරයේ උල්පත වූ අම්මා" ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටයක්
- ඇමුණුම 3.1.1.1 ට ඇතුළත් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත්
- ඇමුණුම අංක 3.1.1.2 ට අදාළ සරල ගී ලැයිස්තුවෙන් තෝරාගත් ගීතයක් ලියන ලද දෘෂ්‍ය උපකරණය
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පට, වයලීනය, කැසට් යන්ත්‍රයක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 3.1.1.1 -**

- 'ආදරයේ උල්පතවූ අම්මා' ගීතය ඇතුළත් ශ්‍රව්‍යපටය ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතයේ තනුව පිළිබඳ විමසන්න.
- නැවත ශ්‍රවණයට යොමු කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • සරල ගීතවල තනු නිර්මාණය සඳහා ජන සංගීතයේ ආභාෂය ලබා ඇති බව<br>• දරුනැලවිලි ගීයේ නාදමාලාව ආශ්‍රිතව ගීතයේ තනුව නිර්මාණය වී ඇති බව.<br>• ගීතයේ තේමාව හා තනුවේ ප්‍රසම්බන්ධයක් ඇති බව. |

(මිනිත්තු 30 යි)

**පියවර 3.1.1.2**

- ඇමුණුම අංක 3.1.1.3 ගීත ලැයිස්තුව ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇතුළත් ගීත වල කොටස් ගයමින් එම ගීත නිර්මාණයට පදනම් කරගත් ජනගීතද ගයා වයා පෙන්වන්න.
- එම ලැයිස්තුවෙන් පන්තියේ ගායනයට හුරු කිරීමට ගීතයක් තෝරා ගන්න.
- ගුරුවරයා ගීතය රසවත්ව ගායනය කරන්න.
- ගීතයේ සුවිශේෂී තැන් අවධාරණය කරමින් නාදමාලාව හා පදමාලාව තහවුරු වන තෙක් කොටස් වශයෙන් පුහුණු කරවන්න.
- සිසුන් සමග ගීතය කිහිපවාරයක් ගායනය කරන්න.

- එම ගීතයේ නිර්මාණයට පාදක වී ඇති ජන ගීය පිළිබඳ සාකච්ඡාවක් කරන්න. (ගායනය කර දක්වමින්)
- ගීතයේ සුවිශේෂී තැන් අවධාරණය කරමින් නාදමාලාව හා පදමාලාව තහවුරු වන සේ කොටස් වශයෙන් පුහුණු කරවන්න.
- සිසුන් සමග ගීතය කිහිපවාරයක් ගායනය කරන්න.
- එම ගීතයේ නිර්මාණයට දායක වී ඇති ජන ගීය පිළිබඳ සාකච්ඡාවක් කරන්න (ගායනය කර දක්වමින්)
- ගීතය සඳහා යොදා ගෙන ඇති තාලය පිළිබඳව අදහස් විමසන්න.
- සිසුන් කණ්ඩායම් කර ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබා දෙන්න.
- උපදෙස් පත්‍රිකාවේ ඇතුළත් තොරතුරු අනුව ක්‍රියාකාරකමේ යොදවන්න.
- අභ්‍යාස පොත්වල ගීත ලියා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 3.1.1.3**

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ම ඉදිරිපත් කරවන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වල ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල අදහස් ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • විවිධ ජන ගී , සරල ගීත, නිර්මාණය කිරීමේ දී යොදාගෙන ඇති බව<br>• එම ගීතවල සුවිශේෂී බව නිසා සාම්ප්‍රදාය වෙන් කර හඳුනා ගත හැකි බව |

(මිනිත්තු 80)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- ජන ගී ඇසුරෙන් නිර්මාණය වූ සරල ගීත නම් කරයි.
- සිංහලයාගේ අනන්‍යතාවය පෙන්වන මෙම ගීත නිර්මාණ කාර්යය සඳහා යොදා ගැනීම අගය කරයි.
- ජන ගී ඇසුරින් නිර්මාණය වූ සරල ගී ගායනය කරයි.
- ජන ගී ඇසුරෙන් සරල ගීත නිර්මාණය කිරීමට පෙලඹෙයි.
- එම ගීත පටිගත කරගෙන විවේක අවස්ථාවන්හි දී ශ්‍රවණය කරමින් රස විඳියි.

ඇමුණුම 3.1.1.2

**කාර්ය පත්‍රිකාව**

- ඔබ ගායනය සඳහා තෝරාගත් ගීතය නිර්මාණය කිරීම සඳහා දායක වූ ජනගීය හා එහි නාද රටා භාවිතය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
- සරල ගීත නිර්මාණය සඳහා ජන සංගීතයේ ආභාෂය ලැබී ඇති ගීත ලියා, එයට පාදක වී ඇති ජන ගී වර්ගවල නම් ලියන්න.
- ක්‍රියාකාරකම් අවසන් වූ පසු කණ්ඩායම් එක් වී පන්තියට ඉදිරිපත් කරන්න.
- සරල ගීතය හා අවශ්‍ය තොරතුරු අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.

ඇමුණුම 3.1.1.3

**අදාළ සරල ගී ලැයිස්තුව**

- දෑතට වලලු මල් මුතුවැල් මාල පොටයි - නීලා වික්‍රමසිංහ
- රෑ පැල් රකින කුරහන් පැහෙනා හේනේ - ත්‍යාගා එන්. එඩ්වඩ් සහ අබේවර්ධන බාලසූරිය
- රන්වන් කරල් සැලෙයි සන්සුන් කමින් බරව - ඩබ්ලිව්. ඩී. අමරදේව
- මල්සරා බැල්ම හෙලා - රෝහණ බැද්දගේ
- අක්කා නගාලගෙ බොලඳ සිනා - චන්ද්‍රානී ගුණවර්ධන
- දානෙට සීලෙට - සහන් රන්වල ඇතුළු පිරිස
- ජයසිරි මහ බෝධි- දයාරත්න රණතුංග

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.2** : **භාරතීය ගායන ශෛලීන් අගය කරයි.**

**ක්‍රියාකාරකම 3.2.1** : **භජන් ශෛලියේ විශේෂතා විමසමු. ගීත ගයමු.**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- පුදමු මේ කුසුම් (ආනන්ද සමරකෝන්, වී. පී. ලීලාවතී.
- රොනට වඩින බිගු ඔබයි.
- රඝුපති රාඝව රාජා රාම්' ගීතය ඇතුළත් දෘශ්‍ය උපකරණය
- ඇමුණුම අංක 01 ට අදාළ කියවීම් පත්‍රිකාව
- සර්පිනාව, තබ්ලාව, වයලීනය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** -

**පියවර 3.2.1.1** -

- ''පුදමු මේ කුසුම්" , " රොනට වඩින බිගු ඔබයි" මෙම ගීත ඇතුළත් ශ්‍රව්‍ය පටය ශ්‍රවණයට සලස්වන්න. නැතහොත් ගුරුවරයා රසවත්ව ගායනය කරන්න.
- මෙම ගීත දෙකින් සිසුන් දන්නා ගීතයක් ගායනා කිරීමට අවස්ථාව දෙන්න.
- ගීත පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • ආගමික භක්තිය ප්‍රකාශිත තේමාවන් රැගත් ගීත විශේෂයක් බව<br>• ගීත වර්ග දෙක බෞද්ධ භක්ති ගීතයක් හා කිතු බැති ගීයක් බව.<br>• විවිධ ආගම්වලට සම්බන්ධ, බැති ගී වර්ග කළ හැකි බව.<br>• දෙවියන් සඳහා ගැයූ භක්ති ගී භජන් නමින් හැඳින්වෙන බව. |

(මිනිත්තු 20 යි)

**පියවර 3.2.1.2**

- රඝුපති රාඝව ගීතය ලියන ලද දෘශ්‍යාධාර සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා විසින් ගීතය රසවත්ව ගායනය කරදක්වන්න.
- ගීපද පිළිබඳව සැලකිලිමත්ව ගායනය කරන්න.
- පියවරෙන් පියවර ගීතය ගැයීමට හුරු කළ පසු ස්වර ප්‍රස්තාරයද සරලව පුහුණු කරවන්න.
- කණ්ඩායම් වශයෙන් ගීතය ඉදිරිපත් කිරීමට මඟ පෙන්වන්න.

- ඇමුණුම 01 ට අදාළ කියවීම් පත්‍රිකාව බෙදා දී එහි ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න. පිළිතුරු ඇසුරෙන් සටහනක් ගොඩ නැඟීමට උපදෙස් දෙන්න.
- භජන් ගීතය අභ්‍යාස පොතේ ලියා ගැනීමට අවස්ථාව සලස්වන්න.

(මිනිත්තු 80 යි)

පියවර 3.2.1.3

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වල ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • භජන් යනු දෙවියන්ගේ ගුණ ගයන ගීත විශේෂයක් බව<br>• භක්තිය ප්‍රකාශ වන, සරල ශාස්ත්‍රීය ගායන ක්‍රමයක් බව<br>• ස්ථායි, අන්තරා ආකෘතියට නිර්මාණය වී ඇති බව.<br>• හින්දුස්ථානි සංගීතයේ ආභාෂය ලැබී ඇති බව.<br>• හින්දුස්ථානි රාග, තාල, මත ගීත ප්‍රබන්ධ වී ඇති බව. |

(මිනිත්තු 20 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- භජන් ගීත පිළිබඳව විස්තර ලියයි.
- භජන් ගීත ඉගෙනීමේ වටිනාකම අගය කරයි.
- භජන් ගීත ගායනය කරයි.
- භජන් ගීත විවිධ ප්‍රසංග, විවිධ උත්සව සඳහා ගායනය කරයි.
- භජන් ගීත එක්රැස්කර, පොත් පිංචක් සකස් කරයි.

**ඇමුණුම 01**

අංක 01 ට ඇතුළත් කියවීම පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න. අසා ඇති ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයන්න.

- සිසු අභ්‍යාස පොත් පිළිතුරු සැපයීමට භාවිත කරන්න.

**කියවීම් පත්‍රිකාව**

**භජන් ශෛලියේ විශේෂතා විමසමු.**

- දෙවියන්ගේ ගුණ ගැයීම සඳහා ගායනය කෙරෙන මෙම ගීත විශේෂයෙන් ප්‍රකාශ වන්නේ භක්ති රසයකි. වචනාර්ථයට මුල්තැන දෙන ගායන ශෛලියකි. උත්තර භාරතීය සංගීතයේ එන සරල ශාස්ත්‍රීය ගායන ක්‍රමයකි. කාෆී, භෛරවී, ඛමාජ්, පීළු, දේශ් වැනි සරල රාග ඇසුරු කරගෙන තනු නිර්මාණය කර ඇත. කෙහෙර්වා, දාදරා රූපක්, පංජාබි, ඛෙම්ටා යන තාලයන්මත ගීත ප්‍රබන්ධ වී ඇත. ගීතය ස්ථායි, අන්තරා යන ආකෘතියෙන් සමන්විත වේ. හින්දි භාෂාවෙන් රචනා වී ඇති මෙම ගීත සඳහා උත්තර භාරතයේ ප්‍රචලිත සංගීත භාණ්ඩ යොදාගනු ලැබේ. මීරා, තුල්සිදාස්, සූර්දාස්, ඛබීර් දාස් යන අය විසින් ඉන්දියානු භජන් ගී රාශියක් නිර්මාණය කර ඇත. ජයදේව විසින් රචිත ''ගීත ගෝවින්දය" නම් ග්‍රන්ථයේ ඇතුළත් කාව්‍ය ද භජන් ගී ලෙස ගයා ඇත. භාරතීයයන් අදහන සෑම දෙවිකෙනෙකු වෙනුවෙන්ම ගයන භජන් ගීත භාවිතයේ ඇත.

පහත දැක්වෙන ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සපයන්න.

- භජන් ගීත ගයන ලද්දේ කවුරුන් උදෙසා ද ?
- භජන් ගීතවලින් ප්‍රකාශවන්නේ කුමන රසයක් ද?
- භජන් ගීත රචනා වී ඇති ආකෘතිය නම් කරන්න.
- භජන් ගීතවල තනු නිර්මාණයට යොදා ගත් රාග දෙකක් නම් කරන්න.
- ඔබ ඉගෙනගත් භජන් ගීතයේ මුල් පාද දෙකේ වචන අදාළ තාලයට අනුව ප්‍රස්තාර කර දක්වන්න.
- භජන් ගීත පිළිබඳ කෙටි සටහනක් පිළියෙල කරන්න.

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.2** : **භාරතීය ගායන ශෛලීන් අගය කරයි.**

**ක්‍රියාකාරකම 3.2.2** : **කව්වාලි ශෛලියේ විශේෂතා විමසමු. ඒ ආභාසයෙන් නිර්මාණය වූ ශ්‍රී ලාංකික ගීත ගයමු.**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 02 සඳහන් පින්තූරය
- ඇමුණුම අංක 3.2.2.1 ට අදාළ ගීතය
- ඇමුණුම 3.32.1 ට ඇතුළත් දෙබස
- ඇමුණුම අංක 01 ට අදාළ කියවීම් පත්‍රිකාව
- සර්පිනාව, ඩෝලය, වයලීනය
- කැසට් යන්ත්‍රයක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 3.2.2.1 -**
- ඇමුණුම අංක 02 හි දැක්වෙන පින්තූරය ප්‍රදර්ශනය කරන්න. එහි මතුවන අදහස සාකච්ඡා කරන්න.

| |
|---|
| • පින්තූරයේ දැක්වෙන්නේ 'බජව්' යන අර්ථයෙන් දැක්වෙන ගායනයක් බව. |
| • විශේෂ ගීත මෙහි දී භාවිත කල හැකි බව. |
| • කව්වාලි ශෛලියේ සරල ගීත ද යොදාගත් බව |

(මිනිත්තු 15 යි)

**පියවර 3.2 .2.2**
- ඇමුණුම අංක 3.2.2.1 ට අදාළ ගීත වලින් කැමැති ගීතයක් ප්‍රදර්ශනය කරන්න.
- එම ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටය සිසුන්ට ශ්‍රවණය සලස්වන්න. නැතහොත් ගුරුවරයා ගයා පෙන්වන්න.
- සිසුන් සමග ගීතය පාදයෙන් පාදය ගායනය කරන්න.
- ගීතය තහවුරු වනතෙක් ගායනය කරවන්න.
- සිසුන් කණ්ඩායම් කර ඇමුණුම අංක 3.2.2.1 ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකාව බෙදා දෙන්න.
- ක්‍රියාකාර කමෙහි යොදවන්න.
- කණ්ඩායම් වශයෙන් ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.
- ඇමුණුම අංක (01) දෙබස බෙදා දී එහි ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

- කව්වාලි ගීත ශෛලිය ඇසුරු කරගෙන නිර්මාණය වූ ගීතය අභ්‍යාස පොතේ ලියා ගැනීමට අවස්ථාව සලස්වන්න.
- සැපයූ පිළිතුරු ද ඉදිරිපත් කිරීමට සලස්වන්න.

(මිනිත්තු 80 යි)

**පියවර 3.2.2.3**

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ම ඉදිරිපත් කරවන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වල ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල අදහස් ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • ආගමික නැඹුරුවක් ඇති ගීත විශේෂයක් බව. |
| • කව්වාලි ගායන ශෛලියේ සුවිශේෂ ලක්ෂණ ඇති බව. |
| • තාල සහිත හා රහිත කොටස් ඇති බව. |
| • හින්දුස්ථානී රාග, තාල, භාවිත කොට ඇති බව. |

(මිනිත්තු 15 යි)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- කව්වාලි ගායන ශෛලිය පිළිබඳ විස්තර ලියයි.
- මෙම ගායන ශෛලිය ඇසුරෙන් නිර්මාණ වූ ගීත අගය කරයි.
- එසේ නිර්මාණය වූ සරල ගීත ගායනය කරයි.
- විවිධ වැඩ සටහන් සඳහා මෙම ශෛලීයේ ගීත ගායනය කරයි.
- ගීත එක් රැස් කර, ශ්‍රව්‍ය පටයක් සකස් කරයි.

**ගුරුවරයාට උපදෙස් -**

- ඇමුණුම අංක 3.2.2.1 ට අදාළ ගීත
- ගමේ ගොඩේ සිදාදියේ කවුරුත් පාහේ
- කෝටු කැලි සොයාලා
- බුදුන්ගේ අමා ධර්මේ
- සුවදේ මට සීතල සුළඟ පවා.



'බජව්' නමැති සංගීතමය අවස්ථාවක්

ඇමුණුම 3.2.2.2

**ගවේෂණ උපදෙස් පත්‍රිකාව**

- ඇමුණුම අංක 01 ට ඇතුළත් 'දෙබස' හොඳින් අධ්‍යයනය කරන්න. අසා ඇති ප්‍රශ්නවලට, සිසු අභ්‍යාස පොතේ පිළිතුරු සපයන්න.

ඇමුණුම අංක 01

**පියල් සජිත්ට දුරකථන ඇමතුමක් දෙයි.**

පියල් - හලෝ ..... හලෝ ... මම මේ පියල්

සජිත් - ආ... කොහොමද ?

පියල් - සජිත් මං මේ ගත්තේ ඔයාට පණිවිඩයක් දෙන්න.

සජිත් - ආ .... මොකක්ද ?

පියල් - අද රෑ 10.00 ට රූපවාහිනියෙ සරල ශාස්ත්‍රීය වැඩ සටහනක් යනවා. 'කව්වාලි ගීත ශෛලිය ගැන අපිට ගුරුතුමිය කිව්වා මතකද ? මේ ගැන කරුණු හොයා ගෙන එන්න කියලා.

සජිත් - ආ ඔව්, මයි - එහෙනම් අපි දෙන්නා වැඩ සටහන බලලා කරුණු ටිකක් එකතු කර ගනිමු.

පියල් (රිසිවරය තබයි.)
(පසු දින පියල්ගේ ගෙදර දී දෙදෙනාම මුණ ගැසුණි. වැඩ සටහන නරඹා එක් රැස් කරගත් කරුණු මෙසේ ගොනු කර සටහන සකස් කර ගත්හ.)

පියල් - සජිත්, ඔයා එකතු කරගත්, කරුණු ටික කොහොම ද ? ඔන්න එහෙනම් මං කියන්නම්... මා හොයාගත්ත ටික. 'ක්වාල්' කියන වචනය මීට ඉස්සරවෙලා අහලා නෑ නේ ද ? ඒ වචනයෙන් තමයි කව්වාලි නම හැදිලා තියෙන්නෙ. මේ ගීත ගායනය කරලා තියෙන්නේ මුස්ලිම්වරු. නිර්මාණය කරල තියෙන්නේ අමීර් ඛුෂ්රු. ආගමික භක්තියෙන්, තමයි මේ ගීත විශේෂයෙන්ම ගයලා තියෙන්නෙ. මුස්ලිම්වරු අල්ලා දෙවියන්ට මේ ගීත ගැයුවේ.

සජිත් - ඔන්න එහෙනම් මාත් එකතු කරගත්ත ටික අහගන්නකෝ. ගීතය ආරම්භයේ හා අතරතුරේ තාලයෙන් තොරව ගයන ගීත කොටස් ඇතුළත් වෙනවා. ඒ කොටසට 'දොහොරා' කියලා කියනවා. සාමූහිකව ගීත ගායනය කරනවා. ඒ වගේම කණ්ඩායමේ නායකයා ගයන ගීත කොටස් අත්වැල් ගායනය මගින් ඉදිරිපත් කිරීම සිදුවෙනවා.

පියල් ඊට අමතරව විස්තර කළ කොටස් මං ලියාගත්තා.

- ඉහළ ශ්‍රැතියකින් විවෘත කඩහඬකින් ගීත ගැයෙන බව.

- ස්ථායි, අන්තරා. ආකෘතිය ඇති බව.
- සර්පිනාව, ඩෝලය, භාවිත කරන බව
- අඩු ලයකින් ආරම්භ වී අවසානයේ ලය වැඩිවන බව.
- උර්දු, පර්සි, භාෂාවලින් ගීත රචනා වී තිබෙන බව.

සජිත් - පියල් මේ ගායන ශෛලියේ විශේෂ ලක්ෂණ කිව්වට පස්සේ ඒ වැඩ සටහනේ ? ලස්සන කව්වාලි ගීතවගයක් ප්‍රචාරය වුනා. මං ඒක ටේප් කර ගත්තා.

! හමේතො ලුට්ලියා - මිල්කෙ හොනසු වාලෝකේ
කලෙ කලෙ බාලෝනේ - ගොර ගොර ගාලෝනේ
! මෙමෙ ජිස්කී තාලෂ මෙමෙ නිකලා

මං ඒ මුල් කොටස ගයලා පෙන්නන් න ද ?

පියල් - හරි ලස්සනයි. ඉතුරු ටිකත් ගයන්නකො.
අපි පස්සේ වෙලාවක කැසට් පටය දාලා ගයමු.

සජිත් - මේ ගීතවලට වාදනය කරන්නේ බෙම්ටො කෙහෙර්වා, දීප්චන්දි වගේ තාල. දේශ්, ඛමාජ්, පීළු. භෛරවී, සාරංග වගේ සරල රාගද, යොදා ගන්නා ආකාරය පැහැදිලි කළා ඉන්දියාවේ සිටින දක්ෂ කව්වාලි ගායකයෙක් ගැනත් සඳහන් කළා. 'අසීස් කව්වාල්" කියලා.

පියල් - ආ .... තව දෙයක් කිව්වා.
මේ ගීත ශෛලියට අනුව නිර්මාණය කළ සිංහල ගීත ගයන අල්හාජ් මොහිදීන් බෙග් කියලා ගායකයෙන් ගැන.
මෙතුමා ඉන්දියාවෙන් පැමිණි ශ්‍රී ලංකාවේ ජීවත් වු ගායකයෙක් කියලා විස්තර කළා.

සජිත් - මම ඒ ටික ලියා ගත්තා. එම ගායකයා ගැයූ ගීත කිහිපයක් නම් කළා. ඉන් ගීත දෙකක් රූපවාහිනි වැඩසටහනකත් ප්‍රචාරය කළා.
- සුවදේ මට සීතල සුළඟ පවා
- මංගලම් ජය මංගලම්
මේ ගායකයා ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසයේ අමරණීය නමක් සටහන් කළ බවත් අද එතුමා ජීවතුන් අතර නොමැති බවත් සාකච්ඡාවේ දී කිව්වා.

පියල් දැන් අපි දෙන්නා ලඟ හුඟාක් තොරතුරු තියෙනවා. හෙට ඉස්කෝලේ සංගීත පාඩමේ දී අපි දෙන්නා එකතු කරගත් කරුණු ටික කියමු. එතකොට ගුරුතුමිය ගොඩක් සතුටුවේවි අපි මේවා ඉගෙන ගන්න දක්වන උනන්දුව ගැන දැකලා.

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. කව්වාලි ගායනා ශෛලීයේ නිර්මාතෘ වරයා නම් කරන්න.
2. කව්වාලි ගායන ශෛලීයේ කුමන ජාතියකගේ අනන්‍ය ශෛලියක් ද?
3. කව්වාලි ගීතවල තාල රහිත හා සහිත කොටස් ඇතුළත් වේ. එම කොටස නම් කරන්නේ කුමන නමකින් ද?
4. මෙම ගීත ශෛලීයේ විශේෂ ලක්ෂණ පහක් ලියන්න.
5. කව්වාලි ගායන ශෛලිය අනුගමනය කරමින් ගීත නිර්මාණය කර සිංහල ගීත ගැයූ වඩාත් ප්‍රචලිත ගායකයා නම් කරන්න. එම ගායකයා ගයන ලද ගීත දෙකක මුල් පාද ලියන්න.
6. කව්වාලි ගීත නිර්මාණයට ඇසුරු කළ රාග දෙකක් හා තාල දෙකක් ලියන්න.

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.3** : **දේශාභිමානි ගීත අගය කරයි.**

**ක්‍රියාකාරකම 3.2.2** : **දේශාභිමානී ගීත ගයමු.**

**කාලය** : කාලච්ඡේද 04 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01 ට අයත් දේශාභිමානී ගීත ලැයිස්තුව
- කැසට් යන්ත්‍රයක්
- සංගීත භාණ්ඩ

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 3.3.3.1 -**
- ඇමුණුම අංක 01 ට අයත් ගීත ලැයිස්තුවෙන් කැමති ගීතයක් ගායනයට කැමැත්තෙන් ඉදිරිපත් වන සිසුවකුට අවස්ථාව දෙන්න.
- ඉන් මතුවන අදහස සාකච්ඡා කරන්න.

- තමාගේ රට, ජාතිය, ආගම ගැන හැඟීමක්, අභිමානයක් මෙම ගී තුළින් හදවතට දැනෙන බව.
- උදාර හැඟීම් දැනවීමට හා අපගේ වීරත්වය , අභිමානය, පෞඪත්වය කියා පෑමට මෙම ගීත යොදාගෙන ඇති බව.
- රට ජාතියට තව තවත් ආදරය කළ යුතු ය යන හැඟීම දනවන බව.

(මිනිත්තු 30 යි)

**පියවර 3.3.1.2**
- ඇමුණුම අංක 01 ට අයත් ගීත ලැයිස්තුවෙන් කැමති ගීත දෙකක් ලියන ලද දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- එම ගීත ඇතුළත් ශ්‍රව්‍ය පටය සිසුන්ට ශ්‍රවණය සලස්වන්න. නැතහොත් ගුරුවරයා ගයා පෙන්වන්න.
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කර එම දේශාභිමානි ගී තුළින් ප්‍රකාශිත අදහස සරල බසින් ලිවීමට උපදෙස් දෙන්න.

(මිනීත්තු 80 යි)

**පියවර 3.3.1.3**
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ම ඉදිරිපත් කරවන්න.
- පුහුණු වූ දේශාභිමානි ගීතය කණ්ඩායමක් ලෙස ඉදිරිපත් කරන්න.
- තනි තනිව ගැයීමට ඉදිරිපත් වන සිසුනට අවස්ථාව ලබා දෙන්න.
- ගී තනුවේ නිවැරදි කළයුතු තැන් වෙතොත් විශේෂයෙන් අවධානයට ලක් කරමින් තනුව නිවැරදි කරන්න.

- හදවතට දැනෙන රිද්මයකින් මෙම ගීත ගයා ඇති බව.
- එම ගී තනු බොහෝ විට ආචාරපෙළපාළි සඳහා ද තූර්ය වාදන කණ්ඩායම්වල වාදනය කරන බව.
- ජාත්‍යාලය ප්‍රකාශිත දේශාභිමානි ගීත ඊට උචිත ලය පිළිබඳ අවධානයෙන් ගැයිය යුතු බව.
- දේශීය තූර්ය වාදන භාණ්ඩ යොදාගෙන ඇති අතර තම්මැට්ටම ට්‍රම්පට් හා සයිඩ් ඩ්‍රම්, විශේෂයෙන් මෙම ගීතවලට යොදාගෙන ඇති බව
- 4/4, 7/8, රිද්ම රටා විශේෂයෙන් යොදා ගෙන ඇති බව.

(මිනිත්තු 70 යි)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- දේශාභිමානි ගී පිළිබඳ විස්තර ලියයි.
- එම ගීත නිර්මාණ නම් කරමින් අගය කරයි.
- ජාතික හැඟීමෙන් යුතුව දේශභිමානි ගීත ගයයි.
- විවිධ සංස්කෘතික වැඩසටහන්වල දී දේශාභිමානි ගී ගැයීමට පෙළඹෙයි
- දේශාභිමානි ගී සංරක්ෂණය කිරීමට යෝජනා කරයි.

**ඇමුණුම අංක 01**

**දේශාභිමානි ගීත ලැයිස්තුව**

- රත්නදීප ජන්ම භූමි, නිවහල් සිතුවිලි සිතනා - ආචාර්ය පණ්ඩිත් අමරදේව
  පෙම්බර මා පුතුණුවනේ , සසර වසනතුරු - ආචාර්ය පණ්ඩිත් අමරදේව
- පෙරදිග මුතු ඇටයයි මේ - ලතා වල්පොල
- මේ සිංහල අපගෙ රටයි , තුන් හෙලේ කැලෑ තුළ - නන්දා මාලනී
- ලංකා ලංකා පෙම්බර ලංකා, දකුණ නැගෙනහිර - සුනිල් ශාන්ත
- මේ උදාර ලංක භූමියයි - අමිතා වැදිසිංහ
- ශ්‍රී ලංකා මා ප්‍රියාදර ජය භූමී - ලතා මංගේෂ්කාර්
- රන් මලක් ලෙස - සුනිල් එදිරිසිංහ
- රණ බිම මැරුණේ සිංහලයකු නම් - චන්ද්‍රිකා සිරිවර්ධන
- ජන මන නයන වශීකර ලංකා - ජී.එස්. බී. රාණි පෙරේරා
- මේ රට මගෙ රට - මාලනී බුලත්සිංහල
- අපි ඔක්කොම රජවරු - වික්ටර් රත්නායක
- ලෝකෙන් උතුම් රට - සාමූහික
- ඉඳුනිල් ගඟුලැල් - රූකාන්ත ගුණතිලක
- මගේ රටට දළදා හිමි සරණයි - මහාචාර්ය සනත් නන්දසිරි
- ශ්‍රීනි විභූශිත ලංකා බැබලේ - ලතා වල්පොළ
- උපන්නේ පුතෙක් වී , නිදහස් ගසේ ජාතික මල්
- නිදහස මහ මුහුදක් වේ, සිරිකත මිණි විජිණිපතින් , - සුදත් සමරසිංහ
  බලව් පොළොන්නරු
- වෙර වීරිය ඇතත් සිතේ - එඩ්වඩ් ජයකොඩි
- හෙළ ජාතික අභිමානේ - සී. ටී. ප්‍රනාන්දු



-

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතයේ පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : **කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.**

**ක්‍රියාකාරකම 4.1.1** : **කෙතේ මහිම දකිමු. ගොයම් ගී ගයමු.**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01 ට අදාළ "ගමක අසිරිය" දනවන චිත්‍රයක්
- ඇමුණුම අංක 02 ට අයත් ගොයම් ගී ලැයිස්තුව.
- ලැයිස්තුවට අදාළ ගී වලින් කැමති ගොයම් ගී 2 ක් ලියු දෘශ්‍යාධාරක
- ඇමුණුම අංක 03 ට අදාළ කාර්ය පත්‍රිකාව.
- සර්පිනාව, ගැටබෙරයක්, තාලම්පට, බටනලාව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** -

**පියවර 4.1.1.1**
- "ගමක අසිරිය" පිළිබඳව අඳින ලද චිත්‍රය ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳ අදහස් දැක්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - කෘෂිකාර්මික පරිසරයක් පිළිබිඹු කෙරෙන දර්ශනයක් බව.
    - සරුසාර බවින් යුතු කුඹුරු යායක් දර්ශනය වන බව.
    - ගොයම කරලින් බරවී, ඇති අවස්ථාවක් දක්නට ඇති බව.
    - ගොයම් කැපීමේ දී ගීත ගායනා කරන බව.

(මිනිත්තු 20 යි)

**පියවර 4.1.1.2**
- ඇමුණුම අංක 01 ට අදාළ ගීත ලැයිස්තුවෙන් ගුරුවරයාට කැමති ගීත දෙකක් තෝරා ගන්න.
- ගීතය සිසුන්ට ශ්‍රවණය සඳහා රසවත්ව ගායනය කරන්න.
- පාදයෙන් පාදය ගායනය කරවන්න.
- උචිත තිතට තාල තබමින් ගායනය කරවන්න.
- ගොයම් ගීවල තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පදමාලාව, නාදමාලාව, හා සුවිශේෂී ලක්‍ෂණ පිළිබඳව සාකච්ජාවක් මෙහෙයවන්න.
- 2 වන ගීතය ද, ප්‍රදර්ශනය කර ඉහත ආකායටම පුහුණු කරවන්න.
- සිසුන් කණ්ඩායම් කර කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමේ යොදවන්න.

(මිනීත්තු 60 යි)

**පියවර 4.1.1.3**

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ම ඉදිරිපත් කරවන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වල ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

  - ගොයම් ගී, ගොයම් කැපීමේ දී ගයන ගීත විශේෂයක් බව.
  - සාමුහික බව දනවන ගීත විශේෂයක් බව.
  - සරල නාද වලින් යුතු බව.
  - ආඝාතාත්මක ගීත විශේෂයක් බව.
  - මෙහෙ ගී විශේෂයක් බව.

(මිනිත්තු 20 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- ගොයම් ගීත පිළිබඳ විස්තරයක් කරයි.
- දේශීය අනන්‍යතාවය පැහැදිලි කෙරෙන මෙම ගීතවල වටිනාකම අගය කරයි.
- ගොයම් ගීත ගායනය කරයි.
- ගොයම් ගීත හා නාදමාලා සංරක්ෂණය කර තබා ගැනීමට අවශ්‍ය බව යෝජනා කරයි.
- උත්සව අවස්ථාවන්හි දී ප්‍රසාංගිකව ගොයම් ගීත ගායනය කරයි.



ගමක අසිරිය

ගමක අසිරිය

ඇමුණුම 02

**ගීත ලැයිස්තුව**

- රන් දෑ කැති ගෙන නිති සැරසෙනවා
  රත්රන් පටි ඉනවට දිලිසෙනවා
  රිවිඳුටු පිණිබිඳු ලෙස පහවෙනවා
  දුම්බර කෙතෙ අපි ගොයම් කපනවා

- උදයට පායන හිරු දෙවියන්ටයි
  සවසට පායන සඳ දෙවියන්ටයි
  සතරවරම් දෙවි සතර දෙනාටයි
  වැඳලා ගුරුවර අවසර ගන්ටයි

- කුජ දින ඉරුදින ගොයම් කපන්නේ
  තිසරණ සිහිකර වෙලට බසින්නේ
  සැම දෙවියන්ගෙන් අවසර ගන්නේ
  කුඹුරේ දිගටම පේළි සැදෙන්නේ

- රිදියෙන් තනලා රත්රන් ඔපලා කැරලි කෙටුවයි දැකැත්තේ
  සුරතට රන්වන් විලි පාහාලා කදිමට දිලිසෙයි දැකැත්තේ
  අඩියෙන් අඩියට තාල කියන්නට සබයෙන් අවසර ලැබ ගත්තේ
  සතරවරම් දෙවියන්ගේ බලයෙන් ගොයම් කපමු අපි දැකැත්තේ

මෙම ගීතවලින් ගුරුවයාට කැමති ගීත දෙකක් ගායනය කරවන්න.

ඇමුණුම 03

**කාර්ය පත්‍රිකාව**

- ඔබ ඉගෙනගත් ගොයම් ගීත දෙකකට අදාළ තොරතුරු පහත දැක්වෙන වගුවේ ලියා දක්වන්න.

| ඉගෙනගත් ගීත දෙක | පදමාලාව | නාදමාලාව | තිත නම් කිරීම | තිත අනුව මාත්‍රා බෙදෙන ආකාරය | සුවිශේෂ ලක්ෂණ |
|---|---|---|---|---|---|
| 1 ගීතය | | | | | |
| 2 ගීතය | | | | | |

- ක්‍රියාකාරකම අවසන් වූ පසු කණ්ඩායම එක්වී පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතයේ පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : **කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.**

**ක්‍රියාකාරකම 4.1.2** : **නෙලුම් ගීත ගයමු. තොරතුරු විමසමු.**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- "දැතට වළලු මල් මුතුවැල් මාල පොටයි" ගීතය ලියූ දෘශ්‍යාධාරයක්.
- ඇමුණුම අංක 01 ට අයත් නෙලුම් ගීත ලැයිස්තුව
- ලැයිස්තුවට අදාළ ගී වලින් කැමති නෙලුම් ගී 2 ක් ලියූ දෘශ්‍යාධාරක
- ඇමුණුම අංක 02 ට අදාළ කාර්ය පත්‍රිකා.
- සර්පිනාව, ගැටබෙරයක්, තාලම්පට, බටනලාව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 4.1.2.1**

- "දැතට වළලු " ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගීතය දන්නා සිසුන්ට ගායනයට අවස්ථාව සැලසීම
- සිසු අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - ජන ගී ඇසුරෙන් නිර්මාණය වූ ගීතයක් බව.
  - තේමාව නෙලුම ආශ්‍රිත වී ඇති බව.
  - නෙලුමට සහභාගීවන ළඳුන්ගේ ලාලිත්‍යය ගී පදමාලාවෙන් වර්ණනා කර ඇති බව.

(මිනිත්තු 15 යි)

**පියවර 4.1.2.2**

- ඇමුණුම අංක 01 ට අදාළ ගීත ලැයිස්තුවෙන් ගුරුවරයාට කැමති ගීත දෙකින් එකක් ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගීතය සිසුන්ට ශ්‍රවණය කිරීමට කිහිපවාරයක් ගායනය කරන්න.
- පාදයෙන් පාදය ගායනය කරවන්න.
- උචිත තාලයකට තාල තබමින් ගායනය කරවන්න.
- නෙලුම් ගී හා සම්බන්ධ තොරතුරු සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පදමාලාව, නාදමාලාව, හා සුවිශේෂී ලක්ෂණ පිළිබඳව සාකච්ජාවක් මෙහෙයවන්න.
- 2 වන ගීතය ද, ප්‍රදර්ශනය කර ඉහත ආකාරයටම පුහුණු කරවන්න.
- සිසුන් කණ්ඩායම් කර කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමේ යොදවන්න.

(මිනීත්තු 45 යි)

පියවර 4.1.2.3

- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ම ඉදිරිපත් කිරීමට අවසථාව ලබාදෙන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වල ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • ගොයම් නෙලීමේ දී ගායනය කරන ගීත විශේෂයක් බව.<br>• නෙළුමේ දී කාන්තාවන්ට සුවිශේෂ ස්ථානයක් හිමිවන බව.<br>• අඩු ලයකින් ගීත ගායනය කරන බව.<br>• පටු ස්වර ක්ෂේත්‍රයක් යෙදෙන බව.<br>• සාමූහිකත්වය දනවන ගීත විශේෂයක් බව.<br>• මෙහෙ ගී විශේෂයක් බව. |

(මිනිත්තු 20 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- නෙලුම් ගීත පිළිබඳ විස්තර කරයි.
- නෙලුම් ගීත ගායනයට හුරුවීමේ වටිනාකම අගය කරයි.
- නෙලුම් ගීත ගායනය කරයි.
- විවිධ ප්‍රසංග සඳහා මෙම ගීත ප්‍රසාංගිකව යොදා ගනියි.
- නෙලුම් ගීත එක් රැස්කර පොත් පිංචක් සකස් කරයි.

ඇමුණුම 01

**ගීත ලැයිස්තුව**

- තෙල්ගාලා හිස පීරන් නැනෝ
  ඇටවැල අරගෙන බැඳගන් නැනෝ
  සේලේ ඉනවට ඇඳගන් නැනෝ
  ගොයම් නෙලන්නට යමු අපි නැනෝ

ගායිකාව - ඉපල් පිටින් ගහන අව්ව - පිටට ඉහිරවන්නේ
පිරිස - තෙතඟු තෙතරි යේ රිඟුතරි - ඒක එහෙම වන්නේ
ගායිකාව - රණ කැකිරක් කාපු ලෙසට කටට මිහිර වන්නේ
පිරිස - තෙතඟු තෙතරියේ රිඟුතරි - ඒක එහෙම වන්නේ
ගායිකාව - නිල් හබරල ගොයම් ලෙසට - ගොයම් නිල්ල වන්නේ
පිරිස - තෙතඟු තෙතරියේ රිඟුතරි - ඒක එහෙම වන්නේ
ගායිකාව - මේ කුඹුරේ නෙළු කළට - ගොයම් රෝග යන්නේ
පිරිස - තෙතඟු තෙතරි යේ රිඟුතරි - ඒක එහෙම වන්නේ

බෝගම්බර අපි නෙළුමට යනකොට
තිස් දෙන්නෙක් නෙළතෙයි  තාලම්
තිස් දෙන්නෙක් නෙලුවාට කුමක්දැයි
සුහුරු ලියක් නෙල තෙයි තාලම්
සුහුරු ලියේ නුඹෙ ගණරන් කුඹුදෙක
ලමැද පුරා නටතෙයි තාලම්
බෝගම්බර සිටි සුහුරු කිඩෑ කෙළි
සැම දෙවියෝ  රකි තෙයි තාලම්

යන ගීතවලින් ගුරුවරයා කැමති ගීත දෙකක් තෝරා ගත හැක.

**ඇමුණුම 02**

**කාර්ය පත්‍රිකාව**

- ඔබ ඉගෙන ගත් නෙලුම් ගීත දෙකට අදාළ තොරතුරු ගොනු කරන්න.
- ගීතවල පදමාලා
- නාදමාලා
- තිත්
- සංගීත භාණ්ඩ
- විශේෂ ලක්ෂණ
- ඉහත සඳහන් තොරතුරු ආශ්‍රයෙන් කථාව ඉදිරිපත් කළ යුතු ය.
- ක්‍රියාකාරකම අවසන් වූ පසු කණ්ඩායම එක්වී පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ ඇසුරෙන් අභ්‍යාස පොතේ සටහනක් ගොඩ නගන්න.

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතයේ පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : **කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.**

**ක්‍රියාකාරකම 4.1.3.** : **කමතේ සිරි විමසමු. ගීත ගයමු.**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01ට අයත් දෘශ්‍යාධාරය
- ඇමුණුම අංක 02ට අයත් ගීත ලැයිස්තුව
- ඇමුණුම අංක 03ට අදාළ කාර්ය පත්‍රිකා.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 4.1.3.1**
- ඇමුණුම අංක 01 ට අදාළ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇතුළත් වචන පිළිබඳ අදහස් දැක්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - කමත හා සම්බන්ධ සුවිශේෂ වූ භාෂාවක් ඇති බව.
  - කමතෙහි ගොයම් පෑගීමේදී එම වචන භාවිත කරන බව.
  - ගොයම් පෑගීමේදී ගැමියන් ගීත ගයන බව.

(මිනිත්තු 10 යි)

**පියවර 4.1.3.2**
- ඇමුණුම අංක 02 ට අදාළ ගීත ලැයිස්තුවෙන් ගුරුවරයාට කැමති ගීත දෙක වෙන වෙනම ලියා දෘශ්‍යාධාරය සකස් කරගන්න.
- ඉන් එක් ගීතයක් ලියූ දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ගීතය සිසුන්ට ශ්‍රවණය සඳහා කිහිපවරක් රසවත්ව ගායනය කරන්න.
- පාදයෙන් පාදය ගායනය කරවන්න.
- තාල තබමින් ගායනය කරවන්න.
- පදමාලාව, නාදමාලව, රිද්මය, භාෂාව හා විශේෂ ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.
- අංක 02 ගීතයද ප්‍රදර්ශනය කර ඉහත ආකාරයටම පුහුණු කරවන්න.
- සිසුන් කණ්ඩායම් කර කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමේ යොදවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 4.1.3.3**
- කණ්ඩායම් වශයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- සෙසු කණ්ඩායම්වල අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- සදොස් තැන් නිදොස් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- ගොයම් පැගීමේදී කමත් ගීත ගයන බව.
- අම්බරුවන් යොදාගෙන, රාත්‍රිකාලයේදී ගොයම් පාගන බව.
- කඩිනම් ලයකින් ගීත ගයන බව.
- සාමුහික බව දනවන ගීත විශේෂයක් බව.
- කමතට ආවේණික වූ භාෂාවක් යෙදෙන බව.
- පිරිමින් පමණක් සහභාගිවීම සුවිශේෂී ලක්ෂණයක් බව.
- අඩහැර පෑම කමතේ දී විශේෂයෙන් සිදුවන්නක් බව.

(මිනිත්තු 20 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- කමත් ගී පිළිබඳ විස්තරයක් කරයි.
- කමත් ගී ගැයීමේ වටිනාකම අගය කරයි.
- කමත් ගී ගායනය කරයි.
- මතුපරපුරට දායාද කිරීම සඳහා කමත් ගීත එක්රැස් කරයි.
- විවිධ නිර්මාණ කාර්යයන්හි යෙදෙයි.

**ඇමුණුම 01**

**යටින් ඉරි ඇඳි පදවල තේරුම කියන්න.**

1. ඔය අම්බරුවන් පස්දෙනා, එක කැරැල්ලකට බඳිමු.
2. අද අපි කොළ මඩින්ට එන්නං හැන්දෑ ජාමෙ.
3. බැත යතුර ට දමල පොළා ගමු ගොම්මනට කළින්
4. අම්බරුවන් ගෙ ගොම්පස් හොඳ පොහොරක් නොවැ.
5. ඔය බෝල අත්ත අරන් මැඩුවන් ටික එකතු කරමු හනිකට.
6. කොළමැඩුවට පස්සේ බැත මලුවලට පුරවමු.

**ඇමුණුම 02**

**ගීත ලැයිස්තුව**

- ඉහළ වෙලේ තියෙන බැතා
  පහළ වෙලේ තියෙන බැතා
  අටු කොටුවල තියෙන බැතා
  ගෙන පුරවන් මේ කමතා

- ඉරු දෙවියන් වැඩිය තැනේ
  බොල් පිණි නොතිබෙයි එතැනේ
  සඳ දෙවියෝ වැඩිය තැනේ
  කරුවල නොතිබෙයි එතැනේ

මහගජතුන් බැන්ද තැනේ
කණුමුල් නොතිබෙයි එතැනේ
සැම දෙවියෝ වැඩිය තැනේ
උවදුරු නොතිබෙයි එතැනේ

- මේ කාගේදෝ කමතා
  ඉරු දෙවියන්ගේ කමතා
  මේ කාගේදෝ කමතා
  සඳ දෙවියන්ගේ කමතා
  මේ කාගේ දෝ කමතා
  ගණ දෙවියන්ගේ කමතා
  මේ කාගේදෝ කමතා
  කඳ කුමරුන්ගේ කමතා
  ඔයිරයිරේ - ඔයිරාම
  කොළ මැඩපන් - ඔයිරාමා

ඇමුණුම 03

**කාර්ය පත්‍රිකාව**

- කමත් ගීවල භාෂාව, තනුව, රිද්මය හා විශේෂ ලක්ෂණ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.
- ඔබ කණ්ඩායම විසින් ඉදිරිපත් කළ අදහස් රචනයක් ලෙස අභ්‍යාස පොතේ ලියන්න.

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතයේ පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : **කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.**

**ක්‍රියාකාරකම 4.1.4** : **ගැමිගීයේ ලක්ෂණ සොයා බලමු.**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01 යටතේ i හා ii වශයෙන් ගැමිගීයක් හා සේ ගීයක් ලියන ලද දෘශ්‍යාධාර දෙකක්.
- කාර්ය පත්‍රිකා පිටපත්

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** -

**පියවර 4.1.4.1**
- ගැමි ගීය හා සේ ගීය ලියන ලද දෘශ්‍යාධාර දෙක සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- මෙම ගීත අතර වෙනස්කම්, සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- අංක 1 යටතේ දක්වා ඇති ගැමිගීවලට අදාළ වෙනත් ගීත සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - භාෂාව, අදහස, සරලව තේරුම් ගත හැකි බව
> - භාෂාව අදහස සංකීර්ණ වූ, ගීතද ඇති බව.
> - රිද්මය හා තනුව පිළිබඳව අවබෝධයක් ලැබිය හැකි බව.
> - ගැමි ගීවලට අදාළ වෙනත් ගීත නම් කළ හැකි බව.
>
> (මිනිත්තු 10 යි)

**පියවර 4.1.4.2**
- සිසුන් කණ්ඩායම් කර කාර්ය පත්‍රිකා බෙදා දෙන්න.
- එම කාර්ය පත්‍රිකාවට අනුව ක්‍රියාකාරකමේ යෙදීමට සිසුන්ට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 4.1.4.3**
- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වලට ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- විවිධ කාර්යයන්හි නිරතවීමේ දී ගැමියන් මෙම ගීත ගයා ඇති බව.
- දේශීය සංස්කෘතියේ අනන්‍යතාවය පෙන්වන ගීත විශේෂයක් බව.
- ගැමි ගීවලට සුවිශේෂ ලක්ෂණ ඇතුළත් වන බව.
- ගැමි ගී නිර්මාණයට හේතු සාධක පාදක වී ඇති බව.

(මිනිත්තු 10 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- ගැමි ගීයේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ගැමි ගී වර්ග කර දැක්වීමට යෝජනා කරයි.
- වර්ග කළ ගැමි ගීත ගායනය කරයි.
- ගැමි ගීවල ලක්ෂණ සොයා බලයි.
- එම ලක්ෂණ වෙනත් ගැමි ගීවල තිබේදැයි සංසන්දනය කර බලයි.

**ඇමුණුම 01**

| අංක i | අංක ii |
|---|---|
| ගැමි ගී<br>• වෙල්යායක ගොන්<br>දෙදෙනෙක් කකා උනී | සේ ගී<br>• චිත්‍රපත්‍ර මිත්‍ර ගෝත්‍ර<br>අග්‍ර පූජිතා<br>සුප චිත්‍ර කොඳ<br>අෂ්ඨ ගාත්‍ර<br>සාමරංජිතා |

**ඇමුණුම 02**

**කාර්ය පත්‍රිකාව**

- අංක i හා ii වශයෙන් ඉදිරිපත් කළ ගී දෙක අතර වෙනස්කම් දක්වන්න.
  1. ..................................................................................................................
  2 ..................................................................................................................
  3 ..................................................................................................................
  4 ..................................................................................................................

- බුද්ධං සරණේ සිරස දරාගෙන ......................................................
- තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා..........................................
- අහසට පිඹිනා එරන් කළේ යා
- නුඹෙ අම්මා කිරට ගියා ......................................................

- ඉහත ගීත තුන රැකියා , ආගමික නැඹුරුව හා සමාජ අවශ්‍යතා යන කරුණු තුන මත බෙදා දක්වන්න. මෙම කරුණු තුන පහත දැක්වෙන, ගැමි ගී නිර්මාණයට පාදක වූ හේතු සාධකවලට බෙදා දක්වන්න.
    - වෘත්තීන් මත ගොඩනැගුණ ගී
    - ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණ ගී
    - විනෝදාස්වාදය හා සමාජ අවශ්‍යතා මත ගොඩනැගුණ ගී

- මෙම හේතු සාධක තුන - මෙහෙ ගී
  - ඇදහිලි ගී
  - සමාජ ගී වශයෙන් වර්ග කර දක්වන්න.

- මෙම ගී වර්ග තුනට උදාහරණ දෙක බැගින් ලියන්න.
- ගුරුතුමියගේ උදව් ලබාගෙන ගීතවලට උදාහරණ ලියන්න.
- ක්‍රියාකාරකම අවසානයේ ගැමි ගී පිළිබඳ ගැලීම් සටහනක් පිළියෙල කරන්න.

- පහත දැක්වෙන ගැමි ගී වලට විශේෂ ලක්ෂණ කියවන්න.
    - භාෂාව සරලය.
    - ගීතවල ඒකාකාරී බවක් ඇත.
    - නිර්මාණකරුවෙකු නොමැත. (කතෘ අඥාතයි)
    - මුඛපරම්පරාවෙන් පැවත එන ගීත විශේෂයකි.
    - අව්‍යාජ බව මේ ගීවලින් මනාව පිළිබිඹුවේ.
    - ස්වර ක්ෂෙත්‍රය පටුය.
    - සිව්පද පිරිතට ගායනය කර ඇත.
    - ගැමි අත්දැකීම් හා සිතිවිලි ගීතයන්ට තේමාව වී ඇත.
    - ඉහළ ස්වරයෙන් ගීත ගායනය කර ඇත.

**ගුරු උපදෙස්**

- කාර්ය පත්‍රිකාවට අනුව ක්‍රියාකාරකමේ නිරත වූ පසු සිසුන් සකස් කරනු ලබන ගැලීම් සටහන ගුරුවරයාගේ පහසුවට ඇතුළත් කර ඇත.

**ගැමි ගී**

- වෘත්තීන්මත ගොඩනැගුණ ගී
  - මෙහෙ ගී
    - ගැල්
    - පැල්
    - පාරු
    - පතල්
    - බමර
- ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණ ගී
  - ඇදහිලි ගී
    - ශාන්ති කර්ම ගී
      - උඩරට
      - පහත රට
      - සබරගමු
      - තුන් සරණේ ගී
- විනෝදාස්වාදය හා සමාජ අවශ්‍යතා මත ගොඩ නැගුණ ගී
  - සමාජ ගී
    - එළුවන් කෑම
    - රබන් ගී
    - ලී කෙළි
    - සවරන්
    - කළගෙඩි මාලය
    - පොරපොල් ගැසීම
    - දරු නැළවිලි ගී
    - මේවර කෙළිය
    - ඔළිඳ කෙළිය

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.2** : **දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩවල විශේෂතා සාකච්ඡා කරමින් අගය කරයි.**

**ක්‍රියාකාරකම 4.2.1** : **දේශීය අවනද්ධ භාණ්ඩවල විශේෂතා සොයා බලමු.**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- පෙරදිග තූර්ය වාදක කණ්ඩායමක් ඇතුළත් චිත්‍රයක්
- ඇමුණුම අංක 01, අංක 02, අංක 03, අංක 04 වශයෙන් දැක්වෙන කියවීම් පත්‍රිකා සහ කාර්ය පත්‍රිකා

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** -

**පියවර 4.2.1.1**
- පෙරදිග තූර්ය වාදක කණ්ඩායමක් ඇතුළත් දෘශ්‍යාධාරය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇතුළත් අවනද්ධ වාද්‍ය භාණ්ඩ පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.
- අංක 1 යටතේ දක්වා ඇති ගැමිගීවලට අදාළ වෙනත් ගීත සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • ජාතික උත්සව, අවමංගල උත්සව, හේවිසි වාදන, පෙරහැර, සඳහා මෙම භාණ්ඩ යොදා ගන්නා බව.<br>• මෙම භාණ්ඩ අවනද්ධ නමින්, පොදු නාමයකින් හඳුන්වන බව.<br>• මෙම භාණ්ඩ වෙන් වෙන්ව, හඳුනාගෙන නම් කළ හැකි බව.<br>• නර්තනය සඳහා ද මෙම භාණ්ඩ යොදාගන්නා බව. |

(මිනිත්තු 20 යි)

**පියවර 4.2.1.2**
- සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කියැවීම් පත්‍රිකා බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකා අනුව ක්‍රියා කාරකම් කිරීමට  සිසුන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- ඒ අනුව ක්‍රියාකාරකමෙහි සිසුන් මෙහෙයවන්න.

(මිනීත්තු 80 යි)

**පියවර 4.2.1.3**
- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්වලට ඌන පූර්ණය සඳහා ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ලබාගන්න.

- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • දේශීය සංගීත භාණ්ඩවර්ගීකරණයට අනුව මෙම භාණ්ඩ වර්ග කළ හැකි බව.<br>• ජන ජීවිතයේ විවිධ අවස්ථාවන් සඳහා මෙම භාණ්ඩ යොදාගෙන ඇති බව.<br>• ආගමික අවස්ථාවන්වලදී, බලිතොවිල්, යාතුකර්ම සඳහා මෙම භාණ්ඩ යොදාගෙන ඇති බව.<br>• උඩරට, පහත රට, සබරගමු, නර්තන සම්ප්‍රදායන් සඳහා මෙම භාණ්ඩ යොදාගෙන ඇති බව. |

(මිනිත්තු 80 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- දේශීය අවනද්ධ භාණ්ඩයන්ගේ ලක්ෂණ විස්තර කරයි.
- දේශීය අවනද්ධ භාණ්ඩයන්ගේ විස්තර දැනගැනීම අවශ්‍ය බව පිළිගනියි.
- දේශීය අවනද්ධ භාණ්ඩයන්ගේ කොටස් නිරීක්ෂණය කරයි.
- දේශීය අවනද්ධ භාණ්ඩ වාදනය ඉගෙන ගැනීමට පෙළඹෙයි.
- දේශීය අවනද්ධ භාණ්ඩ පින්තූර හා තොරතුරු එක් රැස් කරයි.

ඇමුණුම 01

**කියවීම් පත්‍රිකාව**

**දවුල**



දේශීය වාද්‍ය භාණ්ඩ අතර, දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන භාණ්ඩයක් වශයෙන් දවුල හඳුන්වා දිය හැකිය. පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණය අනුව 'විතතාත' ගණයට අයත් වන භාණ්ඩයකි.

බෞද්ධ වෙහෙර විහාර සහ බෞද්ධාගමික චාරිත්‍ර ආශ්‍රිත තේවා කටයුතු සඳහා වාදන සම්ප්‍රදායක් වශයෙන් ද, දේවාල හා බැඳි, පුද පූජාවතාවත් උදෙසා අනාදිමත් කාලයක සිට භාවිත වූ දවුල මංගල හා අවමංගල අවස්ථාවන්හි වයන වාද්‍ය භාණ්ඩයක් වශයෙන් ප්‍රචලිතය. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස දවුල හැඳින්වේ.

ඇසළ, කොහොඹ, ගංසූරිය, වරකා , කිතුල් වැනි වටිනා දැව වර්ග වලින් දවුල් කඳ සකස් කර ගනිති. කඳ ලියවා පිත්තල පටි අල්ලා අලංකාර කර ගැනීම පැරණි ක්‍රමයකි. දවුල් කඳෙහි දිග ප්‍රමාණය අඟල් 18 ක් 20 ක් අතර

ප්‍රමාණයක් වේ. වාදනය සඳහා කඩිප්පුවක් යොදා ගනියි. ව්‍යවහාරික සංගීතයේ දී ද අවශ්‍ය අවස්ථාවල දවුල භාවිත කරනු ලැබේ.

වැඩවසම් සමාජ ක්‍රමයේ දී අණබෙරයක් ලෙස අත්‍යවශ්‍යයෙන්ම භාවිත වූ දවුල් වාදනය සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පිළිගැනෙයි. දවුල වාදනයේ දී තියුණු හඬ විහිදෙන පැත්තට කඩිප්පුව උපයෝගී කර ගැනේ. ගැඹුරු ලෙස හඬ විහිදෙන පැත්ත අතින් වාදනය කෙරේ. මහනුවර දළදා පෙරහැරේ උඩරට දවුල් වාදනයට විශේෂ තැනක් හිමිවේ.

දවුල් පද කිහිපයක් පහත දැක්වේ.

- ජෙන්ගත්, ජෙන්ගත්, ජෙං ජෙං තා
- කුකුඳ ගතිත ගත තරිකිට කුංදත් දිරිකිට කුං දත්
- කිටිතක දොම්කිට ජෙං තක දොම්කිට

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1 දවුල කුමන නර්තන සම්ප්‍රදායක ප්‍රධාන වාද්‍ය භාණ්ඩයක්වේ ද ?

2 හේවිසි වාදනය සඳහා යොදා ගන්නා භාණ්ඩ නම් කරන්න.


3 දේශීය, සංගීත භාණ්ඩ වර්ගීකරණය අනුව දවුල අයත්වන්නේ කුමන වර්ගයකට ද?

4 ව්‍යවහාරික සංගීතයේ දවුල යොදාගෙන ඇති අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න.

5 දවුලේ දළ රූප සටහනක් අඳින්න.

**ඇමුණුම 02**

**කාර්ය පත්‍රිකාව**



ඉහත සඳහන් රූප සටහනට අදාළ වාක්‍ය පහත දක්වා ඇත. එම වාක්‍යයට හිමි අංකය රූප සටහනේ ලකුණු කරන්න.

1 දවුලේ හඬ නිපදවීම සඳහා යොදාගෙන ඇති හම දවුල් තට්ටුව නමින් හැඳින්වේ.

2 දවුල් තට්ටුව වටේට යොදා ඇත්තේ ගැටියයි.

3 දවුල වාදනය කරන උපකරණය දවුල් කඩිප්පුවයි.

4 ලීයෙන් කළ කොටස දවුල් කඳ නමින් හැඳින්වේ.

5 ඉනේ බැඳගන්නා ලණුව දවුල් ලණුවයි

6 දවුල් ලණුව සම්බන්ධවන ස්ථානයේ ඇති පිත්තලවලින් සාදන ලද ගිගිරි වලල්ල කයිපුඩිවළල්ලවේ

7 දවුල වටේට ඇද ඇති නූල් දවුල් වරයවේ.

8 දවුල් ලණුව තද කරන පිත්තල මුදුව ඉල්ලම් නම් වේ

ඇමුණුම 02

## කියැවීම් පත්‍රිකාව

### ගැටබෙරය

උඩරට බෙරය හෙවත් ගැටබෙරය දීර්ඝ කාලයක සිට ලංකාවේ වාදන භාණ්ඩ අතර ප්‍රමුඛස්ථානයක් ගත් ආතත භාණ්ඩයක්වේ. කොහොඹ, ගං සූරිය, දේවදාර, ඇසළ වැනි තද අරටු සහිත දැව වර්ග ගැටබෙර සකස් කිරීමේ දී කඳ සඳහා යොදා ගැනේ . ගැටබෙරයේ දිග සාමාන්‍යයෙන් අඟල් 28 ක් පමණ වේ. බෙරයේ වම්පස මුහුණට වඩා දකුණු පස මුහුණත ප්‍රමාණයෙන් තරමක් කුඩා වනසේ සකස් කරනු ලැබේ. වම් පසට සන වූ හරක් හම් ද, දකුණු පස බෙර ඇසට වඳුරු හමක් හෝ තලගොයි හමක් යොදා ගනියි.


ගැටබෙරයේ වාදනය කරන පද කිහිපයක් පහත දැක්වේ.

- තක් දොං තකු කිට තක දොං තකු කිට
- තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං
- තකු ජිං ජිං තත් ජිං තක ජිං කුඳ

මඟුල් බෙර වාදනය සුභ කටයුතු, මංගල අවස්ථාවන්හි දී සහ ත්‍රිවිත රත්නයේත්, දෙවියන්ගේත්, ආශිර්වාදය පතා කරන වැදගත් වාදන අංගයකි. ගැටබෙරයේ වම් ඇසින් දොං තොං, කුඳ ආදී අක්ෂරද, දකුණු ඇසින් ජිං තං ජිත්, ආදී අක්ෂරද වාදනය කරනු ලැබේ.

පහත සඳහන් වගුවට අදාළ පිළිතුරු සපයන්න.

| ගැටබෙරය යොදාගත් අවස්ථා දෙකෙක් ලියන්න. | දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණය අනුව මෙම භාණ්ඩය පිළිබඳ කරුණු දක්වන්න. | ගැටබෙරය හා දවුල පිළිබඳ සමානතා දෙකක් හා විෂමතා දෙකක් ලියන්න. |
|---|---|---|
| 1<br>2 | 1<br>2<br>3<br>4 | සමානතා<br>1<br>2<br>විෂමතා<br>1<br>2 |



ඉහත සඳහන් රූප සටහනේ එක් එක් කොටසට ඊතල යොදා ඇත. පහත දැක්වෙන වාක්‍යවලින් එක් එක් කොටසට ගැළපෙන නම තෝරාගෙන, රූප සටහනේ ලකුණු කරන්න.

1 බෙරයේ කඳ බෙරකඳ නමින් හැඳින්වේ.
2 බෙරයේ මැද මහත් වූ කොටස බෙර පුහුල නම් වේ.
3 බෙරයේ දෙපස ඇති හම තද කිරීම හා බුරුල් කිරීම සඳහා එම තට්ටු බෙර කඳට සවිකරගැනීම සඳහා වරපට උපයෝගී වේ.
4 බෙර ඇසට උඩින් එහි ආරක්ෂාවට යොදා ඇති හම් කොටස කැපුම් හම වේ.
5 බෙරය වාදනයට ඉනේ බැඳගනු ලබන්නේ බෙර ලනුවෙනි.
6 ගැටබෙරයේ දකුණු පස ආවරණය කළ රවුමේ මැද කොටස දකුණු ඇසවේ.
7 ගැටබෙරයේ වම් පස ආවරණය කළ රවුමේ මැද කොටස වම් ඇසවේ.
8 බෙරය ඉනේ බැඳගත්විට ආවරණය කළ රවුමේ මැද කොටස වම් ඇසවේ.
9 බෙරය ඉනේ බැඳ ගැනීමට යොදනු ලබන ලනුව බෙරය හා සම්බන්ධ කරන්නේ කන් වරය මගිනි.
10 බෙරයේ දකුණු ඇසට සම්බන්ධ කන්වරයට යා කෙරෙන මෙය පිත්තලෙන් සාදන ලද ගිගිරි වලල්ලකි. එය කයිපුඩිවලල්ල නමින් හැඳින්වේ.
11 එකට වෙලා ඇති සිහින් හම් එකතුවෙන් බෙරයේ ගැටිය සකස් කරනු ලැබේ. එයට වෙනිවර කැරැල්ල යයි කියනු ලැබේ.

ඇමුණුම 03

**කියවීම් පත්‍රිකාව**

**තම්මැට්ටම**

ලංකාවේ බෞද්ධ ආගමික පුද පූජාවලදී, වැයෙන අනිවාර්ය අංගයකි හේවිසි වාදනය. එහි දී තම්මැට්ටම ප්‍රධාන වේ. විශේෂයෙන් විහාර, දේවාල ආශ්‍රිත ආගමික අවස්ථාවන් හි දී දවුල හා එක්ව වාදනය වු භාණ්ඩය ලෙස තම්මැට්ටම හඳුන්වා දිය හැකිය. බෞද්ධ සිද්ධස්ථානයන්හි පොහොය දින හේවිසි මුර වාදනයේ දීත්, ගමන් හේවිසි සඳහාත්, අවමංගල බෙර වාදනයේදීත්, දවුල සමඟ තම්මැට්ටම එකට බැඳ හේවිසි වාදනය කරති.


මෙම වාදන භාණ්ඩයේ වම් ඇසෙහි ශබ්ද ධවනිය ඉතා පහත්ව නැගෙන සේ සනවූ සමෙන් නිමවා ඇත. දකුණු ඇසෙහි ශබ්දය ඉතා උස්ව නැගෙන සේ තුනී හමින් නිපදවා ඇත. වම් ඇසට වඩා දකුණු ඇසෙහි මුහුණත කුඩා කොට ඇත්තේ හඬෙහි උස් ධවනිය ලබා ගැනීම සඳහා ය.

ඇසළ, කොහොඹ, කොස් වැනි දැව වර්ගවලින් තම්මැට්ටම් කඳ සකස් කර ඇත. දකුණු හා වම් ඇස් සඳහා හරක් හම්, මුව හම්, යොද ගනියි. වාදනය සඳහා කඩිප්පු දෙකක් යොදා ගනියි.

තම්මැට්ටමේ මුහුණත කුඩා කොටස් ඇතුළත ඇති පළමු රවුම අඬ බෑයයි. එහි දෙවන රවුම කැපුම් හමයි. මුහුණත ලොකු කොටස මණ්ඩම නමින් හඳුන්වයි. තම්මැට්ටම් කඳන් දෙක එකට සවිකර ඇති තහඩුව කුන්දිරම්පල්ල නම් වේ. තම්මැට්ටම කඳවටා යොදා ඇති පටිය වෙනිවර කැරැල්ලවේ. වාදනය සඳහා ඉනේ බැඳගනු ලබන්නේ ඉන ලනුවයි. ලීයෙන් සකස් කර ඇත්තේ කඳ කොටසයි. වාදනය කරනුයේ කඩිප්පු යුගලයකිනි. මෙය කොටුවෙන් (කඩිප්පුවෙන්) පමණක් වයන බැවින් විතත වර්ගයට අයත් භාණ්ඩයකි.

## කාර්ය පත්‍රිකාව

1 ඉහත දී ඇති කියවීම් පත්‍රිකාව කියවා පහත දී ඇති රූප සටහනේ කොටස් නම් කරන්න.



2. තම්මැට්ටම යොදාගත් අවස්ථා 3 ක් ලියන්න.

1


2

3

**ඇමුණුම 04**

## කියවීම් පත්‍රිකාව

### පහතරට බෙරය



පහතරට බෙරය පහතරට නර්තන සම්ප්‍රදාය හා බැඳි ප්‍රධාන වාද්‍ය භාණ්ඩයවේ. යක්බෙරය, රුහුණු බෙරය, දික්බෙරය, බොකුබෙරය, සෝෂක බෙරය, ආදී නම්වලින් හැඳින්වේ. මෙහි හැඩය සිලින්ඩරාකාරය. කිතුල් , පොල්, ඇහැල, මිල්ල, කොහොඹ, වැනි දැව වර්ග වලින් බෙර කඳ සකස් කර ඇත. මෙය ද ආතත ගණයට අයත් භාණ්ඩයකි.

විශේෂයෙන් පහතරට බෙරය යක්තොවිල්, දේවතොවිල්, බලිතොවිල්, ආදී යාතු කර්ම ත්‍රිත්වයේදීම යොදා ගැනේ. අනෙකුත් බෙර මෙන් වම්, දකුණ, වශයෙන් පැති දෙකක් මෙම බෙරයේ යෙදේ. වම් පැත්ත සුරල් පැත්ත වන අතර, දකුණු පැත්ත හයි ගහන පැත්ත යන පාරිභාෂික වචනයෙන් හඳුන්වනු ලැබේ.

හයි පැත්තට තරමක් ඝන කමින් යුත් හරක් හමක් ද, සුරල් පැත්තට ඊට මදක් තුනී හමක් ද යොදා ගනු ලැබේ.

දකුණු පසින් - තත් තොං


වම්පසින් - දිත් , නං යන මූලික අක්ෂර උපදී.

බෙර සමෙහි ආරක්ෂාවට යොදා ගෙන ඇත්තේ කැපුම්හමයි. බෙර වාදනය සඳහා කරේ බඳිනු ලබන්නේ කර ලනුවයි. බෙරයේ ගැටිය සඳහා සිහින් හම් ගෙතුමක් සකස් කෙරේ. එය වෙනිවර කැරැල්ල නම්වේ. බෙරය කඳේ බැඳ ගැනීම සඳහා යොදා ගන්නා ලනුව, බෙරය හා සම්බන්ධකරන්නේ කන්වරය මගිනි. බෙරයේ හම තද කිරීමට හා බුරුල් කිරීමටද, එම තට්ටුව බෙර කඳට සවිකර තැබීම සඳහාත්, වරපට උපයෝගී කරගනී.

පහතරට නර්තනයේ දී, පෙරහැරවල් වලදී ජාතික උත්සවවල දී පහතරට බෙරය උපයෝගීකර ගනියි.

**කාර්ය පත්‍රිකාව**

1 ඉහත කියවීම් පත්‍රිකාව කියවා පහත දී ඇති රූප සටහනේ කොටස් නම් කරන්න.



1. [illegible]

   1

   2

   3

   4

2 පහතරට බෙරයේ කඳ සකස් කර ගැනීමට ගනු ලබන දැව වර්ග තුනක් නම් කරන්න.

   1

   2

   3

3. පහතරට බෙරය වාදනයට යොදාගන්නා අවස්ථා 3 ක් ලියන්න.

   1

   2

   3

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතයේ පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.2** : **දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩවල විශේෂතා සාකච්ඡා කරමින් අගය කරයි.**

**ක්‍රියාකාරකම 4.2.2** : **පංචතූර්ය භාණ්ඩ වලින් රිද්ම රටා වයමු.**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- අදාළ වාද්‍ය භාණ්ඩ (ගැටබෙරය, පහත රට බෙරය, දවුල, තම්මැට්ටම, මහ දවුල, දඬු බෙරය, අත් රබාන, පන්තේරුව, උඩැක්කිය, තාලම්පට, සිම්බල්, හොරණෑව, බටනලාව)
- ඇමුණුම අංක 01ට අදාළ කාර්ය පත්‍රිකාව
- රිද්මරටා සහිත දෘෂ්‍යාධාරය

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 4.2.2.1**
- ඔබ විසින් කතිර යොදා නිර්මාණය කරගත් රිද්ම රටා සහිත දෘශ්‍යාධාරයක් ප්‍රදර්ශනය කරන්න.

උදා -1. /x x - / x x - / x - x - x / x - x - /

2. / x - x - / x - - - / x - x - / x - - - /
x - - -/ x - x - / x - x - / x - - - /

3. / x x - / - - - / x x - / - - - /
x - - / x - - / x - - / - - - /

4. x x - - / x x - - / x - x - / x - - - /

- මෙහි කතිර මත අත් පුඩි තැලීමට සිසුන් යොමු කරන්න.
- මෙම ක්‍රියාකාරකම නැවත නැවත කරවමින් පහත කරුණු මතුවන සේ සාකච්ඡා කරන්න.

| |
|---|
| • කතිර යොදා ඇති ආකාරය අනුව විවිධ රිද්ම රටාවන් ගොඩ නගා ගත හැකි බව.<br>• කතිර ( x) මතට හා ඉරි (-) මත අවනද්ධාක්ෂර යෙදීමෙන් විවිධ තාල රටා ගොඩනගා ගත හැකි බව. |

(මිනිත්තු 10 යි)

**පියවර 4.2.2.2**
- සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- පෙර පාඩමේ උගත් භාණ්ඩ හෝ ඒ සඳහා ආදේශක භාණ්ඩ කණ්ඩායම් හතරකට ලබා දෙන්න.

- ඇමුණුම 01 සිසුන් අතට පත්කර එම ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.
- සිසුන් විසින් නිර්මාණය කළ රිද්ම රටා පුහුණුවීමට පොළඹවන්න. (දෙවන කාලච්ඡේදයේ පළමු විනාඩි 30 තුළ)

(මිනිත්තු 50 යි)

පියවර 4.2.2.3

- සිසුන් විසින් නිර්මාණය කළ රිද්ම රටා වාදනය කිරීමට සලස්වන්න.
- එහි ගුණ දොස් විචාරමින් ඇගයීමට ලක් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • තූර්ය වාදන කණ්ඩායමක් ගොඩ නැගෙනුයේ මෙවැනිම රිද්ම රටා රාශියක් එකතුවීමෙන් බව. |
| • විවිධ රිද්ම රටාවන් මගින් විවිධ අදහස් ප්‍රකාශ කළ හැකි බව. |
| • විවිධ නාදමාලාවන් සඳහා එම රිද්ම රටා යොදා ගත හැකි බව. |

(මිනිත්තු 20 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- දේශීය පංචතූර්ය වාද්‍ය භාණ්ඩයන්ගෙන් රිද්ම රටා වාදනය කරයි.
- නිර්මාණ කරණයට පෙළඹෙයි.
- තූර්ය වාදක කණ්ඩායමක මූලික අවස්ථාවන් පිළිබඳ අත්දැකීම් ලබයි.
- දේශීය පංචතූර්ය නාදය පිළිබඳ විස්තර කරයි.
- තූර්ය වාද්‍ය භාණ්ඩ කිහිපයක් මගින් වයනු ලබන විවිධ රිද්ම රටා එකමුතුව තුළින් නිර්මාණශීලී තාල රටා ගොඩනැගෙන බව අත්දකියි.

**ඇමුණුම 01**

**කියවීම් පත්‍රිකාව**

**ක්‍රියාකාරකම 01**

- පහත දැක්වෙන ප්‍රස්තාර කියවා තම භාණ්ඩයට නියමිත අවනද්ධාක්ෂරය වයන්න. (අවනද්ධාක්ෂර ඔබේ කනට ඇසී ඇති ආකාරයෙන් උත්පාදනය කිරීමට උත්සාහ කරන්න.)

(තූර්ය වාදක කණ්ඩායම ආරම්භක තාල වාදනය)

| | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 |
|---|---|---|---|---|
| මහ දවුල | x - x - | x - - - | x - x - | x - - - |
| දඬු බෙරය | | | | |
| අත් රබාන | | | | |
| පන්තේරුව | | | | |
| උඩැක්කිය | | | | |
| තම්මැට්ටම | තරි කිට තරි කිට | ජෙං - - - | තරි කිට තරි කිට | ජෙං - - - |
| | තරි කිට ජෙං - | තරි කිටජෙං - | තරි කිට තරි කිට | ජෙං - - - |
| ගැට බෙරය | දොං දොං ජිං තක | ජිං - - - | දොං දොං ජිං තක | ජිං - - - |
| | ජිං තක ජිං - | ජිං තක ජිං - | දොං දොං ජිං තක | ජිං - - - |
| පහත රට | දොං -දොං -- දොං | තම් ගත ගදි ගත | | |
| බෙරය | | | | |
| දවුල | ජෙං -ංජ ගත් ජෙං | ජෙං - - - | ජෙං -රෙ ගත් ජෙං | ජෙං - - - |
| | ජෙං ජෙං තක් කිට | තක් කිට තරි කිට | ජෙං -ජෙ ගත් ජෙං | ජෙං - - - |

ගමන් යාම සඳහා තාල වාදනයක්

| | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 |
|---|---|---|---|---|
| මහ දවුල | x - x - | x - x - | x - x - | x - x - |
| දඬු බෙරය | | | | |
| අත් රබාන | x - - - | x - - - | x - x - | x - - - |
| පන්තේරුව | | | | |
| උඩැක්කිය | | | | |
| තම්මැට්ටම | ජෙං කිට කිටි තක | තක් කිට කිටි තක | | |
| ගැට බෙරය | දොං -දොං - දොං | ජිං තක ජිං ජිං | | |
| පහත රට | | | | |
| බෙරය | ගුම් ගුඳ ගදි ගත | ගදි ගත ගදි ගත | | |
| දවුල | ජෙං කිට කිටි තක | තක් කිට ගත් ජෙං | | |

ගීතය නැවැත්වීමේ වාදනයක්

| | | | | |
|---|---|---|---|---|
| සියලු තූර්ය | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 |
| වාද්‍ය භාණ්ඩ | x x - - | x x - - | x - x - | x - - - |

**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත් දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.1** : **නව නාට්‍ය සම්ප්‍රදාය සහ සංගීතයේ ස්වභාවය විමසමින් ගායනය කරයි.**

**ක්‍රියාකාරකම 5.1.1** : **'නව නාට්‍ය ශෛලිය හා එහි ස්වභාවය..'**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම් 5.1.1.1 ට අයත් ගුරු උපදෙස් පත්‍රිකාව.
- ඇමුණුම 5.1.1.2 ට අයත් කියවීම් පත්‍රිකාව
- ඇමුණුම 5.1.1.3 ට අයත් ගවේෂණ උපදෙස් පත්‍රිකාව නාට්‍ය නාමාවලිය සංගීත අධ්‍යක්ෂවරුන් යොදාගත් සංගීත භාණ්ඩ ඇතුළත් වගුව.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** -

**පියවර 5.1.1.1**
- අපේ රටේ පැවැති හා පවතින නාට්‍ය සම්ප්‍රදායක් පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- එවැනි නාට්‍ය ගීතයක් ගැයීමට ඉදිරිපත් වන සිසුන්ට අවස්ථාවක් සලසා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - නාට්‍ය සාමූහික ප්‍රයත්නයක් බව.
  - කිනම් ශෛලියකට අයත් වුවත් නාට්‍ය වූ කලී වේදිකාවක රසික පිරිසක් ඉදිරියේ සජීවිව ඉදිරිපත් කරන රංගනයක් බව.
  - ලංකාවේ පළාත්බදව පැවැති ගැමි නාටක ශෛලීන් අද ව්‍යවහාරයේ පවතින නව නාට්‍ය ශෛලිය සඳහා ඉවහල් වූ බව.
  - නාට්‍ය සඳහා විවිධ වෘත්තාන්ත, ඓතිහාසික කථා ආගමික තොරතුරු හා එදිනෙදා සිද්ධීන් යොදාගත් බව.
  - සංගීතය නාට්‍ය අත්‍යවශ්‍ය අංගයක් බව.

(මිනිත්තු 10 යි)

**පියවර 5.1.1.2**
- පන්තිය කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- ඇමුණුම 5.1.1.2 හා ඇමුණුම 5.1.1.3 ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්හි යොදවන්න.

(මිනිත්තු 60 යි)

පියවර 5.2.1.3

- කණ්ඩායම් දෙකෙහි අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්හි සදොස් තැන් නිදොස් කර ගැනීමට ගුරුවරයාට සහාය වන්න..
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - භරත මුණිගේ නාට්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථයෙහි නාට්‍ය පිළිබඳ මූලික ප්‍රභේද දෙකක් ඇති බව.
> - එම ප්‍රභේද ලෝක ධර්මීනාට්‍ය හා නාට්‍යධර්මී නාට්‍ය නමින් නම් කර ඇති බව.
> - ලංකාවේ නව නාට්‍ය සම්ප්‍රදාය 1956 දී එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍යයෙන් ආරම්භ වූ බව.
> - දේශීය නාට්‍ය ශෛලී ගත හා අර්ධ ශෛලීගත වශයෙන් බෙදී ඇති බව.
> - මුද්‍රා නාට්‍යය හා ඔපෙරා නිර්මාණ කීපයක් ද ලංකාවේ දේශීය මුහුණුවරකින් බිහිවී ඇති බව.
> - නාට්‍යයක අවස්ථා හා ඊට උචිත පරිසරය මැවීම සඳහාත්, නාට්‍යමය අවස්ථා තීව්‍ර කිරීම පිණිසත් සංගීතය යොදා ගන්නා බව.

(මිනිත්තු 10 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- නව නාට්‍ය ශෛලියේ ස්වභාවය හා සංගීතය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- නාට්‍ය තේමාව උද්දීපනය වන සේ සංගීතය නිර්මාණය කිරීම වැදගත් වන බව පිළිගනී.
- නාට්‍ය ප්‍රභේද වෙන් කරමින් ඒ ප්‍රභේදයන්ට උචිත නාට්‍ය නම් පෙළ ගස්වයි.
- ගුණාත්මක බවින් අනූන සංගීත නිර්මාණ ඇතුළත් නාට්‍ය පිළිබඳ සොයා බලයි.
- නාට්‍ය සඳහා සංගීතය නිර්මාණය කිරීමට පෙළඹෙයි.

ඇමුණුම 5.1.1

**ගුරු උපදෙස් පත්‍රිකාව**

**1 . භරත මුණි නාට්‍ය ශාස්ත්‍රයේ නාට්‍ය ප්‍රභේද**

- ලෝක ධර්මී නාට්‍ය
  - තාත්වික නාට්‍ය
    - කැළණි පාලම
    - තාරාවෝ ඉගිලෙති
    - අංගාරා ගඟ ගලාබසී
- නාට්‍ය ධර්මී නාට්‍ය
  - ශෛලිගත නාට්‍ය
    - මනමේ
    - සිංහබාහු
    - හුණුවටය
- අර්ධ ශෛලිගත නාට්‍ය
  - නරිබෑණා
  - බෙරහඬ
  - මීපුර වැසියෝ

**2 . මුද්‍රා නාට්‍ය - මුද්‍රාවලින් පමණක් අදහස් ප්‍රකාශනය.**

**සංගීතය විශේෂිතය.**

- පෙරදිග
  - ලංකාව
    - කරදිය
    - නල දමයන්ති
- අපර දිග ( BALLET)
  - හංසවිල (SWAN LAKE)

ඇමුණුම 5.1.1.2

**කියවීම් පත්‍රිකාව**

- ලංකාවේ නව නාට්‍ය කලාවේ ආරම්භය සනිටුහන් වී ඇත්තේ ක්‍රි. ව. 1956 දි මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍ය සමගයි.
- එතැන් සිට නිර්මාණය වූ නාට්‍ය ශෛලිගත හා අර්ධ ශෛලිගත වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විණි.
- ශෛලිගත නාට්‍ය සඳහා මනමේ සිංහබාහු ද, දයානන්ද ගුණවර්ධනයන්ගේ නරිබෑණා අර්ධ ශෛලිගත නාට්‍ය වශයෙන් ද උදාහරණ ලෙස දැක්විය හැක.
- ශෛලිගත නාට්‍යවලට 'අත්වැල් ගායක කණ්ඩායමක්' සිටීම සංගීතමය විශේෂත්වයි විය.
- අර්ධ ශෛලිගත නාට්‍යයන්හි ගීත එම චරිත විසින් ම ගායනා කිරීම ඊටම ආවේනික සංගීතමය ලක්ෂණයක් විය.
- හෙන්රි ජයසේන මහතාගේ හුණුවටයේ කථාව මෙම ශෛලිගත හා අර්ධ ශෛලිගත වර්ග දෙකේම ලක්ෂණ මිශ්‍ර වූ ශෛලියක් අනුගමනය කර ඇත.
  උදා - එහි අත්වැල් ගායක කණ්ඩායම් ඇත.
  වැල් පාලමේ ගීතය, සොල්දාදුවාගේ ගීතය. එම චරිත විසින්ම ගායනා කෙරේ.
- නාට්‍යමය අවස්ථාවක උචිත පරිසරය මැවීමටත්, නාට්‍යමය අවස්ථා ඉස්මතු කිරීමටත් සැපයූ සංගීතය වඩාත්ම නාට්‍යෝචිත සංගීතයක් වෙයි.
- ප්‍රේමසිරි කේමදාස මහතා විසින් නිෂ්පාදනය කළ 'මානසවිල - අග්නි' යන ඔපෙරා ශෛලීයේ නාට්‍ය ඔහුගේ නාට්‍ය සංගීතයේ විවිධ අත්දැකීම් පුළුල් කළ අවස්ථා බව.
- ඩබ්. ඩී. මකුලොළුව ශූරීන්ගේ හා දෙපානෝ, නාට්‍යයත්, කුණ්ඩලකේශී නාට්‍යයත් ගීත නාට්‍ය ගණයට අයත් ය.

ඇමුණුම 5.1.1.3

## ගවේෂණ උපදෙස් පත්‍රිකාව

- ඇමුණුම් අංක 5.1.1.2 හි හොඳින් කියවා කරුණු නිරවුල් කර ගන්න.
- එම අදහස් පිළිවෙලින් ගොනු කර නාට්‍ය ප්‍රභේද, නාට්‍ය වර්ග දැක්වෙන පරිදි වගු සටහනක් පිළියෙල කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නාවලියට පිළිතුරු සපයා ගන්න.

1. නාට්‍ය පිළිබඳ ලියැවුණු පැරණිම ග්‍රන්ථය හා එහි කතුවරයාගේ නම කුමක් ද?
2. අභිනය හා මුද්‍රා පමණක් උපායෝගී කරගනිමින් සංගීතය ප්‍රධාන කොට රංග ගතවන නාට්‍ය විශේෂය කුමක් ද?
3. අර්ධ ශෛලිගත (ලංකාවේ ) ප්‍රසිද්ධ නාට්‍ය හා එහි නිෂ්පාදක වරයා හඳුන්වන්න.
4. නල දමයන්ති නාට්‍ය හා කරදිය නාට්‍ය යුගලයේ එන ගීත දෙකක් නම් කරන්න.
5. ඔපෙරාවට සමාන ලංකාවේ රංග ගතවූ නාට්‍ය දෙකක් නම් කරන්න.
6. ලෝක ධර්මී නාට්‍යයකට අයත් යැයි සැලකිය හැකි නාට්‍ය දෙකක් නම් කරන්න.
7. නාට්‍ය ධර්මී නාට්‍ය ගණයට අයත් විය හැකි නාට්‍ය දෙකක් නම් කරන්න.
8. ලෝක ප්‍රසිද්ධ මුද්‍රා නාට්‍යයක් නම් කරන්න.
9. ලංකාවේ නිෂ්පාදිත ශෛලිගත නාට්‍යයක් හා එහි නිෂ්පාදකවරයා හා සංගීත අධ්‍යක්ෂවරයා නම් කරන්න.

**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත් දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.1** : **නව නාට්‍ය සම්ප්‍රදාය සහ සංගීතයේ ස්වභාවය විමසමින් එම ගී ගායනය කරයි.**

**ක්‍රියාකාරකම 5.1.2** : **'නව නාට්‍ය ශෛලියේ ගීත ගයමු.'**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම් 5.1.1.1 ට කාර්ය පත්‍රිකාව.
- හුණුවටය, කුවේණි, කරදිය, බෙරහඬ, රතු හැට්ටකාරී යන නාට්‍යවලින් පටිගත කරනලද ගීත ඇතුළත් කැසට් පටයක් සහ කැසට් යන්ත්‍රයක්
- සර්පිනාව/ තබ්ලාව
- එම නාට්‍යවලට අදාළ ඡායාරූප, එම ගී පද මාලා හා ප්‍රස්තාර ලියූ පත්‍රිකාවන්.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** -

**පියවර 5.1.2.1**
- උක්ත නාට්‍යවලින් එකකට අයත් ගීතයක් ගායනය කරන්න.
- සපයා ගත හැකි නම් නාට්‍යවල ඡායාරූප පෙන්වා එම රූප මඟින් දැක්වෙන නාට්‍ය චරිත හා පසුබිම තුළින් එම නාට්‍ය හඳුනා ගැනීමට සිසුනට ඉඩ සලසන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • ඔබ නැරඹූ ඡායාරූප අයත් වන්නේ හුණුවටය, කුවේණි, කරදිය, බෙරහඬ, රතු හැට්ටකාරී යන නාට්‍යවල චරිත හා දර්ශනවලට බව.<br>• මෙම නාට්‍ය එදත් අදත් බොහෝ සෙයින් ජනප්‍රිය බව.<br>• මේ නාට්‍ය ගීත ගායනා කරමින් රස විඳිය හැකි බව.<br>• ඇතැම් ගීත ගුවන් විදුලියේත්, රූපවාහිණියේත්, නිතර ප්‍රචාරය වන බව. |

(මිනිත්තු 10 යි)

**පියවර 5.1.2.3**
- පන්තිය කණ්ඩායම් පහකට බෙදන්න.
- එම කණ්ඩායම් අතර ගී පද මාලා පිටපත බැගින් බෙදා දෙන්න.
- ගීත පටිගත කරනලද කැසට් පටය සිසුනට ශ්‍රවණයට සලස්වන්න.
- ගීත ශ්‍රවණය කරමින් ගුරුවරයාද සර්පිනාව ආධාර කරගනිමින් ගීත ගායනය කරන්න.
- 5.1.1.3 කාර්ය පත්‍රිකාව එම කණ්ඩායම් අතර බෙදන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමේ යොදවන්න.

(මිනිත්තු 60 යි)

පියවර 5.1.2.4

- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සදොස් තැන් නිවැරදි කරගැනිමට උපදෙස් දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

  - හුණුවටයේ වැල්පාලමේ ගීතයේ තනුව අවස්ථාව සමඟ මනාව සම්බන්ධ වී ඇති බව.
  - කුවේණි නාට්‍යයේ '... සත්සියක්..' ගීතය එම නාට්‍ය චරිතයට ඉතා උචිත බව.
  - කරදිය නාට්‍යයේ 'හෝයියා... " ගීතය නාට්‍යයේ පසුබිමට, ගෝචර වන්නාවූ සාර්ථක නිරූපණයක් බව.
  - බෙරහඬ නාට්‍යයේ සංගීතය සඳහා ජන සංගීතයේ ශාන්ති කර්ම නාද රටා, පාදක වී ඇති බව.
  - හින්දුස්ථානි ගීත ආකෘතිය ඇසුරුකර නිර්මාණය වූ ගීයක් ලෙස රතු හැට්ටකාරී නාට්‍යයේ ගීතය හැඳින්විය හැකි බව.

(මිනිත්තු 10 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**


- නව නාට්‍ය ශෛලියේ ගීත වර්ග පිළිබඳව අදහයස් දක්වයි.
- අදාළ ගිත, නාට්‍ය අවස්ථා හා සම්බන්ධව නිර්මාණය කිරීමේ වැදගත්කම පිළිගනියි.
- නව නාට්‍ය ගීත එකතුවක් සුදානම් කරයි.
- වත්මන් සංගීත ශෛලියකට උචිත අන්දමේ නව නාට්‍ය ගීත රැස් කරයි.
- නාට්‍ය ගීත ගායනය කරයි.

ඇමුණුම 5.1.1

හුණුවටයේ කථාව - වැල් පාලමේ ගීතය

හෙළ ගැඹුරුයි - පුත නොබලන්
හෙලවෙනකොට වැල් පාලම
දෑස පියන් බිම නොබලන්
අපට පුතේ මගක් නැතේ
මේ මග මිස යමන් පුතේ
දෙවියෝ බලයි මූණ නුඹේ
නුඹව රකියි යමන් පුතේ

F major




හුණුවටය
නිෂ්පාදනය හා අධ්‍යක්ෂණය - හෙන්රි ජයසේන
සංගීතය - ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න


කුවේනි නාට්‍යයෙන්

සත් සියක් කපුමල් රැගෙන මම
සත් සියක් සුදු කෙඳි රැගෙන මම
සත් සියක් කපු පිළි වියන මම
සත් සියක් දෙන පළඳිතේ //

සත් සියක් රත් මල් රැගෙන මම
සත් සියක් රත් හුය රැගෙන මම
සත් සියක් මල් දම් ගොතන මම
සත් සියක් ගෙල පළඳිතේ

සත් සියක් මායා බෙලෙන් මම
සත් සියක් බන්ධන බෙලෙන් මම
සත් සියක් සක්වල සොයා මම
ගෙන්වූ කුමරුන් අද එතේ //

කුවේණි නාට්‍ය - හෙන්රි ජයසේන



**කරදිය නාට්‍යයෙන්**

හොයියා හෝයියා . . .
හොයියා හෝයියා...//
හේලිහෙලෙයි // හෙලෙයියා. . .

මහ මුහුදේ ඈත ඉඳන් //
වෙරල බලා දවස පුරා - දවස පුරා
වෙරල බලා දවස පුරා
රැලි පිට පෙරලි පෙරලි ඇදෙනවා

හේලිහෙලෙයි //හෙලෙයියා
හොයියා හොයියා . . .
ජීවිතයත් මුහුද වගේ - නිමක් නැතේ - කොනක් නැතේ
යනවා - ආපහු එනවා - යනවා - ආපහු එනවා
හොයියා හෝයියා

- කරදර දුක් ගැහැට මැදින් ඃ කඳුල මැදින් සුසුම මැදින්
සැමදාම එකවගේ ඇදෙනවා

රෑ යාමේ ගණ අඳුරේ- හෙණ හඬ විදුලිය අතරේ
වැහි නොබලා පිනි නොබලා - කුණාටු දියවැල් නොබලා
සීතල හිම සුළං මැදින් - මතුව හොරෙන් සෙමින් සෙමින්
ඈත එපිට දියඹ බලා ඇදෙනවා

කරදිය මුද්‍රා නාට්‍යය ප්‍රවීණ නර්තන ශිල්පී
චිත්‍රසේනයන් ගේ  නිෂ්පාදනයකි.

**හනික වරෙව් කොල්ලනේ**

හනික වරෙව් කොල්ලනේ - මෙන්න මෙහෙ වරෙව් //
මෙන්න මෙහෙ වරෙව් කොල්ලනි නට නටා වරෙව් //
තොපිට හරිම වාසියක් නට නටා වරෙව් යකෝ
තොපිට හරිම වාසියක් නට නටා වරෙව්

වැඩේ ආමාරුත් නැතේ - තැගි ටිකක් අපි අතේ//
රත්තරනින් ගෙවන්නේ - හිරු දෙවියොයි කියන්නේ //

මෙන්න මෙහෙ වරෙව් කොල්ලනි- නට නටා වරෙව්
තොපිට හරිම වාසියක් නට නටා වරෙව් යකෝ //
හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්

සාධු සාධු කියල්ලා - ප්‍රීතිඝෝෂ කරල්ලා //
හිරු දෙවිඳුගේ ගොපල්ලෝ - කන්ද උඩින් වරෙල්ලා
හිරු දෙවිඳුගේ ගොපල්ලෝ - කන්ද යටින් වරෙල්ලා
හිරු දෙවිඳුගේ හරක් ගත්ත - හරක් හොරා සොයල්ලා //
ලොකේ වටේ ගිහිල්ලා - හරක් හොරා හොයල්ලා //
හිරු දෙවිඳුගෙ හරක් ගත්ත - හරක් හොරා සොයල්ලා //

වනන්තරේ හොයාපියෝ - ගල් අරඹේ හොයාපියෝ //
මරු කතරේ හොයාපියෝ - මිනිස් වාසෙ හොයාපියෝ//
කඳු මුඳුනේ ගං ඉවුරේ වනන්තරේ හොයාපියෝ //
හිරු දෙවිඳුගෙ ගොපල්ලො අපි අපිට දෙයියෝ බලාපියෝ //
රන් අභරණ පැළඳගන්න

හිරු දෙවියෝ බලාපියෝ //
හරක් හොරා සොයා ගන්න
සියළු දෙවියෝ පිහිට වෙන්න //

බෙරහඬ නාට්‍යය - බන්ධුල ජයවර්ධන

රතු හැට්ටකාරි නාට්‍ය -

දීකිරි දීකිරි ගොනාව දී කිරි
මිහිපිට කාටත් ගුණ දෙන දී කිරි
පැටියා මෝරපු දෙනගෙන් ගත් කිරි
හොඳ හැටි උණුකර හින්දා ගත් කිරි
නැවුම් මුට්ටියේ වත්කල මේ කිරි
පනමට ලාභයි මං දෙන මේ කිරි

කිරි විකුණාලා කාසි සොයන්නයි
අනාගතේ මාළිගා තනන්නයි
කුමාරයෙක් ගෙදරට කැන්දන්නයි
මගෙ මංගල්ලෙට ඔහෙලත් එන්නයි.

හිස මගෙ දෙදරයි දෙපා රුදා දෙයි
රෑ වෙන්නට පෙර ගෙදරට යන්නයි
පනමේ කිරි ගෙන පිහිටක් වෙන්නයි
මුට්ටිය බිඳුනොත් ඔක්කොම ඉවරයි.

නිෂ්පාදක - ප්‍රවීණ නාට්‍ය අධ්‍යක්ෂ ලූෂන් බුලත්සිංහල

**දෙපානෝ - ගීතය**

කොයි යන්නට එනවද බොල
දන්නේ නැද්ද තෝ මේ මග
දන්නව මම් තොටත් වැඩිය

මේ මග අපේ රජිඳුගේ වග
කට රැක ගන් - කුණු පානා
දනු මේ මහ පාරට මග
කව්ද තොපේ ගම ලගින්නේ
මා යන්නේ රජ මහ මග

දෙපානෝ - ස්වර ප්‍රස්තාරය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ගමම | පපප | ගමප | පපප | ගමප | පධප | මපම | ගරිග |
| සරිග | රිගම | ග-ග | රිසරි | ග-ග | -රිග | රිස- | සසස |
| ගමප | පපප | ගමප | පපප | ගමප | පධප | මපම | ගරිග |
| සරිග | රිගම | ග-ග | රිසරි | ග-ග | -රිග | රිස- | සසස |

**තව තව කට මැත දොඩවා ගීතය - දෙපානෝ නාට්‍යයෙන්**

තව තව කට මැත දොඩවා
තා වැනසෙයි හිවළා
සැනකින් ඔතනින් නොගියොත්
තාගේ - මළකුණ නදියේ
මගියෙක් හට බාධා
නොකරනු යම පල්ලා
අපගේ ගම පා පහසින්
තාගේ - කෙළෙසනු බැරියෝ

| | | | |
|---|---|---|---|
| ස - | ම - ම ම | ග - | රි - ග - |
| ග - | රි ග රි ස | ස - | ස - - - |
| ස - | ප - ප ප | ම - | ග - ස - |
| රි - | ග - - - | - - | ම ග රි - |
| | | | |
| + + | ග - ග - | රි - | රි - ග - |
| රි - | ස - - - | - - | - - - - |

දෙපානෝ - ඩබ්. බී. මකුලොලුව ශූරීන්

**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත් දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.1** : **නව නාට්‍ය සම්ප්‍රදාය සහ සංගීතයේ ස්වභාවය විමසමින් ගායනය කරයි.**

**ක්‍රියාකාරකම 5.1.3** : **'ගීත නාට්‍යවල ගීත ගයමු.'**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම් 5.1.1.3 ට අයත් කාර්ය පත්‍රිකාව.
- හුණුවටය, කුවේණි, කරදිය, බෙරහඬ, රතු හැට්ටකාරී පේමතෝ ජායතී, යන නාට්‍යවලින් පටිගත කරනලද ගීත ඇතුළත් කැසට් පටයක් සහ කැසට් යන්ත්‍රයක්
- සර්පිනාව/ තබ්ලාව
- එම නාට්‍යවලට අදාළ ඡායාරූප, එම ගී පද මාලා හා ප්‍රස්තාර ලියූ පත්‍රිකාවන්.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 5.1.3.1**

- නාට්‍ය දර්ශන ඡායාරූප පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම රූප මඟින් දැක්වෙන නාට්‍ය චරිත හා පසුබිම තුළින් එම නාට්‍ය හඳුනා ගැනීමට සිසුනට ඉඩ සලසන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • ගීත නාටකය සඳහා සංගීතය ප්‍රධාන වී ඇති බව. |
| • ගීත නාටකවල නළු නිළියන්ට ගීත ගායනයෙහි මනා හැකියාවක් අවශ්‍ය බව. |
| • ගීත නාටක, දෙබස් රචනා විරිතකට අනුව ලියැවී ඇති බව. |

(මිනිත්තු 10 යි)

**පියවර 5.1.3.2**

- පන්තිය කණ්ඩායම් හතරකට බෙදන්න.
- එම කණ්ඩායම් අතර ගී පද මාලා පිටපත බැගින් බෙදා දෙන්න.
- ගීත පටිගත කරනලද කැසට් පටය සිසුනට ශ්‍රවණයට සලස්වන්න.
- ගීත ශ්‍රවණය කරමින් ගුරුවරයාද සර්පිනාව ආධාර කර ගනිමින් ගීත ගායනය කරන්න.
- 5.1.3.2 කාර්ය පත්‍රිකාව එම කණ්ඩායම් අතර බෙදන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමේ යොදවන්න.

පියවර 5.1.3.3

- කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සදොස් තැන් නිවැරදි කරගැනිමට උපදෙස් දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • ජන සංගීත ආකෘතියට අනුව දෙපානෝ නාට්‍ය ගීත නිර්මාණය වී ඇති බව.<br>• උත්තර භාරතීය සංගීතයේ ඇසුර ලබමින් නිර්මාණය වූ පේමතෝ ජායතී හි ගීත වඩාත් සංකීර්ණ බසකින් හා තනුවකින් යුතු බව.<br>• කුණ්ඩලකේශී අන්න බලන් සඳ... ගීතය සරල හා රසවත්ව වයස් භේදයෙන් තොරව රස විඳිය හැකි බව.<br>• මේ අනුව මේවා ගීත නාට්‍යයන්හි ගීත බව. |

(මිනිත්තු 40 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- ගීත නාට්‍ය ශෛලියේ ගීත පිළිබඳව අදහස් ප්‍රකාශ කරයි.
- ගීත නාට්‍යයක සංගීත නිර්මාණයේ දී අදහස තේමාව උද්දීපනය වන සේ ගීත, දෙබස් ගායනා නිර්මාණය කිරීමෙහි වැදගත් බව පිළිගනියි.
- ගීත නාට්‍ය ගීත පෙළගස්වයි.
- ගුණාත්මක බවින් අනූන ගීත නාට්‍ය ගීත පිළිබඳව සොයා බලයි.
- නාට්‍ය ගීත එක් රැස් කර රසවිඳීමට පෙළඹෙයි.


**ඇමුණුම 5.1.2.1**

**කාර්ය පත්‍රිකාව**

- දෙපානෝ ගීතය - කොයි යන්නට එනවද බොල
- පේමතෝ ගීතය - ඇඳුරුතුමා වන්න මගේ
- කුණ්ඩලකේශී ගීතය - අන්න බලන් සඳ රන් තැටියෙන්

ඇඳුරු තුමා වන්න මගේ

ඇඳුරුතුමා වන්න මගේ - නුදුන් නමුත් ශිල්ප ශාස්ත්‍ර
ජීවිතයේ ගිරි දුර්ගය - නගින්ට අත් වැලක් දෙන්න //
මහට දෙන්න ගුරු උපදෙස් - වියෝ වෙතත් මා ඔබගෙන් //
නිරන්තර ව සිහියට එන - සමීපයෙන් ඉවත් නො වී
දුකටත් සැපටත් දෙකට ම - නො හරින හිත මිතුරෙකු සේ



නාට්‍යය- ප්‍රේමතෝ ජායති සෝකෝ

පද රචනය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

තනු රචක - ජයන්ත අරවින්ද

(ගීත ස්වර ප්‍රස්තාරකරණය - ජයන්ත අරවින්ද මහතාගේ අත් අකුරින් )

**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත් දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.2** : **ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිතා වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි.**

**ක්‍රියාකාරකම 5.2.1** : 'ගිටාරය'

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම් 01 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව.
- ඇමුණුම අංක 02 ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම අංක 03 ඇතුළත් ගිටාර් වාදන පටිගත කළ කැසට් පටයක්, කැසට් යන්ත්‍රයක්, ගිටාරයක්

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 5.2.1.1**
- ඇමුණුම් අංක 01 හි දැක්වෙන වාදක මණ්ඩලයක පින්තූර සටහන ප්‍රදර්ශනය කරන්න..
- එහි ඇති සංගීත භාණ්ඩ සිසුනට හඳුනා ගැනීමට ඉඩ සළසා ඒවා නම් කිරීමට යොමු කරන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • පින්තූර සටහනේ දක්නට ඇත්තේ ගිටාර් යන භාණ්ඩය බව.<br>• වර්තමානයේ ගිටාරය සංගීත නිර්මාණ සඳහා බොහෝ සෙයින් යොදා ගන්නා බව.<br>• ගිටාරය විශේෂයෙන් යොවුන් පරපුරේ ඉතා ජනප්‍රිය වාද්‍ය භාණ්ඩයක් බව.<br>• එය දේශීය හා සරල සංගීතයේත්, රාගධාරී සංගීතයේත් භාවිතා කරන බව |

(මිනිත්තු 10 යි)

**පියවර 5.2.1.2**
- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 01 ට අයත් කියවීමේ පත්‍රිකාව , 02 ට අයත් ගිටාර් වර්ගවල ඡායාරූප සහ කාර්ය පත්‍රිකා එම කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- එම කණ්ඩායම් ක්‍රියාකාරකම්හි යොදවන්න.
- එම කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 5.2.1.3**
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්හි සදොස් තැන් නිදොස් කර ගැනීමකට ගුරුවරයා සහාය වන්න..
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- ගිටාරය තත් වාද්‍ය භාණ්ඩයක් බව.
- එය බටහිර සංගීතයේ මෙන්ම උත්තර භාරතීය සංගීතයේ ද යොදා ගන්නා බව.
- විද්‍යුත් ගිටාර වර්ග තුන රිදම්, ලීඩ්, බේස් යනුවෙන් නම් වන බව.
- ඒවායේ නාදමය ගුණය සහ භාවිතය එකිනෙකට වෙනස් බව.
- ගිටාර් වාදනයට සුවිශේෂ පුහුණුවක් අවශ්‍ය වන බව.

(මිනිත්තු 10 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- ගිටාරය පිළිබඳ අදහස් දක්වයි.
- ගිටාර් වර්ග කරයි.
- එක් එක් ගිටාර් වර්ගයේ ස්වර යෙදෙන අයුරු පැහැදිලි කරයි.
- ගිටාර් වාදනයට කැමැත්ත පළ කරයි.
- ගිටාර් වාදන රස විඳියි.

**ඇමුණුම අංක 01**

**කියවීම් පත්‍රිකාව**

1. Acoustic Guitar

මේ නමින් හැඳින්වෙන ගිටාර් පහත දැක්වෙන නම් වලින් ද හැඳින්වේ.

Box Guitar

Spanish Guitar

Electrical Guitar

12 String Guitar

ඉහත සඳහන් Guitar වර්ග වල එකිනෙක සුළු වෙනස්කම් පැවතුනද, ස්වර වර්ණයේ, හැඩයේ සහ වාදන ඉරියව් එකිනෙක සමානය. ලෝහමය තත් වෙනුවට නයිලෝන් තත් (තංගුස් ) යෙදීම, හැඩයේ වෙනස්කම් තිබීම, තත් 6 ක් වෙනුවට එක් ස්වරයකට 2 බැගින් 12 ක් යෙදීම. වාදනයේ දී දකුණත ඇඟිලි හැසිරවීමේ, සුළු වෙනස්කම් ඇත.

2. Electric Guitar

මේ නමින් හැඳින්වෙන ගිටාර් වර්ග 3 කි.

Rhythm Guitar


Lead Guitar

Bass Guitar


මෙම ගිටාර් විදුලිය හා සම්බන්ධ කිරීමෙන් පමණක් හඬ නිකුත් වේ. ඒ සඳහා ඇම්ප්ලිෆයර් හා බෆල් යන කොටස්, අවශ්‍යය. රිදම් ගිටාරයෙන් තාලයට කෝර්ඩ්ස් වාදනය කිරීමටත් , ලීඩ් ගිටාරයෙන් ප්‍රධාන තනුව හා සම්බන්ධ කොටස් වාදනයත්, බේස්


ගිටාරයෙන් ගීතයේ රිද්මයට අනුව කෝර්ඩ්ස් හා ඒ ආශ්‍රිත නිර්මාණාත්මක ස්වර ඛණ්ඩ ඉතා පහළ ස්වරයෙන් වාදනයත් කරනු ලැබේ.

01




02



1. Neck 2. Strings 3. Arm 4. Box 5. Sound Hall

6. Bridge 7. Tail Piece 8. Frets 9. Tuning key




**ඇමුණුම 02**

**කාර්ය පත්‍රිකාව**


- ගිටාරය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- ගිටාර් වර්ග කරන්න.
- රූප සටහනේ 2 හි දැක්වෙන ගිටාරයේ අංක කරන ලද කොටස් නම් කරන්න.
- රිදම් ගිටාරයේ තත් සුසර කරන ස්වර පිළිවෙලින් ලියා දක්වන්න.
- රූප සටහනෙහි 2 හි දැක්වෙන Frets මත අංක 1 සිට 15 දක්වා රවුමක් ඇඳ ඇති තැන්වල පිහිටන ස්වර ලියන්න.
- එම රූප සටහනට සමාන රූප සටහනක් ඇඳ රි. ග, ධ නි, ම (D E A B F) ස්වර පිහිටන ස්ථාන ලකුණු කරන්න.
- එම රූප සටහනට සමාන රූප සටහනක් ඇඳ පහත දැක්වෙන chords වලට අයත් ස්වර පිහිටන තැන් ලකුණු කරන්න.
  C Major - (ප ස ග ප ස ග)
  G Major - ( ප නි රි ප නි ප)
  F Major - (ම ධ ස ධ ම ස )

- බේස් ගිටාරයේ තත් 4 කි. ඒවා සුසර කරනුයේ ග ධ රි ප යන ස්වර වලටය. බේස් ගිටාරයේ ස්වර වාදනය පිළිවෙල කිහිපයක් මෙසේ ය. (C Major Chord පදනම් කර ගනියි.)




ඉහත ක්‍රම ශිල්ප අනුව C major එකට අයත් ස්වර යොදා ගනිමින් මාත්‍රා 3 න් 3 ට හෝ 4 න් 4 ට හෝ 6/8 රිද්මයට ගැලපෙන ලෙස Bass ගිටාරය වාදනය කළ හැකි රිද්ම රටාවක් නිර්මාණය කරන්න.

රූප සටහන 02


6th
5th
4th
3rd
2nd
1st
E
A
D
G
B
E
1
2
3
4
5
6
7
8
9
10
11
12
13
14
15
1st Frets
2nd Frets
3rd Frets
4th Frets
5th Frets

**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත් දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.2** : **ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිතා වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි.**

**ක්‍රියාකාරකම 5.2.2** : **'එකෝඩියන් සහ එහි ස්වර පිහිටන අයුරු...'**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම් 01 ඇතුළත් කියවීම් පත්‍රිකාව.
- ඇමුණුම අංක 02, ඇතුළත් කාර්ය පත්‍රිකාව
- එකෝඩියන් වාදනයක් ඇතුළත් දෘශ්‍යධාරකයක් (සංගම් චිත්‍රපටයේ එකෝඩියන් වාදනය ඇතුළත් VCD පටයක් )
- 'ස්වර පුවරු සංගීත භාණ්ඩ' ආර්.එම්.පී. චන්ද්‍රසිරි රණසිංහ
- 'ස්වර පුවරු වාද්‍ය දීපනී' විශාරද සුදත් සමරසිංහ

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 5.2.2.1**
- එකෝඩියන් වාදනය සිසුන්ට ශ්‍රවණය කරවන්න.
- ඇමුණුම අංක 03 ඇතුළත් ඡයාරූප ප්‍රදර්ශනය කරන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • එකෝඩියන් භාණ්ඩය පහසුවෙන් වාදනය කළ හැකි බව.<br>• එකෝඩියන් භාණ්ඩය හින්දි චිත්‍රපට සංගීතය සඳහා බෙහෙවින් යොදාගෙන ඇති බව.<br>• එදිනෙදා ජීවිතයේ වින්දනාත්මක, විවේක අවස්ථාවන් හා සම්බන්ධව එකෝඩියන් භාණ්ඩය බහුලව යොදාගත් බව. |

(මිනිත්තු 10 යි)

**පියවර 5.2.2.2**
- කියවීම් පත්‍රිකාව සිසුන් අතර බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.
- ක්‍රියාකාරකම්හි යොදවන්න.
- ස්වයං අධ්‍යයනයට මඟ පෙන්වන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 5.2.2.3**
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්හි සදොස් තැන් නිදොස් කර ගැනීමට ගුරුවරයා සහාය වන්න..
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • එකෝඩියනය සුෂිර වාද්‍ය භාණ්ඩයක් බව.<br>• මෙය බටහිර සංගීත භාණ්ඩයක් වුවද පෙරදිග ද බහුලව භාවිතා වෙන බව.<br>• සරල සංගීතය සඳහා යොදා ගෙන ඇති බව. |

- එකෝඩියනයේ ස්වර පුවරුව දකුණතින් හා බේස් පුවරුව වමතින් ද වාදනය කරන බව.
- පියානෝ එකෝඩියනය හා බට්න් එකෝඩියනය වශයෙන් වර්ග දෙකක් ඇති බව.
- දකුණතින් ගීතයත් වමතින් තාලයත් (Bass & Chords) රිද්මයානුකූලව එකතු වීමෙන් සැදුන එකෝඩියනය ඉතා විචිත්‍ර නාද සංයෝගයක් ඇති සංගීත භාණ්ඩයක් බව.

(මිනිත්තු 10 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- එකෝඩියන් වර්ග පිළිබඳව පැහැදිලි කරයි.
- එකෝඩියන් වාදනය සඳහා පෙළඹෙයි.
- ව්‍යවහාරික සංගීතයේ එකෝඩියන් වාදන කොටස් ඇති තැන් සොයා බලා රස විඳියි.
- අනෙක් සංගීත භාණ්ඩ හා එකෝඩියන් වාදනයෙහි භාව නිරූපණ ගුණය සංසන්දනය කරයි.

**ඇමුණුම 01**

**කියවීම් පත්‍රිකාව**

**එකෝඩියනය**

එකෝඩියනය බටහිරින් ආරම්භව ලොව පුරා ව්‍යාප්තව ඇති ස්වර පුවරු භාණ්ඩයකි. 19 වන සියවසේ පමණ එළි දක්වන ලද එකෝඩියනය button & piano accordian වශයෙන් වර්ග දෙකකි. මෙය සුළඟේ ආධාරයෙන් නාදය නිපදවන 'සුෂිර' ඝණයට අයත් වේ. මෙහි විශේෂත්වයක් වන්නේ බැලෝව සර්පිනාවේ බැලෝවට වඩා විශාල වීමයි. එය ඇදීමෙන්, තල්ලු කිරීමෙන් යන දෙයාකාරයෙන්ම ස්වර නිකුත්වන සේ නලා යොදා ඇත. සෑම විටම එක් ස්වරයක් සඳහා නලා යුගලයක් සම්බන්ධ කර ඇත. කරෙහි එල්ලා ගත් එකෝඩියනයේ දකුණු පස ඇති යතුරු පියානෝවේ හා අනෙකුත් යතුරු පුවරු භාණ්ඩවල යතුරු වලට සමානය. එම යතුරුවලින් ගීතයේ තනුව වාදනය කෙරේ. වම් පස ඇති බොත්තම්වලින් bass & chords රිද්මයානුකූලව වාදනය කෙරේ. මෙම එකෝඩියන් වෙළෙඳ පොලේ ප්‍රමාණ කිහිපයකින් දක්නට ලැබේ. එනම් Bass 16- 28 32- 48, 60 - 96, 120 ත් ආදී වශයෙනි.

දකුණත උපයෝගී කර ගනිමින් ගීතයක තනුව වයන විට වමතින් Bass button රිද්මයානුකූලව තද කිරීමෙන් වාදනය ඉතා විචිත්‍ර කර ගත හැක. ඔබ පාසලේ එකෝඩියනයක් ඇත්නම් පහත සඳහන් ලක්ෂණ පිරික්සා බලන්න.

- වමතින් වැයෙන Bass button තිරස් අතට 4 6 8 ලෙස පෙළ ගැසී ඇත්දැයි සොයා බලන්න.
- බැලෝව දෙසින් සිරස් අතට ඇති bass button 2 වන පේළියේ මැදට වන්නට වූ බොත්තමක මධ්‍ය ෂඩ්ජය Middle c  පිහිටා ඇත.
- එය හඳුනා ගත හැකි පරිදි අනිත් බොත්තම්වලට වඩා එහි උඩු කොටස ඇතුළට නෙරා යන අන්දමට පිහිටුවා ඇත.
- වමතේ මැදගිල්ලෙන් එය පිරිමැදූ විට පහසුවෙන් හසුවේ.
- උදා - 48  Bass එකෝඩියනයක Bass  Buttons දෙවන පෙළෙහි ඉහළ සිට පහළින් ඇති 6 වන බොත්තමේ මධ්‍ය ෂඩ්ජය පිහිටා ඇත. (middle c)
- 3 හා 4 පේළි වල  පිළිවෙලින් Major,  Minor Chords පිහිටා ඇත.
- - 1 වන බොත්තමේ ඇත්තේ 3 වන බොත්තමේ පිහිටා ඇති ස්වර සංචිතයේ 2
  1 2 3 4
  වන ස්වරයයි.
- උදාහරණයක් ලෙසට එම පේළිය ගත් විට  ග  ස  c major  c minor ලෙස දැක්විය හැක.



**එකෝඩියන් වාදනයක්**

ඇමුණුම 02

**කාර්ය පත්‍රිකාව**

- කොටස් නම් කරන ලද එකෝඩියනයක රූප සටහනක් තම සටහන් පොතේ පිටපත් කර ගන්න.
- එහි Bass Button පේළි 3 ක කොටසක් පහත දැක්වේ.

| | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| i | - | ප | - | - |
| ii | ග | ස | C major | C minor |
| iii | - | ම | - | - |

- මෙහි සිරස් අතට රෝම ඉලක්කම්වලින් දැක්වෙන කොටු අයත් වන්නේ G C F Chords වලට යි.

2 ඉලක්කම පහළට ඇති කොටුවල එම කෝර්ඩ්ස් තුන ලියා ඇත.

3 හා 4 කොටුවල ඇත්තේ major minor Chords හඬයි.

- එම රූප සටහන හොඳින් අධ්‍යයනය කර ඉතිරි හිස් කොටු පුරවන්න.

ඔබේ පහසුව සඳහා G C F කෝර්ඩ්ස්වලට අදාළ ස්වර ලියා ඇත.

| Major Chords | Minor Chords |
|---|---|
| C Major - C E G (ස ග ප) | C Minor - C $E^{b}$ G (ස ග ප) |
| Major - F A C ( ම ධ ස) | F Minor - F $A^{b}$C (ම ධ ස) |
| Major - G B D ( ප නි රි) | G Minor - G $B^{b}$ D (ප නි රි) |

ඇමුණුම - 03



**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත් දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.2** : **ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිතා වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි.**

**ක්‍රියාකාරකම 5.2.3** : **'විදුලි ඕගනය සහ විද්‍යුත් අවනද්ධ භාණ්ඩ'**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- කණ්ඩායම් සංගීතය ඇතුළත් රූප සටහනක්
- ඕගනයක සහ ඔක්ටපෑඩයක ඡායා රූපයක් හෝ සංගීත භාණ්ඩ
- ඇමුණුම අංක 01 කියවීම් පත්‍රිකාව, ඇමුණුම් අංක 02 කාර්ය පත්‍රිකාව, ස්වර පුවරුවක්

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 5.2.3.1**
- සංගීත භාණ්ඩ රූප සටහන පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම භාණ්ඩ අතුරින් විදුලි ඕගනයක සහ ඔක්ටපෑඩයේ පින්තූරය හඳුනාගත් ළමුන් මගින් පන්තියට එම භාණ්ඩ පිළිබඳ හැඳින්වීමක් කරන්න
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • සංගීත කණ්ඩායම්වල බොහෝ විට ඕගනයක් සින්තසයිසරයක් සහ ඔක්ටපෑඩයක් යොදා ගන්නා බව.<br>• එම භාණ්ඩ ජනප්‍රිය (pop) සංගීත වාදනයේ දී ප්‍රධාන තැනක් ගන්නා බව.<br>• එම භාණ්ඩ වාදනය සඳහා විදුලිය අත්‍යවශ්‍ය වන බව. |

(මිනිත්තු 10 යි)

**පියවර 5.2.3.2**
- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
- කියවීම් පත්‍රිකාවේ පිටපත් එම කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කාර්ය ගවේෂණ පත්‍රිකාවද කණ්ඩායම් අතර බෙදන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 5.2.3.3**
- කණ්ඩායම් දෙකේ ක්‍රියාකාරකම් සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්හි සදොස් තැන් නිදොස් කර ගැනීමකට ගුරුවරයා සහාය වන්න.
- සපයා ඇති ස්වර පුවරුව ආධාර කරගෙන ඕගනයේ තාල රිද්ම හා chords ගීත තනුවක් මගින් ගුරුවරයා වාදනය කර පෙන්වන්න.

- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.
  - දීර්ඝ කාලීන සැලැස්මකට අනුව ඕගනය වර්තමානයේ සින්තසයිසරය දක්වා දියුණු වූ බව.
  - වර්තමානයේ එය පරිගණකය හා අත්වැල් බැඳ ගනිමින් තම ක්ෂේත්‍රය පුළුල් කරගෙන යන බව.
  - විද්‍යුත් භාණ්ඩ අතරින් ඔක්ටපෑඩ් (octapad) ද තම දීර්ඝ ගමන අවසානයේ සාර්ථක විද්‍යුත් අවනද්ධ භාණ්ඩයක් බව.
  - වාදනය කරන්නාගේ අත්දැකීම් හා පළපුරුද්ද අනුව ඔක්ටපෑඩය අවශ්‍ය පරිදි පාලනය කරගත හැකි බව.

(මිනිත්තු 10 යි)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- විදුලි ඕගනය සහ විද්‍යුත් අවනද්ධ භාණ්ඩ නූතන සංගීතයේ බහුල වාද්‍ය විශේෂයක් බව ප්‍රකාශ කරයි.
- වාදන ප්‍රසංගයකදී ඕර්ගනය සහ ඔක්ටපෑඩය යොදා ගැනීමෙන් බොහෝ වාද්‍ය භාණ්ඩ ප්‍රමාණයක සේවය ලබා දිය හැකි බව.
- ඕගනය සහ ඔක්ටපෑඩය ඇති නාද තමන්ට අවශ්‍ය පරිදි පෙළ ගස්වයි.
- ඕගනය හා ඔක්ටපෑඩය භාවිතය ශිල්පීය සංගීතයට කරනු ලබන අභියෝග හඳුනා ගනියි.

ඇමුණුම 01

**විදුලි ඕගනය සහ ඔක්ටපෑඩ්**

- මෙය ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක් සහ විද්‍යුත් අවනද්ධ භාණ්ඩයක් වේ.
- මෙවායේ හඬ නිපදවන්නේ විදුලි ධාරාවක් මගින් ඇති කරනු ලබන කම්පන සංඛ්‍යාත්මක නාදයක් ස්පීකරණයක් මගින් විකාශනය කිරීම මගිනි.
- දීර්ඝ කාලීන සංවර්ධන සැලැස්ම වල ප්‍රතිඵලයක් ලෙස මෙම භාණ්ඩ වත්මන් දියුණු තත්ත්වයට පත්ව ඇත.
- නාදයේ ගුණාත්මක බව වෙනස් කිරීම
- තාල, රිද්ම, රටා යොදා ගැනීම්
- මතකය ගබඩා කර ගැනීම් ආදී සංකීර්ණ උපාංග සහිත භාණ්ඩයක් ලෙසටත්, ඕර්ගනය, ස්වර පුවරු පවුලේ ප්‍රමුඛයා ලෙසටත් හඳුන්වා දිය හැකි ය.
- ඕර්ගනය දියුණු වූ පසු සින්තසයිසරය ලෙස හඳුන්වයි.
- පාරිභරික තාක්ෂණය මගින් වඩාත් දියුණු වී ඇති ඕර්ගනය ඩිජිටල් තාක්ෂණය සමඟ අත්වැල් බැඳ ඇත.
- තාල වාදනය සඳහා ව්‍යවහාරික සංගීතයේ අද වැඩියෙන්ම භාවිත කරන්නේ ඔක්ටපෑඩයයි.
- සතරැස් හැඩයෙන් යුක්තය. එය හරි හතරැස් කොටු 8 කට බෙදා ඇත.
- විද්‍යුත් උපකරණයකි.

- වාදනය සඳහා කුඩා කෝටු 2 ක් යොදා ගනියි. (Stick)
- මෙහි . "Drum machine" නම් කොටසට විදුලිය සම්බන්ධ වේ.
- Mixture හරහා ඇම්පිලිෆයරය සම්බන්ධ වීමෙන් හඬ තීව්‍ර වේ.
- කොටු 8 ට අමතර පැත්තකින් ඇති කොටස Digital Counter නමින් හැඳින්වේ.
- එහි ඇති අංක අවශ්‍ය පරිදි හැසිරවීමෙන් හඬ සකසා ගැනේ.
- ඔක්ටපෑඩයෙන් බටහිර සමාඝාත භාණ්ඩ වන තබ්ලා, රබාඩ්ස්ටික්, ටැම්බරින් ඩිම්බල් ආදි හඬට සමානව වාදනය කෙරේ.

කාර්ය පත්‍රිකාව

- ඕර්ගනයක ස්වර පුවරුවක් ඇඳ ස්වර නම් කරන්න.
- සංගීත සංදර්ශනවල හා සංගීත පටිගත කරන ශබ්දාගාරවල ඕර්ගනය හා ඔක්ටපෑඩය








ඔක්ටපෑඩ්




සින්තසයිසරයක්

**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත් දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.2** : **ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිතා වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි.**

**ක්‍රියාකාරකම 5.2.4** : **'කැලිප්සෝ කණ්ඩායම්'**

**කාලය** : කාලච්ඡේද 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- කැලිප්සෝ සංගීත කණ්ඩායම් වල ඡායාරූප හා නූතන සංගීත කණ්ඩායම් වල ඡායාරූප
- ඇමුණුම අංක 1 ගීත පත්‍රිකාව
- ඇමුණුම අංක 2 ඇතුළත් කාර්ය පත්‍රිකාව

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 5.2.4.1**
- සංගීත කණ්ඩායම්වල පින්තූර වර්ග දෙක පන්තියට ඉදිරිපත් කරන්න.
- එම ඡායාරූප හඳුනාගෙන ඇත්දැයි විමසන්න.
- කැලිප්සෝ සංගීත කණ්ඩායම් ගීත ලැයිස්තුවේ එන ගීතයක් සිසුන් සමඟ ගායනය කරන්න.
- පහත සඳහන් කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - කණ්ඩායම් ගීත ඉතා සරල හා පහසුවෙන් ගායනය කළ හැකි බව.
> - එම ගීතවල රිද්මය ඕනෑම කෙනෙකුට පහසුවෙන් රස විඳිය හැකි බව.
> - අතින් තාල තබමින් සමූහය හා එක්ව ගායනයට හවුල් වූ බව.

(මිනිත්තු 10 යි)

**පියවර 5.2.4.2**
- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
- උපදෙස් පත්‍රිකාවේ පිටපත් එම කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- එම කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න.
- කණ්ඩායම් දෙක ඉදිරිපත් කිරීමකට සූදානම් කරන්න.

(මිනිත්තු 30 යි)

**පියවර 5.2.4.3**
- කණ්ඩායම් දෙකේ ක්‍රියාකාරකම් සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම්හි සදොස් තැන් නිදොස් කර ගැනීමකට ගුරුවරයා සහාය වන්න.
- සපයා ඇති ගීතයක් සිසුන් හා එක්ව ගායනය කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- කැලිප්සෝ සඳහා ගිටාර් එකෝඩියන් කොංගෝ ඩ්‍රම්ස් වැනි භාණ්ඩ සීමිත ප්‍රමාණයන් භාවිතා කරන බව.
- කොංගෝ බෙරය හා ගිටාරය කැලිප්සෝ කණ්ඩායම් නිතැතින්ම යොදා ගන්නා බව.
- වාදකයින් සියලු දෙනාම වාදනය කරමින් ගායනය කරන බව.
- බොහෝ දෙනෙකුට පහසුවෙන් ගායනය කළ හැකි ගීත තෝරා ගනිමින් ප්‍රේක්ෂක ජනතාවද ගායනය සඳහා හවුල් කරගන්නා බව.
- ව්‍යවහාරයේ පවතින ගීතවලට කැලිප්සෝ සංගීතය යොදා ගත හැකි බව.

(මිනිත්තු 40 යි )

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- කැලිප්සෝ සංගීතය පිළිබඳව විස්තර කරයි.
- කැලිප්සෝ සංගීතය සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ හා ගීත පිළිබඳ පැහැදිලි කරයි.
- ගීත ගායනය හා වාදනය කරයි.
- කැලිප්සෝ සංගීත භාණ්ඩ වාදනය සඳහා පුහුණු වෙයි.
- විවේකය ගත කිරීම සඳහා  කැලිප්සෝ ගීත එකතුවක් සුදානම් කරයි.

**ඇමුණුම 5.2.4.1**

**විස්තර පත්‍රිකාව**

- කැලිප්සෝ යනු කණ්ඩායම් ගීත වෙසෙසකි.
- මේවා සජීවීව ඉදිරිපත් කිරීම විශේෂ ලක්ෂණයකි.
- කැලිප්සෝ ඉතා සීමිත සංගීත භාණ්ඩ කිහිපයක් භාවිතා කරයි.
- කොංගෝ බෙරය, ටැම්බරිනය, එකෝඩියන, ගිටාරය, මර්කාස්,  ආදියයි
- වාදකයින් සියලු දෙනාම සංගීත භාණ්ඩ වාදනය කරමින් ගීත ගායනයේ යෙදීම කැලිප්සෝ සංගීතයේ විශේෂ ලක්ෂණයකි. බොහෝ විට යොදා ගත්තේ කණ්ඩායම් ගීතයි.
- උදා -ධර්මරත්න සහෝදරයෝ - මී මැස්සෝ - ත්‍රී සිස්ටර්ස්, ලොස් කැබ්රලෝස්,
- ප්‍රසාංගික බව ඇතිවන සේ එකම තැනක නො රැඳී ප්‍රේක්ෂක ජනතාව අතර රැඳෙමින් ගීත ගායනය/වාදනය ඉදිරිපත් කිරීම කැලිප්සෝ කණ්ඩායම්වල ඇති විචිත්‍ර ලක්‍ෂණයකි.
- සමහර අවස්ථාවල ප්‍රේක්ෂක ජනතාවද ගායනයට හවුල් වීමද විශේෂයකි.
- ගායනය සඳහා විවිධ භාෂාවලින් රචිත ගීත ද ගායනය කෙරේ.
- සරල තනු ඉතා මනරම්ව ගායනය කෙරේ.
- ගායනය තුළ harmony කිරීමද විචිත්‍රත්වයට තවත් හේතුවකි.
- කැලිප්සෝ කණ්ඩායම් ගයන ගීත කිහිපයක්
    - මුළු ගතම වෙහෙසුනා
    - මංගෝ කළු නැන්දේ,
    - සිරි ලංකාවෙ එළිය මිණි පුරයි.
    - කාගෙද ගොන් වස්සා

ඉහත සඳහන් ගීත අතරින් කැමති ගීතයක් තෝරා ගෙන කැලිප්සෝවක ස්වභාවයෙන් ගුරුවරයා සමග කණ්ඩායම් ගීතයක් ගයන්න. හැකි අවස්ථාවන්වලදී Harmony කොටස් ඉදිරිපත් කරන්න. මේ සඳහා පහත දැක්වෙන සංගීත භාණ්ඩ හැකි පමණින් යොදා ගන්න.

1 වයලින් 5 ගිටාර්
2 එකෝඩියන් 6 ටැම්බරින්/ කොංගෝ/රබාන්
3 මවුත්ඕගන් 7 මර්කාස්
4 මැන්ඩලින්

**ඇමුණුම 5.2.4.2**

**කාර්ය පත්‍රිකාව**

පහත සඳහන් ඡේදය සම්පූර්ණ කරන්න. මේ සඳහා පහත සඳහන් ආධාරක වචන උපයෝගී කරගන්න. (කණ්ඩායම් සංගීතයක්, සජීවි, කොංගෝ, බෙරය, ගිටාර්, ගායනයේ , එකෝඩියන්, විදුලි බලය, ටැම්බරින්, ඉංග්‍රීසි, දමිළ, ධර්මරත්න සහෝදරයෝ, මී මැස්සෝ, ත්‍රී සිස්ටර්ස්, මංගෝ කළු නැන්දේ, මුළු ගතම වෙහෙසුනා)

අප්‍රිකානු සම්භවයක් සහිතව කුඩා ශාලා තුළ .............................. ව ඉදිරිපත් කරන ................................ ක් ලෙස කැලිප්සෝ සංගීතය හැඳින්විය හැකි ය. මේ සඳහා .................. ........................ , .............................., ,.......................... වැනි සංගීත භාණ්ඩ භාවිතා කරයි. කණ්ඩායමේ සියළු දෙනාම සංගීත භාණ්ඩ වාදනය කරමින් ........................, යෙදෙති. ........................, ,........................., ......................................... වැනි පැරණි සංගීත කණ්ඩායම්වල ගීත වත්මනෙහි කැලිප්සෝ සංගීත කණ්ඩායම්වල බෙහෙවින් භාවිතා කරයි. ඒ අතරින් ............................., සිරි ලංකාවේ එළිය මිණිපුරයි, ..................., වැනි ගීත ඉතා ජනප්‍රිය වේ. සිංහල ගීතවලට අමතරව.............................., .............................. වැනි වෙනත් භාෂාවලින් රචිත ගීතද ගායනයේ යෙදෙති.



**කැලිප්සෝ සංගීත කණ්ඩායමක්**

**නිපුණතාව 6.0** : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 6.1** : **කටහඬෙහි විවිධ හඬතල භාවිත කරමින් නාද නිර්මාණය කරයි**

**ක්‍රියාකාරකම 6.1.1** : **'විවිධ හඬතල හඳුනා ගෙන ගයමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- හඬතල යොදා නිර්මාණය කර ඇති ගීත ඇතුළත් කැසට් පට
- කැසට් යන්ත්‍රය

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 6.1.1.1**

- විවිධ හඬතල භාවිතාවන ගායනයක් ශ්‍රවණයට සලස්වන්න. (ආචාර්ය පේමසිරි කේමදාසයන්ගේ - කිලර්,දොරමඩලාව, ඔපෙරාව අඳුරු කුටිය තුළ, උදුම්බරා හිනැහෙනවා වැනි ගීත)
- එය නැවත නැවත අසන්නට සලස්වමින් වෙන් වෙන්ව ගැයෙන හඬතල ශ්‍රවණය කිරීමට සිසුන් හුරු කරවන්න.
- පහත කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • බටහිර සංගීතයේ දී ප්‍රධාන වශයෙන් හඬතල හතරක් භාවිත කරන බව. |
| • ගායනයේ දී වෙන්ව වාදනයේ දී ද එම හඬ තල භාවිත වන බව. |
| • එම හඬතල වෙන් වෙන්ව ශ්‍රවණය කිරීම මනා අවධානයකින් හා පුහුණුවකින් කළ යුතු බව. |
| • පෙරදිග සංගීතයේ ගායන වාදනවල විවිධ හඬතල භාවිතය මීට සමාන නොවන බව. |

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.1.2**

- ඇමුණුම 01 ප්‍රදර්ශනය කරන්න.
- ඇමුණුම 01 හි ඇතුළත් වගුවේ එක් එක් තීරු පිළිබඳව පහදා දෙමින් සිසුන් හා සාකච්ඡා කරන්න.
- ඇමුණුම අංක 01 සටහන් පොතේ සටහන් කර ගැනීමට සලස්වන්න.
- ඇමුණුම අංක 02 සිසුන් අතට පත් කර එහි ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීමට සලස්වන්න.

(මිනීත්තු 60 යි)

**පියවර 6.1.1.3**

- කණ්ඩායම් හතර හොඳින් ගායනය ඉදිරිපත් කරන මට්ටමට පත්වූ පසු එක් එක් කණ්ඩායමකින් වරකට එක් අයකු හෝ සංඛ්‍යාව අනුව කිහිප දෙනෙකු බැගින් හෝ ගායනයෙන් වලක්වා සෙසු අය ඉදිරිපත් කරනු ලබන ගායනය ඉතා හොඳින් ශ්‍රවණය කිරීමට පොළඹවන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

  - නිවැරැදිව ඉදිරිපත් කිරීමේ දී ඉතා මිහිරි හඬක් නිකුත් වන බව.
  - තමාගේ කොටස නිවැරදිව ගැයීමට මනා පුහුණුවක් හා අවධානයක් අවශ්‍ය බව.
  - කණ්ඩායමක් තුළ තම වගකීම් හා යුතුකම් නොපිරිහෙලා ඉටු කළ යුතු ය යන්න පිළිබඳ පණිවිඩයක් හා පුහුණුවක් ලබා දෙන බව.

(මිනිත්තු 40 යි )


**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- බටහිර සංගීතයේ හඬ තල හතරක් භාවිත බව දැන ගනියි.
- සමූහ ගායනයක් ඉදිරිපත් කිරීමට හුරුව ලබයි.
- විවිධ හඬතල එකතුව ඉදිරිපත් කරනු ලබන ගායනයක් ඉතා මිහිරි බව වටහා ගනියි.
- අවධානය රැක ගැනීමට හුරු වෙයි.
- විවිධ හඬතල එක් කරමින් නිර්මාණය කළ ගී එක්රැස් කරයි.

ඇමුණුම 01

| හඬතලය | ස්වර පරාසාය | ගායනය | අදාල වාද්‍ය භාණ්ඩය |
|---|---|---|---|
| Soprano | ස සිට ධ̇ | ගැහැණු - ගැහැණු ළමුන් | වයලීනය |
| Alto | ප̣ සිට ග̇ | පිරිමි - පහළ පරාසයක්<br>ගැහැණු - ඉහළ පරාසය | වියෝලා |
| Tener | ප̣ සිට ධ | පිරිමි | චෙලෝ |
| Bass | ම̣ සිට ම | පිරිමි | ඩබල් බේස් |

ඇමුණුම 02




**ගුරු උපදෙස්**

පියවර 01 - ක්‍රියාකාරකමේ හඬතල හතරට අයත් ස්වර පරාසයක් ගායනා කිරීමට ඇති හැකියාවට අනුව පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට වෙන් කරන්න.

පියවර 02 - කණ්ඩායම් සඳහා අදාළ වූ ස්වර පාදය වෙන වෙනම පුහුණු කරවන්න. (විනාඩි 30)

පියවර 03 - වෙන් වෙන්ව පුහුණුවූ ස්වර ඛණ්ඩ කණ්ඩායම් හතර ලවා එකවර ගායනය කරවන්න.

**නිපුණතාව 6.0** : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 6.1** : **කටහඬෙහි විවිධ හඬ තල භාවිත කරමින් තනු නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.2** : **'ස්වර සුසංයෝගයේ මිහිර විඳිමු'**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ස්වර පුවරු භාණ්ඩයක්
- ඇමුණුම අංක 01 ට ඇතුළත් පත්‍රිකාව

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 6.1.2.1**
- ඇමුණුම අංක 01 හි සඳහන් ස්වර පාද 3 වාදනය කර සාකච්ඡා කරන්න.
- පහත කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - බටහිර සංගීතය හාමනි මත පදනම් වූ සංගීත ක්‍රමයක් බව.
> - විවිධ හඬතලවලට අනුව ස්වර රචනා කිරීමේ දී පදනම් කර ගනුයේ ද හාර්මනි සිද්ධාන්තය පදනම් කොටගෙන බව.

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.2.2**
- ඇමුණුම 02 හි ඇතුළත් ස්වර මාලාව සිසුන්ට සටහන් කර ගැනීමට සලස්වන්න.
- එහි දක්වා ඇති උපදෙස් අනුව සිසුන්ට හාර්මනි පිළිබඳ අවශ්‍ය අත්දැකීම් හා පුහුණුව ලබා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 80 යි)

**පියවර 6.1.2.3**
- සිසුන් ලද අත්දැකීම් පිළිබඳව අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - හාර්මනි භාවිතය ඉතා මිහිරි බව.
> - සෑම ස්වරයක්ම එකිනෙක හාමනි නොවන බව හා නොගැළපෙන ස්වර ඇති බව.
> - මනා පුහුණුවක් හා සංයමයක් හාර්මනි ගායනයට අත්‍යවශ්‍ය බව.
> - හාර්මනි භාවිතයෙහි විවිධ භාවයන් නිරූපණය කළ හැකි බව.
> - කතෝලික ගායනා තුළ හාර්මනි නිරතුරුවම දැකිය හැකි බව.
> - ස්වර සංවාදනය හාර්මනි යන අර්ථය වන බව.


(මිනිත්තු 20 යි)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- හාර්මනි ඉතා මිහිරි බව වටහා ගනියි.
- හාර්මනි ගායනයට පෙළඹෙයි.
- බටහිර සංගීතයේ ප්‍රධාන සිද්ධාන්තයක් බව වටහා ගනියි.
- හාර්මනි මගින් බටහිර හඬ නිරූපණය වන බව අත් දකියි.
- හඬතල ඇසුරු කරමින් සංගීත සංධ්වනි නිර්මාණයට පෙළඹෙයි

**ඇමුණුම 01**

- වයලින් තුනක් හෝ විවිධ සංගීත භාණ්ඩ 3 ක් යොදා ගනිමින් පහත දැක්වෙන ස්වර පාද 3 ක් එකවර වාදනය කරමින් ඇතිවන වෙනස සිසුන් සමග සාකච්ඡා කරන්න.



**ඇමුණුම 02**

| | | | | |
|---|---|---|---|---|
| 1 | ස - ග රි | ග - ම - | ග - රි - | ස - - - |
| 2 | G - P M | P - D - | P - M | G - - |
| 3 | ප - නි ධ | නි - ස් - | නි - ධ - | ප - - - |

1 = Melody part
2 = 3rd Harmany
3 = 5th Harmany

**ගුරු උපදෙස් -**

පහත උපදෙස් අනුව සිසුන් පුහුණු කරවන්න.

පළමු කාල ඡේදය තුළ (විනාඩි 30)

පියවර 01- ඉහත ස්වර පේළි තුනම තනි ගීතයක ස්වර පේළි තුනක් බව සිතා ගැයීමට හුරු කරවන්න.

පියවර 02 - සිසුන් කණ්ඩායම් තුනකට වෙන් කර ස්වර ඛණ්ඩ තුන කණ්ඩායම් වලට බෙදා දී වෙන වෙනම පුහුණු කරවන්න.

දෙවන කාල ඡේදය දී

පියවර 01- කණ්ඩායම්වලට අයත් ස්වර ඛණ්ඩ නැවත වෙන වෙනම පුහුණු කරවන්න.

පියවර 02 - කණ්ඩායම් තුනම ලවා එකවර ගැයීමට සලස්වන්න.

පියවර 03 - එක් එක් කණ්ඩායමෙන් වරකට එක්කෙනෙකු බැගින් හෝ සිසුන් සංඛ්‍යාව අනුව කිහිප දෙනා බැගින් හෝ නිශ්ශබ්ද කරවා සෙසු පිරිස් ඉදිරිපත් කරන ගායනය ඇසීමට සලස්වන්න. හාර්මනි හඳුනාගැනීමට හා රස විඳීමට යොමු කරවන්න.

තුන්වන කාල ඡේදය තුළ (පළමු විනාඩි 30)

පියවර 01- 5.2.4 ක්‍රියාකාරකමට (කණ්ඩායම් ගී ගායනය) අයත් ගීතයකට ගැළපෙන සේ හාර්මනි නිර්මාණය කර (ගුරුවරයා විසින්) සිසුන් ලවා ගයවන්න.

**නිපුණතාව 7.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකයා වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 7.1** : **බටහිර සංගීත සංකල්ප හඳුනාගනිමින් භාවිත කරයි.**

**ක්‍රියාකාරකම 7.1.1.** : **'බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරමු'**

**කාලය** : කාලච්ඡේද 06 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය උපකරණ
- කාර්ය පත්‍රිකා අංක 01 හි ඡායා පිටපත්.
- බටහිර ප්‍රස්තාර කඩදාසි

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 7.1.1.1**
- ඇමුණුම අංක 01 හි ඇතුළත් ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න.
- 8 ශ්‍රේණියේ දී ඉගෙනගත් කරුණු අනුව එහි ඇති ස්වර පෙරදිග ක්‍රමයට පෙරලා ලිවීමට යොමු කරන්න.
- සියලු දෙනාම සමඟ එම ස්වර කොටස ගයා බලන්න.
- පහත කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - බටහිර සංගීත ප්‍රස්තාරවල දී විවිධ සංකේත භාවිත වන බව.
> - ශුද්ධ ස්වර, කෝමළ ස්වර සහ තීව්‍ර ස්වර දැක්වීමට වෙන වෙනම සංකේත යොදන බව.
> - නිශ්ශබ්ද මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට වෙනවෙනම සංකේත යෙදෙන බව.
> - මාත්‍රා සංඛ්‍යාවක් ඇදීම සඳහා ද සංකේතයක් භාවිත වන බව.

(මිනිත්තු 40 යි)

**පියවර 7.1.1.2**
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- කාර්ය පත්‍රිකාව බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාවේ දැක්වෙන උපදෙස් පහදා දෙන්න.
- ක්‍රියාකාරකම්හි යොදවන්න.
- ස්වයං අධ්‍යයනය මඟ පෙන්වන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 7.1.1.3**
- ප්‍රස්තාර කළ කොටස් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අන් අයගේ අදහස් විමසන්න.
  ක්‍රියාකාරකමට අදාළ ප්‍රශ්න නගමින් සාකච්ඡාවක් කරන්න.
- හැකි අවස්ථාවකදී සිසුන් ලවා සරල ප්‍රස්තාර ( ස්වරස්ථාපන ගී වැනි ) බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමට මඟ පෙන්වන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • බටහිර ප්‍රස්තාර ක්‍රමයේ සංකේත රාශියක් භාවිත වන බව.<br>• ඒ එක් එක් සංකේතයෙන් විවිධ අදහස් මතුවන බව.<br>• ශුද්ධ, කෝමළ සහ තීව්‍ර වශයෙන් වෙන් වෙන්ව සංකේත යෙදෙන බව.<br>• ඒවා Sharp, Flat, Natural ආදී වශයෙන් නම් කෙරෙන බව.<br>• විවිධ මාත්‍රා සංඛ්‍යාවන් අනුව නිශ්ෂබ්ද මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට ද වෙනවෙනම සංකේත ඇති බව.<br>• ඒවා Minim Rest, Crotchet Rest ආදී වශයෙන් නම් කරන බව.<br>• එක් විභාගයකට හිමි ස්වරය ඊලඟ විභාගය දක්වාද ඇදෙන ස්වරයක් නම් නම් එම ස්ථානයේ Tie යනුවෙන් සංකේතයක් යෙදෙන බව.<br>• තවදුරටත් මේ සම්බන්ධව කරුණු රාශියක් ඉගෙනීමට ඇති බව සහ එම කරුණු 10, 11 ශ්‍රේණිවලදී ඉගෙනීමට අවස්ථාව සැලසෙන බව. |

(මිනිත්තු 80 යි)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- බටහිර ප්‍රස්තාර ක්‍රමයේ ඇති විවිධ සංකල්ප පැහැදිලි කරයි.
- බටහිර ප්‍රස්තාර ක්‍රමයේ ඇති වාසිදායක තත්වයන් පිළිගනියි
- ශුද්ධ, කෝමළ ස්වර ඇතුළත් ස්වර ප්‍රස්තාර බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරයි
- එදිනෙදා ජීවිතයේ දී හමුවන බටහිර ප්‍රස්තාර කොටස් පෙරදිග ක්‍රමයට පෙරලමින් භාවිත කරයි
- බටහිර ප්‍රස්තාර ක්‍රමය විස්තරාත්මකව අධ්‍යයනයට පෙළඹෙයි.

**ඇමුණුම 01**


- කිරි සුදු හාවා ගීතයේ බටහිර ප්‍රස්තාරය



**ඇමුණුම 02**


**කාර්ය පත්‍රිකාව**

01. බටහිර ක්‍රමයට අනුව කිසියම් ස්වරයක් කෝමළ බවට පත්වන්නේ නම් එම ස්වරය ඉදිරියෙන් හෝ එම ස්වරය පිහිටන රේඛාව හෝ අතරත Flat mark යන්න යෙදේ. කිසියම් ස්වරයක් තීව්‍ර බවට පත්වන්නේ නම් එම ස්වරය ඉදිරියෙන් හෝ එම ස්වරය පිහිටන රේඛාව හෝ අතරත Sharp mark යන්න යෙදේ කෝමළ හෝ තීව්‍ර ස්වර යෙදෙන ප්‍රස්තාරයක ඉඳහිට එම ස්වරයක් ශුද්ධව වන්නේ නම් Natural Mark යන්න භාවිත වේ. පහත රූප සටහනේ එම ලකුණු දැක්වේ.




Flat Mark **කෝමළ ලකුණ** | Sharp Mark **තීව්‍ර ලකුණ** | Natural Mark **ශුද්ධ ලකුණ**

02. කාෆි රාගයේ කෝමළ ග සහ කෝමළ නි යෙදේ එම රාගයට අයත් ආරෝහණ ස්වර බටහිර ක්‍රමයට ලියා බලමු. '' ස රි ග ම ප ධ නි සං '' යන ආරෝහණයේ කෝමළ ග සහ කෝමළ නි යන ස්වර වලට ඉදිරියෙන් කෝමළ ලකුණ නැතහොත් Flat mark එක යෙදී ඇති අයුරු බලන්න.




03. පහත බටහිර ස්වර ප්‍රස්තාරයේ ඇත්තේ කාෆි රාගයට අයත් ස්වර ප්‍රස්තාර කොටසක් වුවත් එහි කෝමළ ලකුණු යොදා නැත. එම ප්‍රස්තාරය ඔබේ සටහන් පොතේ පිටපත් කර Flat Mark යොදමින් කෝමළ ග සහ කෝමළ නි ලකුණු කරන්න.



05. තීව්‍ර මධ්‍යමය යෙදෙන ස්වර ස්ථාපන ගීතයක පළමු පාදය බටහිර ක්‍රමයට ඔබේ සටහන් පොතේ ප්‍රස්තාර කරන්න.

07. කිසියම් ස්වර ප්‍රස්තාරයක කෝමළ ග, ධ, නි යන ස්වර තුනම යෙදේ යැයි සිතමු. එවිට මුලින් සඳහන් කළ ආකාරයට කෝමළ ස්වරයක් පාසා කෝමළ ලකුණු යෙදීමට සිදුවේ. එසේ නොකොට කෝමළ ග,ධ,නි, යන ස්වර වලට හිමි ස්ථානයේ රේඛා මණ්ඩලයේ මුලින්ම Flat Mark යොදා ස්වර ප්‍රස්තාර කරනු ලබන ක්‍රමයක් ද ඇත. එවන් ස්වර ප්‍රස්තාරයක දිගින් දිගටම Flat Mark යෙදූ ස්ථානවලට අයත් ස්වර කෝමළ වේ. අතරින් පතර එක් ස්වරයක් ශුද්ධ භාවයට පත්වන්නේ නම් එම ස්වරය ඇති තැන පමණක් ශුද්ධ ලකුණක් Natural Mark යොදනු ඇත. පහත ස්වර ප්‍රස්තාර කොටස නිරීක්ෂණය කරන්න. ක්ලේෆ් සංකේතයට පසුව කෝමළ ලකුණු යොදා ඇති අයුරුත් මන්ද්‍ර '' නි '' ස්වරය කෝමළ බවින් ඉවත්ව ශුද්ධ '' නි '' වශයෙන් යෙදෙනවිට ඒ සඳහා යොදන සංකේතය ත් වටහා ගන්න.





මෙසේ ස්වර ප්‍රස්තාරය තුළ දිගින් දිගටම නොයෙදෙන එහෙත් ඉඳහිට යෙදෙන ස්වරය Accidental Note යනුවෙන් හඳුන්වයි.ඉහත ප්‍රස්තාරයේ ශුද්ධ මන්ද්‍ර නි Accidental Note එකකි. ( කාෆි රාගයට කෝමළ ග සහ නි යන ස්වර අයත් වේ. එහෙත් ඉඳහිට ශුද්ධ නි සහ ශුද්ධ ග ස්වර යෙදෙන අවස්ථා ඇත. එවන් අවස්ථාවක ශුද්ධ නි හෝ ශුද්ධ ග Accidental Note නම් වේ.)


08. පහත දැක්වෙන ප්‍රස්තාරය ගුරුවරයා සමග ගයන්න. එහි ඇඳෙන තැන් විමසා බලන්න

ග ම ප / ග ම රි / ස - -/- - -/

මෙවැනි කොටසක් බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ දී "ස" ස්වරයට හිමි මාත්‍රා 6 ම දැක්වීමට එක සංකේතයක් යොදනු නොලැබේ. "ස" ස්වරයට මාත්‍රා 3 බැගින් වූ විභාග දෙකක් හිමිවන බව අමතක කළ යුතු නැත. "ස" ස්වරයට හිමි මුල් මාත්‍රා 3 ට අවසාන විභාගයේ මාත්‍රා 3 ද එකට ඈඳෙමින් මාත්‍රා 6 ක් දක්වා ඇදේ. එය ප්‍රස්තාරය තුළින් ද පෙනිය යුතුය. මෙවන් අවස්ථාවල දී " Tie " සංකේතය යොදා විභාග දෙකක් එකට ඈඳෙනු ඇත. පහත ප්‍රස්තාර කොටස බලන්න.



ග - ම ප / - ග ම රි / ස රි ස - / - - - - /




09. ප්‍රස්තාරයක යම් මාත්‍රා සංඛ්‍යාවක් කිසිම ස්වරයක් නොයෙ දී නිහඬව පවතින අවස්ථා ද ඇත. එවන් අවස්ථාවල දී එම එක් එක් නිහඬ මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට ද විවිධ සංකේත යොදනු ලැබේ. එම සංකේත Rest Mark නමින් හැඳින් වේ. පහත දැක්වෙන ප්‍රස්තාර කොටස ගයා/වයා බලන්න.

+ නිස රි රි / රි - ග රි / ස + රි+ ස - / + + + + /

මෙම ප්‍රස්තාර කොටසේ මාත්‍රා 1 ක්, මාත්‍රා ක් " සහ මාත්‍රා 4 ක් වශයෙන් නිශ්ශබ්ද

ස්ථාන ඇත. බටහිර සංගීතයේදී මෙවැනි එක් එක් මාත්‍රා සංඛ්‍යාවන්ට වෙන් වෙන් වශයෙන් Rest Mark ඇත.







$\frac{1}{2}$

පහත දැක්වෙන ප්‍රස්තාර කොටස බලන්න.








ඉහත දැක්වෙන වගුවේ නිශ්ශබ්ද මාත්‍රා සංඛ්‍යාවන් සඳහා යොදන සංකේත දැක්වේ.

06. ඉහත ප්‍රස්තාර කොටසේ මුලින්ම දක්වා ඇත්තේ Treble Clef සංකේතයයි. මෙම සංකේතය හා සම්බන්ධවත් Bass Clef සංකේතය හා සම්බන්ධවත් 8 ශ්‍රේණියේ දී ඔබ අධ්‍යයනය කර ඇත. ( 8 ශ්‍රේණියේ ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 161 සිය 164 දක්වා බලන්න ) එම Clef සංකේතයට පසුව යෙදී ඇති කුඩා බෝපත් තුනක් ලෙස යෙදී ඇති සංකේතය බලන්න.එය මෙම ස්වර ප්‍රස්තාරයේ කී සිග්නේචරය Key Signature නම් වේ. ඒමගින් මෙම ප්‍රස්තාරයේ කුමන ස්වර කෝමළ හෝ තීව්‍ර වේ ද යන්නත් , කුමන ස්වරයක් ශ්‍රැති කර ගෙන ඇත් ද, යන්නත් අපට පැහැදිලි වේ. ඒ අනුව සම්ප්‍රදායිකව යෙදෙන Key Signature අතරින් කිහිපයක් පමණක් ඉගෙන ගනිමු.

| ස්කේලය | ශ්‍රැතිය කරගත් ස්වරය | ආරෝහණ-අවරෝහණ | යෙදෙන කෝමළ හෝ තීව්‍ර ස්වර | |
|---|---|---|---|---|
| C. major | " ස"<br>" C " | ස,රි,ග,ම,ප,ධ,නි,ස̇,<br>ස̇,නි,ධ,ප,ම,ග,රි,ස, | කිසිවක් නැත. |  |
| F- major | " ම "<br>" F " | ම̣,ප̣,ධ̣,නි̣,ස,රි,ග,ම,<br>ම,ග,රි,ස,නි̣,ධ̣,ප̣,ම̣ | කෝමළ නි. |  |
| B-Flat Major | " නි "<br>" B-Flat" | නි,ස,රි,ග,ම,ප,ධ,නි<br>නි̇,ධ,ප,ම,ග,රි,ස,නි̣, | කෝමළ නි සහ කෝමළ ග |  |
| C- Minor නැතහොත්<br><br>E-Flat Major | "ස "<br>" C "<br><br>නැතහොත්<br>"ග "<br>" E-Flat " | ස,රි,ග,ම,ප,ධ,නි,ස̇,<br>ස̇,නි,ධ,ප,ම,ග,රි,ස,<br><br>ග,ම,ප,ධ,නි,ස̇,රි̇,ග̇<br>ග̇,රි̇,ස̇,නි,ධ,ප,ම,ග. | කෝමළ ග,ධ,නි<br><br>කෝමළ ග,ධ,නි |  |
| G- Major | "ප"<br>"G" | ප̣,ධ̣,නි̣,ස,රි,ග,ම/,ප<br>ප,ම/,ග,රි,ස,නි̣,ධ̣,ප | තීව්‍ර " ම " |  |
| D- Major | "රි "<br>"D" | රි,ග,ම/,ප,ධ,නි,ස̇,රි̇<br>රි̇,ස̇,නි,ධ,ප,ම/,ග,රි<br>(මෙසේ පෙරදිග සංගීතයේ දී තීව්‍ර ස වශයෙන් භාවිත වන්නේ නැත. එය කෝමළ රි වේ.)<br>රි,ග,ම/,ප,ධ,නි,රි̇,රි̇,<br>රි̇,රි̇,නි,ධ,ප,ම/,ග,රි | තීව්‍ර " ම" සහ තීව්‍ර " ස "<br>(මෙසේ පෙරදිග සංගීතයේ දී තීව්‍ර ස වශයෙන් භාවිත වන්නේ නැත. එය කෝමළ රි වේ) |  |

07. ඉහතින් ඇති බටහිර ස්වර ප්‍රස්තාරය නැවත බලන්න. එහි ‿ කී සිග්නේචරය ‿ ට පසුව ඉහළින් සහ පහළින් වශයෙන් අංක දෙකක් යෙදී ඇති අයුරු බලන්න. එය එම ප්‍රස්තාරයේ තාලය හඟවන සංකේතයයි. එය නම් කරනුයේ Time Signature යනුවෙනි. පහත දැක්වෙන වගුව තුළින් සරල තාල කිහිපයක Time Signature හඳුනාගත හැකිවේ.

| Time Signature නම | සරල ප්‍රස්තාර කොටසක් | Time Signature සහිත බටහිර ප්‍රස්තාර ක්‍රමය |
|---|---|---|
| Four , Four Time | ස-ස-/ග-සග/ප-ගප/ස-ස-/ |  |
| Three , Four Time | පපග/මමරි/ගගස/රි--/ |  |
| Two , Four Time | සරි/සරි/ප-/ප-/ |  |
| Six Eight Time | ගමප පප- / ගමප පප- / |  |

නිපුණතාව 8.0 : සංගීතයේ තාක්‍ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 8.1 : **සංගීත ප්‍රසංගයක අත්‍යවශ්‍ය තාක්ෂණික මෙවලම් හසුරුවන ආකාරය පිළිබඳ සොයා බලයි.**

**ක්‍රියාකාරකම 8.1.1.** : **' සංගීතයේ තාක්ෂණික භාවිතය විමසමු '**

**කාලය** : කාලච්ඡේද 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඕනෑම ප්‍රමාණයක ස්පීකරයක් හෝ කිහිපයයක්
- මයික්‍රෆෝනයක්
- සපයා ගත හැකි නම් පාසලේ ශබ්ද විකාශන කට්ටලය
- ඇමුණුම 8.1.1.1 අංක 01 ට අයත් රූප සටහන
- ඇමුණුම 8.1.1.2 ට අයත් පත්‍රිකාව
- ඇමුණුම 8.1.1.3 ට අයත් රූප සටහන් පත්‍රිකාව

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය -**

**පියවර 8.1.1.1**
- සපයාගත් තාක්ෂණික මෙවලමක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳව සිසුන් විමසන්න.
- පහත කරුණු මතුවනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - සංගීතයේ දී විවිධ තාක්ෂණික මෙවලම් භාවිත කරන බව.
  - සංගීත ප්‍රසංගයකදී සුවිශේෂ වූ තාක්ෂණික මෙවලම් භාවිත කරන බව.
  - සංගීත පටිගත කිරීමක දී ද එවැනි මෙවලම් භාවිත වන බව.

(මිනිත්තු 20 යි)

**පියවර 8.1.1.2**
- ඇමුණුම අංක 01 ට අයත් රූප සටහන් ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳව සිසුන් විමසන්න.
- ඇමුණුම 02 ට අයත් කියවීමේ පත්‍රිකාව සිසුන් අතර බෙදා දී කියවීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 8.1.1.3**
- ඇමුණුම අංක 03 ට අයත් පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳ සිසුන් විමසන්න.
- පත්‍රිකාවේ සඳහන් රූප සටහන් දෙකේ පරිමාණය කුඩා කර ආදේශ භාණ්ඩවලින් මෙම උපකරණ නිර්මාණය කරන්න.

- ඒ ඒ අංකවලට අයත් තාක්ෂණික මෙවලම්වල ක්‍රියාකාරීත්වය සිදුවන ආකාරය අනුව සකසා ගත් උපකරණ ස්ථාන ගත කරන්න.
- එම ක්‍රියාවලිය විස්තර කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මේ පිළිබඳව සුදුසු ප්‍රශ්නාවලියක් සකසා ගන්න. නැතහොත් නාට්‍යානුසාරයෙන් මේ ක්‍රියාවලිය නිරූපණය කිරීමට සිසුන්ට සහායවන්න.

| |
|---|
| • තාක්ෂණික මෙවලම් විවිධ නම් වලින් හඳුන්වන බව.<br>• ඒ ඒ මෙවලම්වල නිශ්චිත වූ කාර්යයක් ඇති බව<br>• ඒ ඒ මෙවලම් අතර සහ සම්බන්ධතාවය ඉතා වැදගත් බව<br>• මෙවලම්වල ගුණාත්මක භාවය ප්‍රසංගකයක සාර්ථකත්වයට බලපාන බව<br>• තාක්ෂණික මෙවලම් හැසිරවීමේ ශිල්පියාගේ දක්ෂතාවය මත ප්‍රසංගයේ ගුණාත්මක භාවය රඳා පවතින බව. |

(මිනිත්තු 40 යි)

**තක්සේරුකරණය සහ ඇගයීම් නිර්ණායක**

- සංගීත ප්‍රසංගයකදී භාවිත කරන තාක්ෂණික මෙවලම් නම් කරයි.
- සංගීත ප්‍රසංගකක දී තාක්ෂණික මෙවලම් භාවිත කරන අන්දම නිරීක්ෂණය කරයි.
- විවිධ තාක්ෂණික මෙවලම්වල ආවේනික ලක්ෂණ දක්වයි.
- ප්‍රසංගකයකදී භාවිත කරන තාක්ෂණික මෙවලම්වල ක්‍රියාකාරීත්වය සරලව පැහැදිලි කරයි.
- විවිධ තාක්ෂණික මෙවලම් භාවිත කිරීමට කැමැත්තක් දක්වයි.

**ඇමුණුම 01**

Speker ස්පීකර්

ස්පීකර් විවිධ ප්‍රමාණයෙන් හා හැඩයන්ගෙන් යුක්තය. කුඩා රේඩියෝවේ නැතහොත් ජංගම දුරකථනයෙන් සිට ප්‍රසංග වේදිකාවක දැවැන්ත ස්පීකර් දක්වා විවිධ ප්‍රමාණයන්ගෙන් හා හැඩයන්ගෙන් යුත් ස්පීකර් ඇත. ඇම්ප් එක මගින් තමා වෙත නිකුත් කරන ශබ්ද තරංග බාහිර පරිසරයට මුදා හැරීමේ කාර්යය ස්පීකර් සතුය. එක් බෆල් එකක් තුළ Bass Mid හා Tweeter යනුවෙන් (Range) පරාසයන් 3 කට අයත් ස්පීකර් ඇත. නාදයක් තුළ පහළ මැද හා ඉහළ යන තත්වයන් තුනම හොඳ ස්පීකරයක් මගින් ශ්‍රවණය කළ හැකි ය. ස්පීකරයේ ගුණාත්මක භාවය සංගීත රසයට තදින්ම බලපාන කරුණකි. සමහර බෆල් Bass, Mid ආදී වශයෙන් වෙන් කර ඇත. Amp එකෙහි වෙට් ගණන සහ ස්පීකරයෙහි වොට් ගණන අතර ගැලපීමක් තිබිය යුතු ය. Amp එකෙන් අඩු වොට් ගණනක් නිකුත් කර වැඩි වොට් ගණනක ස්පීකර් යොදුවහොත් හඬ නිකුත් වීම දුර්වලය. Amp එකකින් වැඩිකර ස්පීකර් යෙන් අඩු වොඩ් ගණනක් වුවහොත් ස්පීකරය පිච්චී විනාශ වී යා හැකි ය. එම නිසා මෙම උපකරණ දෙකෙහි අන්‍යෝන්‍ය සබැඳියාව (වොට් ගණනේ) ගැලපීම ඉතා වැදගත් ය. එමෙන් ම ශාලාවක් ඇතුළත හා එළමහනේ දී යෙදිය යුතු ස්පීකර් ප්‍රමාණය පිළිබඳ අවබෝධයක් ශබ්ද පරිපාලකයා සතුව මෙන්ම ප්‍රසංගය මෙහෙයවන්නා තුළ ද තිබිය යුතු ය.

Amplifire ඇම්ප්ලිෆයර්

මෙම උපකරණය වර්ධක යනුවෙන් ද හැඳින්විය හැක. ශබ්දය වැඩි කිරීමේ කාර්යය කෙරෙන්නේ ඇම්ප්ලිෆයර් මගිනි. කෙටියෙන් හැඳින්වෙන්නේ Amp යන නමිනි. තමා වෙත ලැබෙන ශබ්දය ප්‍රමාණයෙන් වැඩි කිරීමේ කාර්යය මෙම උපකරණය සතු ය. මෙහි ධාරිතාවය හැඳින්වෙන්නේ වොට්වලිනි. (100W, 400W, 1000W) ආදී වශයෙනි. මික්සරය මගින් පෙරා පිරිසිදු කරන ලද සංගීතමය නාදයන් එක් චැනලයක් මගින් ඇම්ප් Amp එක වෙත යොමු කෙරෙන අතර එය ශ්‍රාවකයා වෙත ශ්‍රවණයට සැලැස්වීම සඳහා ස්පීකර් වෙත නිකුත් කිරීමට පෙර ශබ්දය වැඩි කිරීමේ කාර්යය Amp එක විසින් කරනු ලැබේ.

Mixer මික්සර්

මෙම උපකරණයේ කාර්යය ඉතා විශිෂ්ටය. තමා වෙත ලැබෙන සංගීත නාදය හෝ කටහඬ විවිධ ආකාරයෙන් වෙනස් කිරීමේ හැකියාව මික්සරය සතු ය. (Sound Balance) කිරීම යනුවෙන් මෙම කාර්යය ව්‍යවහාරයේ පවතී. එක් එක් චැනලයන් වෙන් වශයෙන් ඇත. චැනල් , 8, 10,12, 16, 32 ආදී වශයෙන් මික්සරයේ ප්‍රමාණ විවිධය. හඬෙහි බේස් ප්‍රමාණය ට්‍රෙබල් ප්‍රමාණය එකෝ (Echo) High, Mid, Low ආදී වශයෙන් විවිධ තත්ත්වයනට වෙනස් කළ හැක. Effect ඉෆෙක්ට් යෙදීමෙන් එම හඬෙහි විවිධ ආටෝපයන් තව දුරටත් වෙනස් කල හැක. සංගීතමය කටයුත්තක දී භාණ්ඩ කිහිපයක් වාදනය කිරීමේ දී එක් එක් කාණ්ඩයට හිමි ශබ්දය Volume එක පාලනය කරන්නේ මෙම උපකරණයෙනි. එක් එක් හඬ තත්ත්වයන් සඳහා වෙන වෙනම ස්විච් පිහිටා ඇත.


ප්‍රසංගයක් අතරතුරේ දී වුවත් උදාහරණයක් ලෙස තබ්ලාවේ හඬ පමණක් මෙමගින් වැඩිකර ගත හැක. මික්සරය පරිහරණය කරන ශබ්ද පරිපාලකයාට උසස් සංගීතමය ඥානයක් තිබීම ද ගුණාත්මක භාවයෙන් යුත් සංගීත ප්‍රසංගයක අවශ්‍යතාවයකි.

ඇමුණුම අංක 02 -


**කියැවීම් පත්‍රිකාව**

මයික්‍රොෆෝනය - ශබ්දය ග්‍රහණය කරගන්නා උපකරණයකි. විවිධ ප්‍රමාණයන්ගෙන් සහ හැඩයන්ගෙන් යුක්තය. මයික්‍රොෆෝනය ආසන්යේ ඇති හඬක් සියුම්ව ග්‍රහණය කර ගැනීමට සමත්වන ආකාරයෙන් නිම වී ඇත.

මයික්‍රෆෝන් වර්ග - ඩයිනමික්, කන්ඩෙන්සර්,
වීඩියෝ මයික් ( ක්ලිෆෝන්මයික්), Fm මයික් ඩයනමික් මයික්, කන්ටැක් මයික්.











1
2
1
3
4
5
5
5
5

# තක්සේරුව හා ඇගයීම

## හැඳින්වීම

එළඹෙන අනාගත අභියෝගවලට සාර්ථකව මුහුණදිය හැකි පුරවැසි පිරිසක් රටට දායාද කර දීම නව සහශ්‍රකයේ දොරට වඩින පරිණාමන ගුරු භූමිකාවේ (TRANSFORMATION ROLE) හරය වේ. මේ ගුරු භූමිකාව මැනවින් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ වෙත ඉදිරිපත් කර ඇත්තේ ශිෂ්‍ය කේන්ද්‍රීය (STUDENT - CENTRED), නිපුණතා පාදක (COMPETENCY - BASED), ක්‍රියාකාරකම් දිශාභිමුඛ (ACTIVITY - ORIENTED), ප්‍රවේශයක් ගන්නා විෂයමාලාවකි.

පූර්වයෙන් සංවර්ධනය කළ ආදර්ශ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාව ඉගෙනුම් හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දී සිසු කණ්ඩායම් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත්, ක්‍රියාකාරකම්වල තුන්වැනි පියවරේ දී සිසුන් විවරණයට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත්, ගුරුවරයාට අවස්ථාව තිබේ. ගවේෂණයේ යෙදෙන සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්ය සමීපව නිරීක්ෂණය කරමින්, ඔවුන් මුහුණ පා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සැපයීමත් පන්තියේ සෑම ළමයකු ම ආසන්න ප්‍රවීණතා මට්ටම වෙත හෝ ළඟාකර වීමත් තක්සේරුව යටතේ ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එසේ ම ගවේෂණය හරහා සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම විනිශ්චය කර ප්‍රකාශයට පත් කිරීම ඇගයීම යටතේ සිදුවිය යුතු වේ.

තක්සේරුවේ යෙදී සිටින ගුරුවරුන්ට ස්වකීය සිසුන් වෙනුවෙන් ලබා දිය හැකි දෙයාකාර වූ මාර්ගෝපදේශ, ප්‍රතිපෝෂණය (FEED BACK), හා ඉදිරි පෝෂණය (FEED FORWARD), ලෙස හැඳින්වේ. සිසුන්ගේ දුබලතා හා නො හැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟ හරවා ගැනීමට ප්‍රතිපෝෂණයත්, සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනාගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත්, ලබා දීම ගුරු කාර්ය වේ. සිසු ඉගෙනුම අඛණ්ඩව ඉදිරියට ගෙන යාම සඳහා විෂය නිර්දේශයට ඇතුළත් නිපුණතා මට්ටම් කිනම් ප්‍රමාණයකින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනාගෙන සිසුන්ට දැනුම් දීම ද මේ තරමට ම වැදගත් ය. ඇගයීම් වැඩපිළිවෙළ ඔස්සේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශ්වවලට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ද ගුරුවරුන් යොමු විය යුතු වේ.

තක්සේරුව හා ඇගයීම පහසුකර ගැනීම සඳහා පොදු නිර්ණායක පහක් යෝජනා කර තිබේ. මෙම නිර්ණායක අතුරින් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතා මට්ටමට අදාළ විෂය අන්තර්ගතය හා බැඳී ඇති අතර, දුෂ්කරතා අනුපිළිවෙලින් සකස් කරනු ලබන විෂය හැකියා තුනක් ලෙස පෙළගස්වා තිබේ. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඇසුරෙන් සංවර්ධනය කර ගත යුතු අවසාන නිර්ණායක දෙක ඕනෑම විෂයයක් ඉගෙනීමේ දී වැදගත් වන පොදු හැකියා දෙකකි. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්තිකාමරය තුළ සිසුන් ක්‍රියාත්මක විමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ගොඩනැගීම තහවුරු කිරීමටත්, ඇගයීම යටතේ එම චර්යා ගොඩනගා ගත් මට්ටම විනිශ්චය කර ඒ පිළිබඳ සිසුන් දැනුවත් කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු වේ.

පාසල් මට්ටමේ තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙල තවත් ඉදිරියට ගෙනයාම සඳහා ඉගෙනුම්-ඉගැන්වීම්-ඇගයීම් උපකරණ සකස්කර මේ කොටසට ඇතුළත් කර තිබේ. ක්‍රියාකාරකම් සන්තතියට ඇතුළත් ක්‍රියාකාරකම් අර්ථවත්ව කාණ්ඩකර ගැනීම මේ යටතේ මුලින් ම සිදුවිය යුතු කාර්යයයි. සිසු ඉගෙනුම විකසිත කළ හැකි ඉගෙනුම්-ඉගැන්වීම් ඇගයීම් ප්‍රභේද කීපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කරගෙන තෝරාගෙන ඇති අතර එම ප්‍රභේද ඔස්සේ ගුරුවරයාගේ ඉගැන්වීමත්, ශිෂ්‍යයන්ගේ ඉගෙනුමත් කාලසටහනෙන් බැහැරට ගෙන යාමට හා වාරික සොයා බැලීම් හරහා සිසු ඉගෙනුම තහවුරු කිරීමට ගුරුවරයා ඉදිරිපත් විය යුතුවේ. ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩයේ පළමු ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පෙර මෙම උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරෙන අතර ක්‍රියාකාරකම් කාණ්ඩයේ සියලු ම ක්‍රියාකාරකම් කාල සටහන තුළ ක්‍රියාත්මක වන මුළු කාලය පුරා වාරිකව තක්සේරුවේ යෙදීම ද ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් කාණ්ඩයට අයත් සියලුම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වී අවසාන වූ කල පූර්වයෙන් තීරණය කර ගත් දිනක ගවේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමටත්, ඒවා විස්තාරණය කිරීමටත් සිසුන්ට ඉඩ සලසා දිය යුතු වේ. ඒ ඒ ක්‍රියාකාරකම තුළ සිදු කළ ආකාරයට ම මේ විස්තාරණය ද අවස්ථා කිහිපයක් ඔස්සේ සිදු කළ යුතු අතර පළමු විස්තාරණ අවස්ථාව ඉදිරිපත් කළ සිසු කණ්ඩායමටත් දෙවන අවස්ථාව අසා සිටි කණ්ඩායම්වලටත් අවසාන අවස්ථාව ගුරුවරයාටත් ලැබිය යුතු වේ. විවරණ හා විස්තාරණ අවස්ථාවල දී තමා අත්දුටු සියලු අපැහැදිලි තැන් පැහැදිලි කරමින් ද, සාවද්‍ය දේ නිවැරදි කරමින් ද, අඩු පාඩු සහිතව ඉදිරිපත් කරන ලද කරුණු සම්පූර්ණ කරමින් ද ඉගෙනුම් ඵල සඳහා පදනම සකසන විෂය කරුණු මතු කරමින් ද ඇගයීම් ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරමින් ද ගුරුවරයා අවසාන සමාලෝචනය ඉදිරිපත් කළ යුතුයි. මේ අනුව ගුරුවරයා විසින් සිදු කළ යුතු සිසු ඇගයීම කිසි විටකත් අවසානයට කල් දමා නොමැති බව ඔබ තේරුම් ගත යුතු අතර සිසුන් විවරණයේ හා විස්තාරණයේ යෙදෙන අවස්ථා මේ සඳහා තෝරා ගත යුතු බව ද අමතක නොකළ යුතුයි. ඉගෙනුම්-ඉගැන්වීම්-ඇගයීම් උපකරණ හඳුන්වා දෙන ආරම්භක අවස්ථාවේ දී ගනුදෙනු ගුරු භූමිකාව ප්‍රමුඛ වන අතර ඉගෙනුම්-ඉගැන්වීම්-තක්සේරු- ඇගයීම් ක්‍රියාවලිය අවසානයේ දී සම්ප්‍රේෂණ ගුරු භූමිකාව යටතේ අවසාන විස්තාරණය කිරීමට ගුරුවරයාට සිදු වේ.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ තුන්වන කොටස ක්‍රියාකාරකම් සන්තතිය තුළ නිම කළ යුතු ඇගයීම් අවස්ථා ගණනත්, ඒ එක් එක් ඇගයීම් අවස්ථාව සාර්ථක කර ගැනීම සඳහා තෝරාගෙන තිබෙන ඉගෙනුම්-ඉගැන්වීම්- ඇගයීම් උපකරණත්, සුපතත්‍ය ඇගයීම් ක්‍රමයක් යටතේ වාර විභාගවලට හා අවසාන විභාගයට ඉදිරිපත් විය හැකි ප්‍රශ්නවල ස්වභාවයත් හඳුන්වා දීමට සැලසුම් කර තිබේ. ජීවිතයේ සැබෑ අවස්ථා පදනම් කර ගත් විභාග ප්‍රශ්න ඔස්සේ යෝජිත ඉගෙනුම් -ඉගැන්වීම්-තක්සේරු-ඇගයීම් ක්‍රියාවලියට පණ පොවමින් ද ඒ ඒ ක්‍රියාකාරකම්වල හා ක්‍රියාකාරකම් කාණ්ඩවල නිශ්චිත ස්ථානවල තක්සේරුව හා ඇගයීම සිදු කරමින් ද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පෝෂණය කිරීමට ගුරුවරුන්ටත් ප්‍රබෝධයෙන් යුතු ව ඉගෙනුමේ නියැළීමට සිසුන්ටද මේ සියලු නවීකරණ මඟපාදා දෙයි.

# 9 ශ්‍රේණිය

1. **ඇගයීම් අවස්ථාව :-** 1 වාරය උපකරණ අංක - 01

2. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:-** 1.1, 1.3

3. **ආවරණය කෙරෙන විෂය සන්ධාරය-**
   - භීම්පලාසි සහ යමන් රාග දෙකෙහි රාග ස්වරූපය හඳුනාගනිමින් ස්වර අභ්‍යාස ගායනය වාදනය කරයි.
   - එම රාග දෙකෙහි කෙටි ස්වර ඛණ්ඩ, ස්ර්ගම්, ලක්ෂණ ගී, මධ්‍යලය ගී ගායනය වාදනය කරයි.
   - එම රාග දෙකෙහි රාග විස්තර හා සමවිෂමතා නම් කරයි.
   - පාරිභාෂික වචන පිළිබඳ අවබෝධය

4. **උපකරණයේ ස්වභාවය :-**
   - ප්‍රායෝගික ඇගයීම්
   - රාග ගීත ප්‍රායෝගිකව ගායනය/වාදනයේ යෙදවීම.
   - පාරිභාෂික වචන පැහැදිලි කිරීම.
   - රාග විස්තර වගු ගත කිරීම

5. **අරමුණු**
   - රාග ධාරී ගීත නිවැරදිව ගායනය/වාදනයේ කරයි.
   - රාග ස්වරූපය පැහැදිලි කරයි.
   - රාග සංකල්ප පැහැදිලි කරයි.
     රාගවල සමවිෂමතා පැහැදිලි කරයි.

6. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්.**

   **ගුරු උපදෙස්**

   1 **පියවර** -
   - හිම්පලාසි - යමන් රාග දෙකෙහි ආරෝහණ - අවරෝහණ ගායනයට යොමු කරන්න.

   II **පියවර** -
   - තෝරාගත් මධ්‍යලය ගීතයක් ගායනයට සලස්වන්න.

   III **පියවර** -
   - ඉදිරියේ ඇති ප්‍රශ්නවලට පිළිතුරු ගොනුකිරීමට සලස්වන්න.

   IV **පියවර** -
   - සපයා ඇති ස්වර ඛණ්ඩ රාග දෙකට වෙන් කිරීමට යොමු කරන්න.
   - ශ්‍රැතිය, ස්වර ස්ථාන රැක ගනිමින් රාගධාරී ගීත ගැයීමට වැයීමට සලස්වන්න.

- පහත දැක්වෙන කරුණුවලට අදාළ වන සේ රාගයේ නම ඉදිරියෙන් ලියන්න.

1 ඖඩව සම්පූර්ණ ජාති රාගයකි. ............................................
2 සම්පූර්ණ ජාති රාගයකි ............................................
3 ග නි වාදි සංවාදි වේ ............................................
4 ම ස වාදී සංවාදි වේ............................................
5 ග නි යෙදෙන රාගයකි ............................................
6 මධ්‍යමය තීව්‍රව යෙදේ ............................................
7 නි ස ග ම ප , ග ම ග රි ස, යෙදෙන රාගයකි ............................................
8 ස රි ම ප ධ යන ස්වර අනුවාදි වේ ............................................
9 රි ග ප ධ නි යන ස්වර අනුවාදි වේ ............................................
10 රාත්‍රි 1 ප්‍රහාරයේ දී ගායනයට සුදුසුවන රාගයකි.

- රාග දෙකෙහි ස්වර විදහා දැක්වෙන කෙටි ස්වර ඛණ්ඩ කිහිපයක් පහත දැක්වේ. ඔබ වගුවක් සකසා රාග දෙකකට අදාළව එම ස්වර ඛණ්ඩ වගුවේ ලියන්න.

නි ස ග ම ප, ම ග රි ස, ප නි සං, ප ධ නි සං, ප රි සං

ස නි ධ ප, ප නි ස , ග රි සං, නි ස ම, ග ම/ ප

පම/ ගරි ම/ ගම/ ගරි ස, ගග රිස නි රි ස, නි සං ගං රිං සං

නි ධ නි රි ස, ප නි ස ග රි ස , නි රි ග රි ස, ග ම ප නි සං

ම ධ නි ස සං නි ධ ප , ප රි නි රි ස

නි ස ග ම ප, නි රි ගම/ ප

07. **ශිෂ්‍යයාට උපදෙස් -:**
ගුරුවරයාගේ මග පෙන්වීම වගුවක් සකස්කර ඉහත ස්වර ඛණ්ඩ භීම්පලාසි සහ යමන් රාග දෙකට වෙන්කර ලියන්න.

08. **ඇගයීම් ක්‍රමය -:**
නිර්ණායක 5 ක් මත තක්සේරු කළ නිර්ණායක 5 ට මුළු ලකුණු 04 බැගින් නිර්ණායක 5 ට මුළු ලකුණු 20 ක් පිරිනැමේ.

- ඉතා හොඳයි - ලකුණු 04.
- හොඳයි. - ලකුණු 03.
- දුර්වලයි - ලකුණු 02.
- ඉතා දුර්වලයි - ලකුණු 01.

**නිර්ණායක-**

(01) ආරෝහණ , අවරෝහණ නිවැරදිව ගායනය /වාදනය කිරීම - ලකුණු 04.
(02) මධ්‍යලය ගීතය නිවැරදිව ගායනය වාදනය කිරීම - ලකුණු 04.
(03) විස්තරවලට අයත් රාග නම් කිරීම - ලකුණු 04.
(04) රාග සංගති වගු ගත කිරීම - ලකුණු 04.
(05) ගුරුවරයා අහඹු ලෙස ඉදිරිපත් කරන සර්ගම් පාද හා මධ්‍යලය ගී පාද නම් කිරීම - ලකුණු 04

----------

මුලු ලකුණු - ලකුණු 20

## 9 ශ්‍රේණිය

1. **ඇගයීම් අවස්ථාව :-** 2 වාරය උපකරණ අංක - 03

2. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:-** 4.1, 4.2

3. **ආවරණය කෙරෙන විෂය සන්ධාරය-**
   - ගොයම් ගී. නෙලුම් ගී, කමත් ගී
   - ගැමිගීයේ විශේෂ ලක්ෂණ
   - දවුල, ගැටබෙරය, තම්මැට්ටම, පහතරට බෙරය

4. **උපකරණයේ ස්වභාවය :-**
   - ක්‍ෂණික කතා 4.0 නිපුණතාවයට අදාළව මෙතෙක් අධ්‍යයනය කළ විෂයය කරුණු තව දුරටත් සංවර්ධනය කරමින් කේවල වශයෙන් ඉදිරිපත් කරන ක්‍ෂනික කථාවක් හා කණ්ඩායම් ප්‍රාසංගික හැකියා දැක්මක්.

5. **අරමුණු**
   - 4.0 නිපුණතාවය අදාළව මෙතෙක් අධ්‍යයනය කළ විෂයය කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කරයි.
   - ජන ගීත ප්‍රාසාංගිකව ගායනය කරයි.

6. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්.**
   **ගුරු උපදෙස්**
   - දෙවන වාරයට නියමිත 4.0 නිපුණතාවයට අදාළ මාතෘකා ඔස්සේ කථාවක් පැවැත්වීම මින් අපේක්ෂා කෙරේ.
     පහත සඳහන් කරුණු ඔස්සේ කථාව පැවැත්වීමට සිසුන් යොමුකරන්න.
   - ගොයම් ගී, නෙලුම් ගී, කමත් ගී
     - ගී වර්ග හැඳින්වීම.
     - ගීත ගැයූ අවස්ථා
     - නාදරටා, භාෂාව, තාල, රිද්මය,
     - විශේෂ ලක්ෂණ
   - ගැමි ගීයේ විශේෂ ලක්ෂණ -
     - ගැමි ගී යන්න විස්තර කිරීම
     - ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු සාධක අනුව වර්ගවීම
     - එහි විශේෂ ලක්ෂණ.
   - දේශීය අවනද්ධ භාණ්ඩ -
     (දවුල, තම්මැට්ටම, ගැටබෙරය, පහතරට බෙරය)
     - ගොයම් ගී, නෙලුම් ගී, කමත් ගී වර්ග 3 ද කණ්ඩායම් වශයෙන් කරවීමට ද අවස්ථාව ලබාදෙන්න.

- ♦ කුසපත් ඇදීමේ ක්‍රමයට කේවලව කථාව පැවැත්වීමට අවස්ථාව සලස්වන්න.
- ♦ ගී වර්ග 3 ද කුසපත් ඇදීමේ ක්‍රමයට කණ්ඩායම් වශයෙන් ගායනය කරමින් ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ♦ කණ්ඩායම් ක්‍රියාකාරකමේ දී ප්‍රසංගාත්මකව ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ දී ගායන හැකියා, රංගන හැකියා, මත එක් එක් ශිෂ්‍යයාගේ පෞද්ගලික දක්‍ෂතා ඇගයීමට ලක් කළ හැකි ය.

07. **ශිෂ්‍යයාට උපදෙස් -:**

ගුරුවරයාගේ මග පෙන්වීම මත ක්‍රියාකාරකමට අදාළව ඔබ මෙතෙක් අධ්‍යයනය කළ

- ගොයම් ගී, නෙලුම් ගී. කමත් ගී
- ගැමිගීයේ සුවිශේෂ ලක්ෂණ
- දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩ

(ගැටබෙරය, දවුල, තම්මැට්ටම, පහතරට බෙරය)

යන විෂයය කොටස්වලින් කුසපත් ඇදීමෙන් ඔබ තෝරා ගත් කොටසට අදාළව ක්ෂණිකව කථාවක් කිරීමට සුදානම් වන්න.

- නෙළුම් ගී, ගොයම් ගී, කමත් ගී අතරින් කුසපත් ඇදීමේ ක්‍රමයට කණ්ඩායම් එක්වී එම ජන ගී වලින් අදාළ ගීය ගායනය කරමින් ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමට සුදානම් වන්න.
- එම කොටසට උචිත තාලවාද්‍ය භාණ්ඩ, අංග චලන විශේෂයෙන් ගායනයට ඇතුළත්ව ඉදිරිපත් කිරීමට මුළු ලකුණු හිමිවේ.

08. **ඇගයීම් ක්‍රමය -:**

නිර්ණායක 5 ක් මත තක්සේරු කළ නිර්ණායක 5 ට මුළු ලකුණු 04 බැගින් නිර්ණායක 5 ට මුළු ලකුණු 20 ක් පිරිනැමේ.

- ඉතා හොඳයි - ලකුණු 04.
- හොඳයි. - ලකුණු 03.
- දුර්වලයි - ලකුණු 02.
- ඉතා දුර්වලයි - ලකුණු 01.

**නිර්ණායක-**

| | | | |
|---|---|---|---|
| (1) | මාතෘකාව පැහැදිලිව හැඳින්වීම හා එහි උචිත බව | - | ලකුණු 04. |
| (2) | සංවිධානාත්මකව, මාතෘකාවට අදාළ කරුණු ඉදිරිපත් කිරීමේ නිවැරදි බව | - | ලකුණු 04. |
| (03) | පැහැදිලි බව, නිවැරදි කටහඬ පාලනය, හා නිවැරදි උච්චාරණය | - | ලකුණු 04 |
| (04) | කණ්ඩායම් ගායනය හා ප්‍රාසාංගික බවට | - | ලකුණු 04 |
| (4) | නිවැරදි ශ්‍රැතියට ගැයීම, සහයෝගය, වගකීම, කාලය අනුව වැඩ අවසන් කිරීම | - | ලකුණු 04 |
| | | | ---------- |
| | මුලු ලකුණු | - | ලකුණු 20 |

## 9 ශ්‍රේණිය

1. **ඇගයීම් අවස්ථාව ෴-** 2 වාරය උපකරණ අංක - 03

2. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම෴-** 5.1,

3. **ආවරණය කෙරෙන විෂය සන්ධාරය-**
   - නව නාට්‍ය සම්ප්‍රදායේ නාට්‍ය වන හුණුවටය, කුවේණි, කරදිය, බෙරහඬ, රතුහැට්ටකාරී යන නාට්‍ය වල ගී
   - ගීත නාට්‍ය වන දෙපානෝ, පේමතෝ, කුණ්ඩලකේශී යන ගීත නාට්‍ය වල ගීත

4. **උපකරණයේ ස්වභාවය ෴-**
   - 5.0 නිපුණතාවයට අදාළව මෙතෙක් අධ්‍යයනය කළ විෂය කරුණු තව දුරටත් සංවර්ධනය කරමින් කේවළ වශයෙන් ඉදිරිපත් කරන නාට්‍ය ගීත ගායනය කිරීම.
   - අධ්‍යයනය කළ නාට්‍ය හෝ නාට්‍ය වර්ග පිළිබඳව වාචිකව අදහස් දැක්වීම.

5. **අරමුණු**
   - 5.0 නිපුණතාවයට අදාළව මෙතෙක් අධ්‍යයනය කළ විෂයය කරුණු ප්‍රායෝගිකව ඉදිරිපත් කරයි.

6. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්.**
   **ගුරු උපදෙස්**
   - දෙවන වාරයට නියමිත 5.0 නිපුණතාවයට අදාළ නාට්‍ය ගීත ගායනය කිරීම මින් අපේක්ෂා කෙරේ.
   - 5.1 නිපුණතා මට්ටමට අදාළ නියමිත ගීත අතරින් එක් කොටසකින් එක බැගින් ගීත දෙකක් ශ්‍රැතිය හා තබ්ලාවට අනුව ගායනය කිරීමට සළස්වන්න.

07. **ශිෂ්‍යයාට උපදෙස් -෴**
   - ගුරුවරයාගේ උපදෙස් පරිදි මග පෙන්වීම මත ඔබ කැමති ගීත දෙකක් ශ්‍රැතියට හා තබ්ලාවට අනුකූලව ගායනය වාදනය කිරීමට සූදානම් වන්න.

   - පහත දැක්වෙන මාතෘකා අතුරින් එකක් අහඹු ලෙස තෝරාගෙන සාරවත් ව කථාවක් ඉදිරිපත් කරන්න.
     - ලෝකධර්මී නාට්‍ය
     - නාට්‍යධර්මී නාට්‍ය
     - අර්ධ ශෛලිගත නාට්‍ය
     - මුද්‍රා නාට්‍ය
     - 1956 න් පසු ලංකාවේ නාට්‍ය කලාව
     - ශ්‍රී ලංකාවේ ඔපෙරෝ ශෛලීයේ නාට්‍ය හා ප්‍රේමසිරි කේමදාසයන්ගේ දායකත්වය
     - ඩබ්. බී. මකුලොළුව ශූරීන්ගේ ගීත නාට්‍ය නිර්මාණයේ දායකත්වය

08. **ඇගයීම් ක්‍රමය** -:

නිර්ණායක 5 ක් මත තක්සේරු කළ යුතුවේ. එක් නිර්ණායකයකට ලකුණු 04 බැගින් නිර්ණායක 05 ට ලකුණු 20 කි.

- ඉතා හොඳයි - ලකුණු 04.
- හොඳයි. - ලකුණු 03.
- දුර්වලයි - ලකුණු 02.
- ඉතා දුර්වලයි - ලකුණු 01.

**නිර්ණායක-**

(1) හුණුවටය/ කුවේණි / කරදිය/ බෙරහඬ/ රතු හැට්ටකාරී යන නාට්‍ය ගීත වලින් එක් ගීයක් ගායනය /වාදනය කිරීම - ලකුණු 04.

(2) දෙපානෝ /ජේමතෝ/ කුණ්ඩලකේශී යන නාට්‍ය අතරින් එක් ගීතයක් ගායනය /වාදනය කිරීම - ලකුණු 04.

(03) තෝරාගත් මාතෘකාවට අදාළ කරුණුවල නිරවද්‍යතාවය - ලකුණු 04.

(04) කරුණුවල සංවිධානය - ලකුණු 04.

(05) කථාව ඉදිරිපත් කිරීමට - ලකුණු 04.

----------

මුලු ලකුණු - ලකුණු 20

## 9 ශ්‍රේණිය

1. **ඇගයීම් අවස්ථාව :-** 3 වාරය - උපකරණ අංකය -

2. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:-** 8.1

3. **ආවරණය කෙරෙන විෂය සන්ධාරය-**
   - මයික්‍රොෆෝන්, බෆල්, මික්සර්, ඇම්ප්ලිෆයර් භාවිතය
   - සංගීත ප්‍රසංගකයකදී භාවිතා වන තාක්ෂණික මෙවලම්

4. **උපකරණයේ ස්වභාවය :-**
   - 8.0 නිපුණතාවටය අදාළව මෙතෙක් අධ්‍යයනය කළ විෂය කරුණු තව දුරටත් සංවර්ධනය කරමින් සංගීත ප්‍රසංග අවස්ථාවක් රූප සටහනක් ඔස්සේ ඉදිරිපත් කිරීම.

5. **අරමුණු**
   - 8.0 නිපුණතාවයට අදාළව මෙතෙක් අධ්‍යයනය කළ විෂයය කරුණු පිළිවෙලින් එක් රැස් කරයි.
   - තාක්ෂණික මෙවලම්වල කාර්ය භාරය නම් කරයි.

6. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්.**

   **ගුරු උපදෙස්**
   - තෙවන වාරයට නියමිත 8.0 නිපුණතාවයට අදාළ මාතෘකා පිළිබඳව රූප සටහන් නිර්මාණය කිරීම.
   - පහත සඳහන් කරුණු ඔස්සේ චිත්‍ර සටහන ගොඩනැගීමට සිසුන් යොමු කරන්න.
   - කඩහඬ හෝ තාක්ෂණික භාණ්ඩයක නාදය ආරම්භයේ සිට ස්පීකර් වලින් ශ්‍රාවකයාට ඇසීම දක්වා ක්‍රියාවලිය රූප සටහනක් මගින් දැක්වීම. එක් එක් උපකරණයේ පරිමාණය පිළිබඳ අවධානය යොමු කරන්න.

07. **ශිෂ්‍යයාට උපදෙස් -:**
   - ගුරුවරයාගේ උපදෙස් පරිදි මත අධ්‍යයනය කළ තාක්ෂණික මෙවලම් වල ක්‍රියාකාරිත්වය දැක්වීමට රූප සටහනක් ගොඩ නැගීමට සූදානම් වන්න.

08. **ඇගයීම් ක්‍රමය -:**

   නිර්ණායක 5 ක් මත තක්සේරු කළ යුතුවේ. එක් නිර්ණායකයකට ලකුණු 04 බැගින් නිර්ණායක 05 ට ලකුණු 20 කි.
   - ඉතා හොඳයි - ලකුණු 04.
   - හොඳයි. - ලකුණු 03.
   - දුර්වලයි - ලකුණු 02.
   - ඉතා දුර්වලයි - ලකුණු 01.

**නිර්ණායක-**

| | | | |
|---|---|---|---|
| (1) | ආරම්භයේ සිට අවසානය දක්වා පිළිවෙළින් ගොඩනඟා තිබීම. | - | ලකුණු 04. |
| (2) | රූප සටහන්වල හඳුනාගැනීමට ඇති හැකියා හා සමානත්වය | - | ලකුණු 04. |
| (03) | රූප සටහන්වල පරිමාණය පිළිබඳ සැලකිලිමත් වීම | - | ලකුණු 04. |
| (04) | රූප සටහන් නිවැරදිව නම් කිරීම | - | ලකුණු 04. |
| (05) | රූප සටහනේ පිරිසිදු බව හා පැහැදිලි බව | - | ලකුණු 04. |
| | | | ---------- |
| | මුළු ලකුණු | - | ලකුණු 20 |